# දෙසතිය

පුවත් සඟරාව

2024 නොවැම්බර්



## ජීවිතයට ආදරය කරන්න

CHOGM SAMOA2024

# අභියෝගාත්මක අනාගතයකට සූදානම්

27 වැනි පොදුරාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව 2024 ඔක්තෝබර් 25 සහ 26 යන දිනවල සැමෝවාහි අපියා අගනුවරදී පැවැත්වුණා. මෙවර එහි තේමාව වූයේ 'අභියෝගවලට මුහුණදිය හැකි අනාගතයක්: අර්ථකාරී පොදු රාජ්‍ය මණ්ඩලයක්' යන්න.

සාමය, ප්‍රජාතන්ත්‍රවාදය සහ සමෘද්ධිය යන අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා එක් ව ක්‍රියා කරන රාජ්‍යවල ලොව පැරණිතම දේශපාලන සංවිධානය වන්නේ ද ස්වාධීන රාජ්‍ය 56කින් සමන්විත ස්වේච්ඡා සංගමයක් වන පොදුරාජ්‍ය මණ්ඩලය. දියුණු ආර්ථිකයක් හිමි රටවල් මෙන් ම සංවර්ධනය වෙමින් පවතින රටවල් ද මේ සංගමයට ඇතුළත්.

2024 පොදුරාජ්‍ය මණ්ඩල රාජ්‍ය නායක සමුළුවේදී නායකයන්ගේ ප්‍රකාශය, සැමෝවා පොදුරාජ්‍ය මණ්ඩල රාජ්‍ය නායක සමුළුව-2024 ප්‍රකාශය සහ අපියා පොදුරාජ්‍ය මණ්ඩල සාගර ප්‍රකාශය සම්මත කර ගැනුණා. පොදුරාජ්‍ය මණ්ඩලයේ මීළඟ සභාපතිවරයා ලෙස තෝරා ගැනුණේ ඝානාවේ විදේශ කටයුතු සහ කලාපීය ඒකාබද්ධතා අමාත්‍ය ෂර්ලි අයර්කෝර් බොච්වේ. ලන්ඩනයේ ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් මනෝරි මල්ලිකාරච්චි මේ සමුළුවේදී ශ්‍රී ලංකාව නියෝජනය කළ දූත පිරිසේ නායකත්වය දැරුවා.

දෙවැනි එලිසබෙත් රැජිනගේ අභාවයෙන් පසු පවත්වන ලද පළමු පොදුරාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව මෙය වූ අතර පොදුරාජ්‍ය මණ්ඩලයේ ප්‍රධානියා ලෙස III වැනි චාල්ස් රජුගේ ප්‍රධානත්වයෙන් පළමු වරට පැවැත් වූ සමුළුව ලෙස මෙය ඉතිහාසගත වනවා.

**කාංචනා සිරිවර්ධන**



# දෙසතිය
පුවත් සඟරාව

**වෙළුම 46, කලාපය 11,**
**2024 නොවැම්බර්**

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

**සංස්කාරක මණ්ඩලය**
දු. අ. 011 - 2513757 / 0112 - 513153
Email - desathiya@gmail.com
බෙදාහැරීමේ අංශය
දු. අ. 011 - 2514150

උපදේශක සංස්කාරක
**එච්. එස්. කේ. ජේ. බණ්ඩාර**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අංශ ප්‍රධානී - දෙසතිය
**ඩබ්. එම්. ශාන්තප්‍රිය**

සංස්කාරක
**මාලා මල්කාන්ති පරණගමගේ**

රූ රටා සංස්කාරක
**සංජීව පෙත්තාවඩු**

විශේෂාංග ලේඛක
**රංගිකා අබේසේකර**

ඡායාරූප
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය**

බෙදාහැරීම් සම්බන්ධීකරණය
**ඉරේෂා අබේනායක**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය හා බෙදාහැරීම
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

**හිතවත් පාඨකයිනි,**

46 වසරක් ඔබ වෙත දැනුම ලබාදුන් 'දෙසතිය' පුවත් සඟරාව වෙත පාඨක ඔබගේ අදහස් කෙටියෙන් ලියා තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ යොමු කරන්න

**සංස්කාරක**

මෙහි පළ වන ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වන අතර ඒවායේ අයිතිය මුල් හිමිකරු සතු යි.

## කවරයේ කතාව



17 ජීවිතයට ආදරය කරන්න



03 සහන ලැබෙන මුහුදු ගමන



05 ඔබේ රුවටත් මුද්දරයක්



15 ජීවයේ සලකුණු හඹා යෑම



34 හෙළ මුද්‍රා නාටකයේ කාන්තා මුද්‍රාව




40 කාන්තා ක්‍රිකට් කිරුළ

# දෙසතිය
පුවත් සඟරාව

**ඔබ ළඟට ම ගෙන්වා ගන්න. පහත කූපනය පුරවා අප වෙත එවන්න.**


දෙසතිය

සඟරා ලැබිය යුතු නම හා ලිපිනය (ඉංග්‍රීසි භාෂාවෙන්)

Name ..............................................................

Address ..............................................................

..............................................................

..............................................................

..............................................................

..............................................................

ID Number ..............................Tel / Mobile ..............................

Signature .............................. Date..............................

දෙසතිය සඟරා දායකත්වය

දෙසතිය සඟරා දායකත්වය වාර්ෂික / අර්ධ වාර්ෂික ලාබා ගැනීමට කැමැත්තෙමි. ඒ සඳහා රු. 3,000.00/ රු. 1,500.00 වටිනාකමකින් යුත් අංකය.......................................... හා .................................... දින දරන චෙක්පත / මුදල් ඇණවුම එවමි.

චෙක්පත්/ මුදල් ඇණවුම් ''ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්'' නමට ලියා, තැපැල් කාර්යාලය, කම්කරු මහ ලේකම් කාර්යාලය, නාරාහේන්පිට ලෙස සඳහන් කර කූපනයද පුරවා මෙම ලිපිනයට එවන්න.

දෙසතිය, බෙදාහැරීම් කළමනාකරු, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, 163, පොල්හේන්ගොඩ, කොළඹ 05


## ආරක්ෂාව සාමූහික ප්‍රතිඵලයක්

නොබෝද්ද අම්පාර දිස්ත්‍රික්කයේ ආරුගම්බේ ප්‍රදේශය පිළිබඳ වැඩි කතාබහක් පැතිර ගියා. ඒ, කොළඹ ඇමරිකානු තානාපති කාර්යාලය විසින් සිය පුරවැසියන්ට එහි සංචාරය කිරීමෙන් වළකින ලෙස නිකුත් කරන ලද අවවාදාත්මක පණිවිඩයත් සමග. ශ්‍රී ලංකාවේ පිහිටි බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය ඇතුළු තවත් විදෙස් තානාපති කාර්යාල කිහිපයක් ද මෙරට සංචාරයේ නිරත සිය පුරවැසියන්ට ඒ සම්බන්ධයෙන් අවධානයෙන් පසුවන ලෙසට දැනුම් දී තිබුණා.

බුද්ධි අංශ තොරතුරු අනුව මෙහිදී අනාවරණය වී තිබුණේ ශ්‍රී ලංකාවේ රැඳී සිටින ඊශ්‍රායල් ජාතිකයන් ඉලක්ක කරමින් ඔක්තෝබර් 19ත් 23ත් අතර කාලයේ යම් ප්‍රහාරයක් එල්ල කිරීමේ සූදානමක් පවතින බව. එහෙත් රජය ඊට පියවර ගෙන තිබුණේ අදාළ තොරතුරු මාධ්‍ය ඔස්සේ අනාවරණය වීමටත් පෙර. මැද පෙරදිග කලාපයේ හමාස් සහ හිස්බුල්ලා සංවිධානයට ඊශ්‍රායලය සිදු කරන ප්‍රහාර හේතුවෙන් මෙවැනි ක්‍රියා සිදු වන බවටයි අදහස් පළ වන්නේ. ඔක්තෝබර් මාසය යනු ඊශ්‍රායල ජාතිකයන්ගේ ආගමික උත්සව පැවැත්වෙන සමයක් වන නිසා ඔවුන්ගේ ජන ඒකරාශී වීම් එම පිරිස්වල ඉලක්කය වී තිබුණා.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය නිකුත් කළ නවතම වාර්තාවකට අනුව 2024 ඔකතෝබර් 20 දින වන විට මෙරටට පැමිණි සංචාරක පිරිස 1,570,644ක්. මේ තත්ත්වය මෙරට සංචාරක කර්මාන්තයට දැල්වෙමින් තිබෙන කොළ එළියක් නිසා මෙවැනි මොහොතක රටේ ආරක්ෂාව තහවුරු වීම අත්‍යවශ්‍ය කාරණයක්. ආරුගම්බේ ප්‍රදේශය සම්බන්ධයෙන් ඇති කළ අනතුරු ඇඟවීමත් සමග රජය අවධාරණය කළේ ලද බුද්ධි තොරතුරු අනුව විශේෂයෙන් ශ්‍රී ලංකාවේ සංචාරකයන් බහුල ව ගැවසෙන ස්ථානවල ආරක්ෂාව තහවුරු කිරීම නිසි කලට සිදු කළ බව. මේ නිසා කිසිදු සංචාරකයකු ශ්‍රී ලංකාවේ ආරක්ෂාව සම්බන්ධයෙන් බිය විය යුතු නැති බවත් මේ තත්ත්වය ශ්‍රී ලංකාවට පමණක් නොව වෙනත් රටවලට ද පොදු වූ තත්ත්වයක් බවත් රජය සඳහන් කළා.

එසේ ම ශ්‍රී ලංකාවට කිසිදු සංචාරක තහනමක් පනවා නොමැති බව මෙරට ඇමරිකානු තානාපති ජූලි ජේ චන්ග් ද පවසා තිබෙනවා. ඔක්තෝබර් 23 දින සිට ඕනෑ ම සංචාරකයකුට ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටලුවක් ඇති වුවහොත් 1997 දරන ශ්‍රී ලංකා පොලිසියේ කෙටි දුරකතන අංකයට දැනුම් දීමේ පහසුව සලසා තිබෙන නිසා ඒ පිළිබඳ සංචාරකයන් දැනුවත් කිරීමත් ඉතා වැදගත්.

මේ සිදුවීමත් සමග දක්නට ලැබුණේ ඇතමුන් දේශපාලන වාසි ලබා ගැනීමේ සහ ආර්ථිකය බිඳ දැමීමේ අරමුණින් සංචාරකයන් බිය වැද්දීමට ක්‍රියා කරන ආකාරයක්. ගෙවමින් සිටින්නේ මැතිවරණ සමයක් නිසා එම තත්ත්වය බහුල ව දක්නට ලැබෙනවා. එහෙත් ලෝකයේ ත්‍රස්තවාදී ක්‍රියා බහුල ව සිදු වන අවධියක කළ යුත්තේ මෙවැනි බියවැද්දීම් නොව රටේ ආරක්ෂාව තහවුරු වීමට අවශ්‍ය සහයෝගය සාමූහික ව ලබාදීම.

මාලා මල්කාන්ති ජයරත්නමෙගේ

- සංස්කාරක -



# සහන ලැබෙන මුහුදු ගමන

චන්දන මාරසිංහ

ශ්‍රී ලංකාවේ සත්ත්ව ප්‍රෝටීන අවශ්‍යතාවෙන් 60%ක් පමණ සපුරාලන්නේ මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදනවලින්. ධීවර කර්මාන්තය ආශ්‍රිත අපනයනවලින් වාර්ෂික ව ඩොලර් මිලියන 200-300ක අතර විදේශ විනිමය ප්‍රමාණයක් උපයා ගැනීමේ හැකියාව ද පවතිනවා. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය වසන්ත අතුකෝරාළ පෙන්වා දෙන ආකාරයට දළ දේශීය නිෂ්පාදනයට ධීවර කර්මාන්තයේ දායකත්වය 1.3%ක්. මෙවැනි විභවතා නිසා මෙරට ධිවර කර්මාන්තයට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයක්.

ධීවර කර්මාන්තයට විවිධ හේතු මත විවිධ කාලවලදී බලපෑම් එල්ල වුණා. ශ්‍රී ලංකා මහා බැංකු වාර්තා පෙන්වා දෙන ආකාරයට 2019 වසරේදී මත්ස්‍ය නිෂ්පාදනය 4.0%කින් අඩුවී තිබෙනවා. ඉන්දීය සාගරයේ මතුවූ සුළි කුණාටු හේතුවෙන් මුහුදු යාමට නොහැකි වීමයි ඊට හේතුව. 2020 වසරේදී මත්ස්‍ය නිෂ්පාදනය අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබෙන්නේ කොවිඩ් 19 වසංගතය ව්‍යාප්ත වීම. කාලගුණයෙන් ද ඊට බලපෑම් එල්ල වී තිබෙනවා. එහිදී එම වසරේ

> ධීවර කාර්මිකයන්ට අවශ්‍ය ප්‍රධාන යෙදවුම වන ඉන්ධන මිල ඉහළ යාම ධීවර කර්මාන්තයට ඇති කර තිබෙන බලපෑම සුළුපටු නැහැ. මේ නිසා ගෙවුණු දෙවසරක කාලයේ ඉන්ධන මිල ඉහළ යාමෙන් දැඩි බලපෑමක් ඇති වූ ධීවර කර්මාන්තය යථාතත්ත්වයට පත් කිරීමට රජය ඉන්ධන සහනාධාරයක් ලබා දීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගත්තා.

සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය 15.2%කින් අඩු වූ බව සඳහන්.

ධීවර කර්මාන්තයට අහිතකර බලපෑම් ඇති වී තිබෙන්නේ මෙවැනි ස්වාභාවික හේතු නිසා පමණක් නොව ඉන්ධන අර්බුදය ඇතිවීමත් ඉන්ධන මිල ඉහළ යාමත් නිසා. එහිදී නිෂ්පාදන පිරිවැය ඉහළ යාම ආදී කරුණු මත ධීවර කාර්මිකයන් එම ක්ෂේත්‍රයෙන් ඉවත් වීමේ අවදානමක් ද නිර්මාණය වී තිබෙනවා. මෙහිදී අපහසුතා මතු ව තිබෙන්නේ ඍජු ව ධීවර කර්මාන්තයේ නිරත වන අයට පමණක් නොව අයිස් සැපයුම්කරුවන්ට, දැල් සැකසුම්කරුවන්ට, සිල්ලර මත්ස්‍ය වෙළෙඳුන්ට මෙන් ම පාරිභෝගිකයන්ටත්. මත්ස්‍ය මිල ගණන් ඉහළ යාම මේ අයුරින් බලපෑම් කළේ සියලු පාර්ශ්වවලට.

මෙවැනි තත්ත්වයක් මත ධීවර ක්ෂේත්‍රය සඳහා සහනාධාරයක් ලබාදීමට රජය තීරණය කර තිබෙනවා. එය ක්‍රියාත්මක වන්නේ 2024 ඔක්තෝබර් 01 දින සිට. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ධම්මික රණතුංග; "ධීවර කාර්මිකයන්ට අවශ්‍ය ප්‍රධාන යෙදවුම වන ඉන්ධන මිල ඉහළ යාම ධීවර කර්මාන්තයට ඇති කර තිබෙන බලපෑම සුළුපටු නැහැ. මේ නිසා ගෙවුණු දෙවසරක කාලයේ ඉන්ධන මිල ඉහළ යාමෙන් දැඩි බලපෑමක් ඇති වූ ධීවර කර්මාන්තය යථාතත්ත්වයට පත් කිරීමට රජය ඉන්ධන සහනාධාරයක් ලබා දීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගත්තා. ඩීසල් භාවිත බහු දින ධීවර යාත්‍රා 6000ක් සහ භූමිතෙල් භාවිත කුඩා ධීවර යාත්‍රා 32000ක් පමණ තිබෙනවා. මේ ලබාදෙන සහනාධාරය එම යාත්‍රා හිමියන්ට සහනයක් වනවා ඇති."

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සුසන්ත කහවත්ත පෙන්වා දෙන ආකාරයට මේ සහනාධාරය හිමි වන්නේ එම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ධීවර යාත්‍රා හිමිකරුවන්ට පමණයි. මේ නිසා ධීවර යාත්‍රා හිමියන් අලුතෙන් ලියාපදිංචි කරන වැඩපිළිවෙළක් ද ක්‍රියාත්මක වනවා. ලියාපදිංචි දින සිට

එම නව ධීවර යාත්‍රා හිමියන්ටත් මේ සහනාධාරය හිමි වන අතර යාත්‍රාවක් විකිණීමකදී හෝ පැවරීමකදී වුවත් අලුත් යාත්‍රා හිමියාගේ නම ඇතුළත් කර එම සහනාධාරය ඔවුන් වෙත ලබා දෙන බවයි අධ්‍යක්ෂ ජනරාල්වරයා පෙන්වා දෙන්නේ. සහනාධාරය ලබා දීමේදී ඒ සඳහා ඔවුන් ඉල්ලීමක් කළ යුතුයි.

ඉන්ධන සහනාධාරය ලබා දීම සම්බන්ධයෙන් අදහස් දක්වන අධ්‍යක්ෂ ජනරාල් සුසන්ත කහවත්ත; "2019 වසරේදී රුපියල් 104.00ක් වූ ඩීසල් ලීටරයක මිල 2022 වසරේදී රුපියල් 430.00 දක්වා ඉහළ ගොස් තිබෙනවා. වර්තමානයේ එහි මිල රුපියල් 283.00ක්. රජය ලබාදෙන ධීවර සහනාධාරය යටතේ බහු දින ධිවර යාත්‍රාවල එක් ගමන් වාරයක් සඳහා ලීටර් 12000ක සීමාවකට යටත් ව ඩීසල් ලීටර් එකකට රුපියල් 25ක සහනාධාරයක් හිමිවනවා. මේ නිසා ඩීසල් ලීටරයක මිල වන්නේ රුපියල් 258.00ක්. ඒ අනුව ඔවුන්ට හිමි වන්නේ ලක්ෂ 03ක සහනාධාරයක්. 2018 වසරේදී භූමිතෙල් ලීටරයක මිල රුපියල් 70.00ක්. 2021 වසරේදී එය රුපියල් 87.00 දක්වාත් 2022 වසරේදී රුපියල් 365.00 දක්වාත් වැඩි වී තිබෙනවා. භූමිතෙල් ලීටරයක වත්මන් මිල රුපියල් 183.00ක්. මසකට දින 25ක උපරිමයකට යටත් ව දිනකට ලීටර් 15කට රුපියල් 25.00 බැගින් සහනාධාරයක් දීමෙන් ඔවුන්ට මසකට හිමිවන සහනාධාර මුදල රුපියල් 9375ක්. එනම් ලබාදෙන සහනාධාරය අනුව කුඩා යාත්‍රා හිමියකුට භූමිතෙල් ලබා ගත හැකියි රුපියල් 158.00ක මිලටකට. මේ සහනය සෘජු ව ම හිමි වන්නේ යාත්‍රා හිමිකරුවන්ට නිසා ධීවර කාර්මිකයන්ටත් එම සහනයේ ප්‍රතිලාභය ධීවර යාත්‍රා හිමියන් විසින් ලබාදෙනු ඇතැයි අප බලාපොරොත්තු වනවා. ධීවර යාත්‍රා හිමියන්ගෙන් මෙන් ම ධීවර සමිති නියෝජිතයන්ගෙන් ද අප ඉල්ලා සිටිනවා ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස."

ධීවර කාර්මිකයන්ට හා එම ක්ෂේත්‍රයට මෙන් ම එහි ප්‍රතිලාභ පාරිභෝගික ජනතාවට ද හිමි විය යුතුයි. ඒ සඳහා අවධානය යොමු කිරීම වැදගත්. ඉදිරියේදී ඉන්ධන මිල ඉහළ ගියහොත් ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග පිළිබඳ රජය තීරණය කරනු ඇති බවයි අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධාරණය.

2019 කරදිය මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 415,000ක් වුවත් 2023 වසරේ එය 293,000 දක්වා පහළ ගොස් තිබෙනවා. මේ හේතුවෙන් රටේ ජනතාවගේ පෝෂණය කෙරෙහි එය සෘජු ව ම බලපා ඇති අතර අහිමි වී ඇත්තේ සෘජු හා වක්‍ර රැකියා රැසක්. නිෂ්පාදන පිරිවැය ඉහළ ගියත් මත්ස්‍ය අස්වැන්න විකුණා ගැනීමේදී මත්ස්‍ය මිල ගණන් ඉහළ නොයාම නිසා ධීවරයන් මුහුණදුන්නේ බලවත් අපහසුතාවට. මේ නිසා ඇතැම් ධීවරයන් කර්මාන්තයෙන් ඉවත් වූ අතර ම ඇතැම් යාත්‍රා ධීවර කර්මාන්තයට යොදගෙන නැහැ. මේ සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ බලපෑම් එල්ල වූ ධීවර කර්මාන්තයට සහනයක් ගෙන දීමට නිසා ධීවර කර්මාන්තයෙන් ඉවත්වූ පිරිසටත් යළි ධීවර කර්මාන්තයේ නිරත වීමේ හැකියාව ලැබීම මෙහි සුවිශේෂ ප්‍රතිලාභයක්. ස්වාභාවික ආපදා නොමැති විටෙකදී මත්ස්‍ය නිෂ්පාදන ඉහළ නැංවීම සඳහාත් මෙවැනි සහනාධාර වැඩසටහන් ඉවහල් වනවා. මත්ස්‍ය නිෂ්පාදනය වැඩිවීමෙන් ධීවර කර්මාන්තයේ නිරතවුවන්ගේ ආදායම වැඩි වන අතර මෙවැනි සහනාධාර ව්‍යාපෘති හේතුවෙන් පාරිභෝගිකයන්ට අඩු මිලට මත්ස්‍ය නිෂ්පාදන මිලදී ගැනීමටත් හැකි විය යුතුයි.

ධීවර සහනාධාරය ලබා දීමේදී එය ආර්ථික විද්‍යාත්මක ව සිදුවිය යුතු බවයි මහාචාර්ය වසන්ත අතුකෝරාළ පෙන්වා දෙන්නේ. එහිදී යෙදවුම්වලට වඩා නිමැවුම් පදනම් කරගනිමින් එය ක්‍රියාත්මක වන්නේ නම් ඵලදායී වන බවත් මේ වැඩපිළිවෙළ සම්බන්ධයෙන් රජය විශ්ලේෂණයක් සිදු කළ යුතු බවත් ඔහු අවධාරණය කරනවා. මේ අතර ම වැඩපිළිවෙළ නිසියාකාර ව සිදුවන්නේ ද යන්න පසු විපරමක නිරත වීමත් බලධාරීන්ගේ වගකීමක්.



# ඔබේ රුවටත් මුද්දරයක්

**බිනූ දිලාරා ගමගේ**




මුද්දර 20ක් ඇතුළත් පුද්ගලකාරක මුද්දර පත්‍රිකාව

ඔක්තෝබර් 09 දින පැවති ලෝක තැපැල් දින (2024) ජාතික සැමරුම් උළෙලේදී අග්‍රාමාත්‍ය හරිනි අමරසූරියගේ සහ අමාත්‍ය විජිත හේරත්ගේ රුව ඇතුළත් මුද්දර දෙකක් නිකුත් වීම සම්බන්ධයෙන් සමාජයේ සුවිශේෂ කතාබහක් නිර්මාණය වුණා. තැපැල්පති රුවන් සත්කුමාර පැවසුවේ එය, එම උලෙලේ ප්‍රධාන ආරාධිතයන්ගේ රුව සහිත පුද්ගලකාරක මුද්දර 20 බැගින් අඩංගු සමරු තිළිණ දෙකක් ප්‍රදානය කිරීමක් පමණක් බව.

තැපැල් දෙපාර්තමේන්තුව මූලිකත්වය දරන උත්සවවලදී ඒ සඳහා මූල්‍යමය අනුග්‍රාහකත්වය සපයන පිරිස විසින් ආරාධිත අමුත්තන් සඳහා පුද්ගලකාරක මුද්දර (Personalized Stamps) සහිත සමරු ඵලකයක් තිළිණයක් වශයෙන් ලබා දීම සාමාන්‍ය සිරිතක්. 'ඔබේ රුවටත් මුද්දරයක්' යන තේමාවෙන් තැපැල් දෙපාර්තමේන්තුවේ මුද්දර කාර්යාංශය නිකුත් කරන මේ පුද්ගලකාරක මුද්දරය සෙසු මුද්දරවලට වඩා සුවිශේෂ වන්නේ මහජනතාවටත් තමන්ගේ හෝ තම සමීපතමයකුගේ රුවක් ඇතුළත් කර නියමිත ගාස්තුව ගෙවා මුද්‍රණය කරවා ගැනීමට හැකිවීම නිසා.

අදහස් දක්වන මුද්දර කාර්යාංශයේ අධ්‍යක්ෂ ලංකා ද සිල්වා; "අතීතයේදී වෙළෙඳාම වඩා ප්‍රචලිත වූ එංගලන්ත සමාජයේ භාණ්ඩ හුවමාරුවේදී සිදුවන අක්‍රමිකතා මග හැරවීම සඳහා ගනුදෙනුවට මුල පුරන්නා විසින් මුදල් පළමු ව ගෙවා ප්‍රවාහන වියදම දරන ලද බව සහතික කිරීමයි මුද්දරයේ උපත. මෙහි ක්‍රමික වර්ධනය පසුව සර් රෝලන්ඩ් හිල් විසින් වික්ටෝරියා රැජිණගේ උඩුකය රුව සහිත 'Penny Black' නම් ලොව පළමු මුද්දරය 1840 මැයි 06 දින හඳුන්වා දීමට හේතුවුණා. බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේදී ලංකාවේ මුල්වරට මුද්දරයක් නිකුත් වුණේ 1957 අප්‍රේල් 01 දින පැන්ස 06ක වටිනාකමක් සහිත ව. මුද්දරය හුදෙක් තැපැල් කටයුතු හා ආදායම් ගෙවීම සඳහා භාවිත කරන මාධ්‍යයක් පමණක් නොවෙයි. එය එක්තරා ආකාරයක කලාවක්. මුද්දර එකතු කරන්නන්ට විනෝදාංශයක් සහ ව්‍යාපාරයක්."

දේශීය හා විදේශීය මුද්දරලෝලීන්ගේ අවශ්‍යතා පිළිබඳ සැලකිලිමත් වෙමින් වඩාත් උචිත තේමා යටතේ ආකර්ෂණීය මුද්දර නිකුත් කිරීමට 2008 වසරේදී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබීමත් සමග ජාතික මුද්දර ප්‍රතිපත්තියක් ද හඳුන්වා දී තිබෙනවා. එයට අනුව ශ්‍රී ලංකාවේ භාවිත තැපැල් හා ආදායම් මුද්දර සැලසුම් කිරීම, නිකුත් කිරීම, ආරක්ෂිත ව ගබඩා කිරීම සහ අලෙවි කිරීම තැපැල් දෙපාර්තමේන්තුව සතු කාර්යභාරයක්.

තැපැල් දෙපාර්තමේන්තුවෙන් ප්‍රධාන වශයෙන් ආදායම් මුද්දර හා තැපැල් මුද්දර නිකුත් කරනවා. තැපැල් මුද්දර නැවතත් ප්‍රභේද වන්නේ නිත්‍ය කාණ්ඩයේ මුද්දර, සමරු කාණ්ඩයේ මුද්දර, විශේෂ/ තේමාත්මක කාණ්ඩයේ මුද්දර සහ පුද්ගලකාරක මුද්දර යනුවෙන්. එදිනෙදා තැපැල් කාර්ය සඳහා අවශ්‍යතාව පරිදි නැවත නැවතත් මුද්‍රණය කෙරෙන මුද්දර නිත්‍ය කාණ්ඩයේ මුද්දර. සමරු කාණ්ඩයේ මුද්දර ජාතික හෝ ජාත්‍යන්තර වශයෙන් වැදගත් අවස්ථා, පුද්ගලයන්, සිදුවීම් සැමරීම සඳහා නිකුත් කෙරෙන අතර මේ මුද්දර කිසිදු හේතුවක් මත නැවත මුද්‍රණය කරන්නේ නැහැ. ශ්‍රී ලංකාවේ සංස්කෘතිය, ජන ජීවිතය, දේශීය උරුමය, වනජීවීන්, ස්වභාව සෞන්දර්යය, කලාව වැනි සුවිශේෂ තේමාවක් පදනම් කරගෙන මුද්‍රණය කෙරෙන්නේ තේමාත්මක කාණ්ඩයේ මුද්දර. සමරු මුද්දර (ආගමික, ලෝක තැපැල්, ලෝක ළමා දින සැමරුම ආදී) නිකුත් කිරීමේදී සම්භාවනීය පුද්ගලයන්, ජාතික සිදුවීම් හා සංවත්සර, අන්තර්ජාතික සිදුවීම්, ශ්‍රී ලාංකේය අභිමානය හා අනන්‍යතාව යන ප්‍රධාන අංශ පහ යටතේ මුද්දර සඳහා ලබාගත් මහජන අදහස් හා යෝජනා නිසි වරණයකට ලක් කර මුද්දර 35ක් වාර්ෂික ව මුද්‍රණය කෙරෙනවා. විශ්ව තැපැල් සංගමය විශේෂිත තේමාවක් යටතේ මුද්දරයක් නිකුත් කිරීමට සාමාජික රටවලින් ඉල්ලීමක් කර ඇති විට එකී තේමා පදනම් කරගෙන එම මුද්දරය නිකුත් කිරීමත් කළ යුත්තක්.

අධ්‍යක්ෂ ලංකා ද සිල්වා සඳහන් කරන ආකාරයට මුද්දර කාර්යාංශය විසින් පළමු වරට පුද්ගලකාරක මුද්දරය හඳුන්වා දී තිබෙන්නේ 2008 වසරේදී. ඒ, සර් රෝලන්ඩ් හිල්ගේ රුව සහිත මුද්දරය සහ පුද්ගල ඡායාරූපය ලෙසින් කොටස් දෙකකින් යුක්ත ව. පුද්ගලකාරක මුද්දරය නැවතත් 2010, 2013, 2017 සහ 2021 වසරවලදී සංශෝධනය කර තිබෙනවා. 2021 වසරේ සිට මේ වන තෙක් භාවිතයේ පවතින පුද්ගලකාරක මුද්දරයේ විශේෂත්වය වන්නේ එහි ආරක්ෂිත කොටසේ

ඇති ක්ෂණික ප්‍රතිචාර (QR) කේතය. පුද්ගලකාරක මුද්දරයක් සඳහා අයදුම් කරන පුද්ගලයාගේ හෝ සංවිධානයේ හෝ ඉල්ලීම පරිදි මුද්දරයේ ඡායාරූපයට අදාළ දත්ත හෝ තොරතුරු මේ QR කේතයට ඇතුළත් කිරීමේ හැකියාව තිබෙනවා. තැපැල් දෙපාර්තමේන්තුවේ නිල ලාංඡනය ඇතුළත් QR කේතය සහිත පළමු පුද්ගලකාරක මුද්දරය නිකුත් කර තිබෙන්නේ 2021 මාර්තු 16 දින.

ජාත්‍යන්තර සබඳතා වෙනුවෙන් ද්වී පාර්ශ්වික ව පුද්ගලකාරක මුද්දර නිකුත් කිරීමත් සිදුවනවා. 75 වසරක් සම්පූර්ණ වීම නිමිත්තෙන් 2023 වසරේදී ශ්‍රී ලංකා තුර්කි රාජ්‍යතාන්ත්‍රික සබඳතා වෙනුවෙන් නිකුත් කරන ලද විශේෂ පුද්ගලකාරක මුද්දර ද්විත්වය ඊට නිදසුනක්.

සමරු මුද්දරයක් වශයෙන් තෝරා නොගැනෙන, එහෙත් සමරු මුද්දරයක් වශයෙන් මුද්‍රණය කරවා ගැනීමට යම් පුද්ගලයකුට හෝ ආයතනයකට ඇති අවශ්‍යතාව සලකා බලමින් ඒවා මුදල් ගෙවා පුද්ගලකාරක මුද්දරයක් වශයෙන් නිකුත් කර ගැනීමටත් හැකියාව තිබෙනවා. එහිදී පුද්ගලකාරක මුද්දර යොදා ගනිමින් විශේෂ සමරු කවර, විශේෂ කවර සහ තැපැල් පත් නිකුත් කිරීමේ නීත්‍යනුකූල අයිතියත් සතු වන්නේ තැපැල් දෙපාර්තමේන්තුවට.


පුද්ගලකාරක මුද්දරයක් නිකුත් කිරීමේදී ඒ සඳහා සදාචාරාත්මක නොවන ඡායාරූප භාවිත කිරීමට හෝ දුම්කොළ, සිගරට්, මත්ද්‍රව්‍ය ප්‍රවර්ධනය කෙරෙන සලකුණු, තේමා පාඨ, ඡායාරූප යොදා ගැනීමට හැකියාවක් නැහැ. ආයතනයක, සංවිධානයක සංකේතයක් හෝ ගොඩනැගිල්ලක් භාවිත කරමින්



අධ්‍යක්ෂ
**ලංකා ද සිල්වා**



QR කේතය සහිත පළමු පුද්ගලකාරක මුද්දරය



රෝලන්ඩ් හිල්ගේ රුව සහිත මෙරට පළමු පුද්ගලකාරක මුද්දරය



2023 වසරේදී නිකුත් කරන ලද ද්විපාර්ශ්වික පුද්ගලකාරක මුද්දර නිකුතුව

පෞද්ගලික මට්ටමින් පුද්ගලකාරක මුද්දර නිකුත් කිරීමක් සිදු වන්නේ ද නැහැ. රජයේ, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ, තැපැල් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාව පරිදි ආගමික සිද්ධස්ථාන, රජයේ ගොඩනැගිලි හෝ රාජ්‍ය ආයතන, රාජ්‍ය සංවිධාන සහ ජාත්‍යන්තර සංවිධානවල සංකේත හෝ නිල ලාංඡන හෝ ඇතුළත් පුද්ගලකාරක මුද්දර විශේෂ සැමරුම් අවස්ථා සඳහා සමරුවක් වශයෙන් නිකුත් කිරීමට අවසර තිබෙනවා.

පුද්ගලකාරක මුද්දරයක් නිකුත් කිරීමේදී ඒ සඳහා අයදුම් කරන පුද්ගලයා හෝ සංවිධානය හෝ විසින් ලබා දෙන ඩිජිටල් හෝ මුද්‍රිත ස්වරූපයේ ඡායාරූපයක් (තාක්ෂණික දෝෂවලින් තොර) හා ඊට අදාළ ගෙවීම සිදු කිරීමෙන් පසුව මුද්දර නිර්මාණකරුවකු විසින් චිත්‍ර නිර්මාණය කර මුද්දර කාර්යංශය වෙත භාර දීමයි සිදු වන්නේ. එහි අවසාන ග්‍රැෆික් චිත්‍රණයට ගැළපෙන වර්ණ යෙදීම හා මුල් නිර්මාණයේ සංශෝධන සිදු කිරීමෙන් පසුව විනාඩි 10ක් වැනි කෙටි වේලාවක් ඇතුළත පුද්ගලකාරක මුද්දරයක් නිර්මාණය කර ගැනීමේ හැකියාව මහජනතාවට තිබෙන බව අධ්‍යක්ෂ ලංකා ද සිල්වා පෙන්වා දෙන කරුණක්. මුහුණත වටිනාකම රුපියල් 25.00ක් වන මුද්දර 20ක් ඇතුළත් එක් පුද්ගලකාරක මුද්දර පත්‍රිකාවක් නිකුත් කිරීමට රුපියල් 2000.00ක මුදලක් සාමාන්‍යයෙන් අය කර ගන්නා බවත් මේ ගාස්තුව සංශෝධනය වීමක් සිදු වුවහොත් එය මහජනතාවට දෙන බවත් ඔහු පවසනවා.

පුද්ගලකාරක මුද්දර නිකුත් කිරීම සම්බන්ධයෙන් බල පැවැත්වෙන නීති හා රෙගුලාසි අනුව තමන්ට හෝ තම සමීපතමයෙකුගේ හෝ හිතවතෙකුගේ උපන්දිනයක්, විවාහ සංවත්සරයක්, මංගල සුබපැතුමක්, උසස්වීම්, කාර්යාල ස්ථාන මාරු වීම්, විශ්‍රාම ගැන්වීම් වැනි විශේෂ අවස්ථාවක් වෙනුවෙන් සිහිවටනයක් ලෙස එවැනි මුද්දරයක් ලබා දීමට හැකියාව තිබෙනවා. එහෙත් ලිඛිත ව තහවුරු කළ යුතු වන්නේ මහජන නියෝජිතයකු, ප්‍රසිද්ධ සම්භාවනීය පුද්ගලයකු, පූජ්‍ය පක්ෂය සහ විදේශීය සම්භාවනීය පුද්ගලයෙකුගේ ඡායාරූපයක් වෙනත් පාර්ශවයක් විසින් පුද්ගලකාරක මුද්දරයක් ලෙසින් නිකුත් කරනු ලබන්නේ නම් ඊට අදාළ පාර්ශ්වවල විරෝධතාවක් නොමැති බවට.

# ශිෂ්ටත්වයේ දේශපාලන ගමන



ආචාර්ය
**ප්‍රදීප් උළුවඩුගේ**
සමාජීය විද්‍යා අධ්‍යයනාංශය
සමාජීය විද්‍යා හා භාෂා පීඨය
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාවේ පැවැත්වුණු නව වැනි ජනාධිපතිවරණය ඉතා සුවිශේෂයි. පෙර පැවති ජනාධිපතිවරණවලින් බලයට පත් වුණේ බොහෝ විට දක්ෂිණාංශික නැඹුරුවක් සහිත දේශපාලන පක්ෂයක අපේක්ෂකයෙක්. නමුත් ශ්‍රී ලංකාවේ නව වැනි විධායක ජනාධිපතිවරයා වශයෙන් පත් වූ අනුර කුමාර දිසානායක ජනතාව අතරින් මතු වූ නායකයෙක්. ඔහු ග්‍රාමීය පරිසරයක හැදුණු වැඩුණු, රාජ්‍ය විශ්වවිද්‍යාලයක උපාධියක් සහිත, ග්‍රාමීය ජන විඥානය හඳුනන වාමාංශික නැඹුරුවක් සහිත දේශපාලනඥයෙක්. ඇතමකු තර්ක කළ හැකියි ජාතික ජනබලවේගය පක්ෂයක් ලෙසින් එළි දකින්නේ සන්ධානයක් ලෙසින් නිසා මෙහි වාමාංශික නැඹුරුවක් නැහැ කියා. එවැනි සන්ධානගත වීමක් පැවතියත් මා විශ්වාස කරනවා ඒ සියලු පක්ෂ යම් ආකාරයක මාක්ස්වාදී නැඹුරුවක් සහිත ව ක්‍රියාත්මක වන බව. නව ජනාධිපතිවරයා තහවුරු කරමින් සිටිනවා නව දේශපාලන සංස්කෘතියක් සඳහා ප්‍රවේශයක් ඇති කරමින් තිබෙන බව.

ලෝකයේ දේශපාලන සංස්කෘතිය දියුණු සහ නොදියුණු යනුවෙන් කොටස් දෙකකට වර්ග කළහොත් ශ්‍රී ලංකාවේ බොහෝ විට දක්නට ලැබුණේ නොදියුණු දේශපාලන සංස්කෘතියක ලක්ෂණ. පාලකයා නීතියට ඉහළින් පවතින බවට ආකල්පයක් පැවතීම, වංචා, දූෂණ සහ අක්‍රමිකතා බහුල වීම, ජනතාවගේ ආකල්පවල ඇති පසුගාමී ස්වභාවය නොදියුණු දේශපාලන සංස්කෘතියක ලක්ෂණ. ශ්‍රී ලංකාවේත් මේ ලක්ෂණ දක්නට ලැබුණා. දියුණු දේශපාලන සංස්කෘතියක මෙයට ප්‍රතිවිරුද්ධ ලක්ෂණ දකින්න පුළුවන්.

දියුණු දේශපාලන සංස්කෘතියක් සහිත රාජ්‍ය ලෙස පවතින නවසීලන්තය, ඕස්ට්‍රේලියාව, එංගලන්තය, ඇමරිකා එක්සත් ජනපදය වැනි රටවල රාජ්‍ය නායකයන් සහ මහජනතාව අතර විශාල පරතරයක් නැහැ. එම රටවල් ආර්ථික වශයෙනුත් දේශපාලනික වශයෙනුත් දියුණු තත්ත්වයක පැවතීමයි එයට හේතුව. ශ්‍රී ලංකාවේත් වියදම් කළමනාකරණය, නාස්තිකාර වියදම් අවම කිරීම, දේශපාලකයන් වශයෙන් අවම වරප්‍රසාද සහ පහසුකම් භාවිත කිරීම ආදිය සිදු වෙමින් තිබීම සාධනීය තත්ත්වයක්.

වර්තමානයේ එම තත්ත්වය ඇති වෙමින් තිබෙන බව පෙන්නුම් කරනවා. ශ්‍රී ලංකාවේ පුරවැසියන් තමන්ගේ පෞද්ගලික අවශ්‍යතා ඉටු කර ගැනීමට පාලකයන් පිටුපස යන ක්‍රමයේ වෙනසක්, දූෂණය වංචාවෙන් තොර සමාජයක්, දේශපාලනයෙන් ධනය උපයන්නකු බවට පත් වන ක්‍රමයේ වෙනසක් ඇතුළු පුළුල් අර්ථයකින් යුතු 'පිරිසිදු ශ්‍රී ලංකාවක්' යන සංකල්පය මතු වෙමින් තිබෙනවා. නමුත් නොදියුණු දේශපාලන සංස්කෘතියක් සහිත රටක ජනතාව මෙය දකින්නේ වෙනස් අර්ථයකින් වීම අස්වාභාවික තත්ත්වයක් නොවෙයි. මෙය ඉතා කෙටි කාලයකින් ළඟා කර ගත හැකි තත්ත්වයක් නොවන බවත් කිව යුත්තක්. මෙය යම් ආකාරයක දෘශ්‍යමාන තත්ත්වයට පැමිණීමට අවම වශයෙන් වසරකවත් ගත වන්නට පුළුවන්.

දියුණු දේශපාලන සංස්කෘතියක් සහිත රාජ්‍ය ලෙස පවතින නවසීලන්තය, ඕස්ට්‍රේලියාව, එංගලන්තය, ඇමරිකා එක්සත් ජනපදය වැනි රටවල රාජ්‍ය නායකයන් සහ මහජනතාව අතර විශාල පරතරයක් නැහැ. එම රටවල් ආර්ථික වශයෙනුත් දේශපාලනික වශයෙනුත් දියුණු තත්ත්වයක පැවතීමයි එයට හේතුව. ශ්‍රී ලංකාවේත් වියදම් කළමනාකරණය, නාස්තිකාර වියදම් අවම කිරීම, දේශපාලකයන් වශයෙන් අවම වරප්‍රසාද සහ පහසුකම් භාවිත කිරීම ආදිය සිදු වෙමින් තිබීම සාධනීය තත්ත්වයක්. පවතින භාරකාර ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලය මෙන් ම ඉදිරියේදීත් ආමාත්‍ය මණ්ඩලය 25කට සීමා කරන බව පැවසෙනවා. එය බොහෝ රටවල අමාත්‍ය මණ්ඩලයේ සංඛ්‍යාවට සමානයි. ඉන්දියාවේ මෙය 26ක්. චීනයේ 24ක්. එම රටවල් ලෝකයේ

වැඩි ම ජනගහනයක් සිටින රටවල්. මෙවැනි ක්‍රියාමාර්ග දියුණු දේශපාලන සංස්කෘතියකට අවශ්‍ය පදනම සපයනවා.

වත්මන් ආණ්ඩුව මේ කෙටි කාලයට මුහුණදුන් බරපතළ ම අභියෝගය ලෙසින් මා දකින්නේ ආරුගම්බේ සිදුවීම. එය ජාත්‍යන්තර දේශපාලනයත් සමග බැඳුණු ගැටලුකාරී තත්ත්වයක්. වත්මන් ආණ්ඩුව මෙයට මුහුණදුන් ආකාරය වගකිව යුතු රාජ්‍යයක සහ ජනතා ආරක්ෂාව ප්‍රමුඛකොට සලකන ආණ්ඩුවක ලක්ෂණ පෙන්නුම් කළා. මෙය ජාතික ආරක්ෂාව පිළිබඳ ගැටලුකාරි තත්ත්වයක් නිසා ඉතා සංවේදී කාරණයක්. එවැනි අවස්ථාවකදී මහජන කැළඹීමක් ඇති නොවෙන පරිදි ජාතික ආරක්ෂාව තහවුරු කළ හැකි වන්නේ පරිණත දේශපාලන නායකත්වයකට පමණයි. බොහෝ විදේශිකයන් ද ජනමාධ්‍ය ඔස්සේ මේ බව ප්‍රකාශ කර තිබුණා.

වත්මන් ජනාධිපතිවරයාගෙන් මහජනතාව බලාපොරොත්තු වන ප්‍රධානතම කාරණයක් වන්නේ රටේ වංචාව හා දූෂණය අවම කිරීමත් දූෂකයන් නීතිය හමුවට ගෙන ඒමත්. වංචාව හා දූෂණය පිටුදැකීමත් වරදකරුවන් නීතිය හමුවට ගෙන ඒමත් මා දකින්නේ ක්‍රියාවලියක් හැටියට. එය ක්ෂණික ව කළ නොහැකියි. ඒ සඳහා වන යාන්ත්‍රණය සුජාතවත් විය යුතුයි. පිළිගත හැකි, විශ්වසනීයත්වයෙන් යුක්ත විය යුතුයි. පවතින යාන්ත්‍රණයේ යම් යම් ගැටලුකාරී තත්ත්ව පවතින නිසා පළමුවෙන් කළ යුතු වන්නේ එම යාන්ත්‍රණය, එසේ නැතහොත් නෛතික පසුබිම ඇති කිරීම සඳහා වූ ජනතාවගේ පූර්ණ බලය ලබා ගැනීම.

ශ්‍රී ලංකාවේ ජන ජීවිතය නගා සිටුවීමේදී කෘෂිකර්මාන්තය, ධීවර කර්මාන්තය, සංචාරක කර්මාන්තය හා සේවා අංශය වර්ධනය කිරීම මූලික ව ම කළ යුත්තක්. වත්මන් ආණ්ඩුව මේ අංශ කෙරෙහි අවධානය යොමු කර තිබෙන්නේ පැවති ධනේශ්වර ක්‍රමය වෙනුවට ධනවාදය සහ සමාජවාදය මිශ්‍ර වූ ක්‍රමයකින්.

වත්මන් ආණ්ඩුව යන ගමන් මාවතේ උපරිම සාර්ථකත්වය ලබා ගැනීමටනම් රටේ දේශපාලන ස්ථාවරත්වය

**වත්මන් ආණ්ඩුව මේ කෙටි කාලයට මුහුණදුන් බරපතළ ම අභියෝගය ලෙසින් මා දකින්නේ ආරුගම්බේ සිදුවීම. එය ජාත්‍යන්තර දේශපාලනයත් සමග බැඳුණු ගැටලුකාරී තත්ත්වයක්. වත්මන් ආණ්ඩුව මෙයට මුහුණදුන් ආකාරය වගකිව යුතු රාජ්‍යයක සහ ජනතා ආරක්ෂාව ප්‍රමුඛකොට සලකන ආණ්ඩුවක ලක්ෂණ පෙන්නුම් කළා. මෙය ජාතික ආරක්ෂාව පිළිබඳ ගැටලුකාරී තත්ත්වයක් නිසා ඉතා සංවේදී කාරණයක්.**

අඛණ්ඩ ව පවත්වාගත යුතු වනවා. යම් හෙයකින් එළඹෙන පාර්ලිමේන්තු මැතිවරණයේදී පවතින භාරකාර ආණ්ඩුවට බහුතර බලය ලබා ගැනීමට නොහැකි වුවහොත් විටින් විට ආණ්ඩු මාරු වෙන දේශපාලන අස්ථාවරත්වයක් රටේ ඇති වීමේ හැකියාවක් තිබෙනවා. එක් පක්ෂයකින් ජනාධිපතිවරයාත් වෙනත් පක්ෂයකින් අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයත් වශයෙන් බිහිවෙන සහවාස ආණ්ඩුවල ඇති වූ ගැටලු නිසා ශ්‍රී ලංකාවේ දේශපාලන අස්ථාවර වීම් ඇති වූ බවට උදාහරණ තිබෙනවා. 2003දී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග ජනාධිපති ලෙසිනුත් 2001 මැතිවරණයෙන් ජයග්‍රහණය කළ රනිල් වික්‍රමසිංහ අගමැති වශයෙන් ක්‍රියා කළා. මෙහිදී ඇති වූ ගැටලුකාරී තත්ත්ව නිසා ජනාධිපතිවරිය පාර්ලිමේන්තුව විසුරුවා හැරියා. යහපාලන පාලන ආණ්ඩු සමයේත් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා සහ අගමැති රනිල් වික්‍රමසිංහ අතර ඇති වු ගැටුම් හේතුවෙන් විශාල දේශපාලන අර්බුදයක් රටේ ගොඩ නැගුණා. රටේ මූල්‍ය පාලනයේ බලය පවතින්නේ පාර්ලිමේන්තුවට. මේ නිසා ඉදිරි පාර්ලිමේන්තු මැතිවරණය මෙරට දේශපාලනයේ තීරණාත්මක සන්ධිස්ථානයක් වන අතර ම එය මෙරට ජනතාව ගන්නා ඓතිහාසික තීන්දුවක් ද වනු ඇති බවයි මගේ හැඟීම.

සාකච්ඡා කළේ;
**දීප්ත කුමාර බටගොඩ**





# සොඳුරු මාරයා

රංගිකා අබේසේකර

වර්තමානයේ වැඩිහිටියන්, තරුණයන්, කුඩා දරුවන් ලෙස වයස් භේදයකින් තොර ව ඩිජිටල් තිර සහිත මෙවලම් භාවිත කිරීම සුලබ දසුනක්. ඔවුන් ඩිජිටල් තිර සඳහා ගත කරන කාලයේ වර්ධනයක් දැකගන්නට පුළුවන්. මෙය මානසික හා කායික වශයෙන් අහිතකර සෞඛ්‍ය බලපෑම් ඇති කරන බව තහවුරු වී තිබෙන්නක්.

'ඩිජිටල් තිර කාලය' (screen time) යනු ස්මාර්ට් ජංගම දුරකතනයක්, පරිගණකයක්, අන්තර්ජාල වීඩියෝ ක්‍රීඩා උපකරණයක් වැනි තිරයක් සහිත මෙවලමක් භාවිත කරමින් ගත කරන කාලය. වයස අවුරුදු 12ට අඩු දරුවන් සඳහා ඩිජිටල් මෙවලම් භාවිතයට දවසට වෙන් වන කාලය උපරිමය පැය 02කට සීමා විය යුතු බවයි ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දෙන්නේ. විශේෂයෙන් වයස අවුරුදු 01 සිට වයස අවුරුදු 12 අතර කාලයේදීයි මිනිස් මොළයේ ඉදිරිපස කොටසේ ඇතැම් කොටස් වර්ධනය වීම සිදුවන්නේ. ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තා අනුව මෙවැනි වයස් සීමාවකදී වැඩි කාලයක් ඩිජිටල් උපකරණ සඳහා යොමු වුවහොත් එහි ප්‍රතිඵලයක් ලෙස තර්කන හැකියාව, බුද්ධිය, යම් යම් මානසික ව්‍යාකූලතා ඇතිවීමේ හැකියාවක් පවතිනවා.

ඩිජිටල් තිරයෙන් නික්මෙන නිල් පැහැති ආලෝකය මොළයේ ඇතැම් ප්‍රදේශ කරා යම් යම් බලපෑම් ඇති කිරීමට සමත්වන වන බව කොළඹ ජාතික රෝහලේ

ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව දරුවකු හෝ වැඩිහිටි පුද්ගලයකු හෝ වැඩි කාලයක් ශාරීරික ක්‍රියාකාරකම්වල යෙදීම හා ප්‍රමාණවත් නින්දක් ලබා ගැනීම කළ යුත්තක්. එහෙත් එම සංවිධානයේ අධ්‍යයනවලින් තහවුරු වී ඇත්තේ ඩිජිටල් මෙවලම් භාවිතයේදී ශාරීරික ව අක්‍රිය වීම සිදුවන බව. ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශ අනුව ළදරු හෙවත් වයස අවුරුදු 01ට අඩු දරුවන්ට සහ වයස අවුරුදු 01-02 අතර දරුවන් සඳහා ඩිජිටල් තිර කාලයක් නිර්දේශ කරන්නේ නැහැ.

විශේෂඥ වෛද්‍ය වරුණ ගුණතිලක සඳහන් කරන කාරණයක්. විශේෂයෙන් නින්ද ඇතිවන්නේ මොළයේ ඉදිරිපස කොටසේ පහළින් තිබෙන පයනියල් ග්‍රන්ථියෙන් ස්‍රාවය වන මෙලටොනින් (Melatonin)හෝමෝනය හේතුවෙන්. සාමාන්‍යයෙන් අඳුර ඇති විට මෙලටොනින් හෝමෝනය ස්‍රාවය වනවා. මේ නිසයි නිද්‍රාවට පත්වන්නේ. ඒ අනුව ඩිජිටල් තිර සහිත මෙවලම්වලින් නිකුත් කරන නිල් පැහැති ආලෝක ධාරාව සුව නින්දකට අවශ්‍ය නිද්‍රාජනක හෝමෝනය ස්‍රාවය කිරීම අත්හිටුවනවා. එවිට සිදුවන්නේ පුද්ගලයාට සාමාන්‍ය නින්දක් නොලැබීම. ඒ හේතුව නිසා නිදාගැනීමට පැය 02කට පෙර මෙවැනි උපකරණවලින් දුරස් විය යුතු බවයි විශේෂඥ විශේෂඥ වෛද්‍ය වරුණ ගුණතිලකගේ උපදේශය.

ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව දරුවකු හෝ වැඩිහිටි පුද්ගලයකු හෝ වැඩි කාලයක් ශාරීරික ක්‍රියාකාරකම්වල යෙදීම හා ප්‍රමාණවත් නින්දක් ලබා ගැනීම කළ යුත්තක්. එහෙත් එම සංවිධානයේ අධ්‍යයනවලින් තහවුරු වී ඇත්තේ ඩිජිටල් මෙවලම් භාවිතයේදී ශාරීරික ව අක්‍රිය වීම සිදුවන බව. ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශ අනුව ළදරු හෙවත් වයස අවුරුදු 01ට අඩු දරුවන්ට සහ වයස අවුරුදු 01-02 අතර දරුවන් සඳහා ඩිජිටල් තිර කාලයක් නිර්දේශ කරන්නේ නැහැ. අවුරුදු 02ක් හා අවුරුදු 03-04ත් අතර දරුවන් සඳහා පැයකට වඩා අඩු කාලයක් පමණයි එහිදී නිර්දේශ කර තිබෙන්නේ.

බොහෝ විට ඩිජිටල් තිර භාවිතය වාඩිවී කරන ක්‍රියාකාරකමක් බැවින් එම මෙවලම භාවිත කරන අතරතුර ශාරීරික ව අක්‍රිය වීම සිදුවන නිසා අනාගතයේදී බෝ නොවන රෝග ගණනාවක් ඇතිවීමට එය හේතු වනු ඇති බවයි වෛද්‍ය මතය. විශේෂයෙන් එහිදී යෞවන වයසේ පසුවන්නන් වාඩි වී සිටීම නිසා තරබාරුකමට ගොදුරු වන බවත් එය ගෝලීය මරණ අනුපාතයේ අවදානම් සාධකයක් ලෙස හඳුනාගෙන ඇති බවත් ලෝක සෞඛ්‍ය සංවිධානයේ දත්ත අනාවරණය කරනවා. දරුවන්ගේ අවධානය අඩු බව, වාග්මාලාව හැසිරවීමේ දුර්වලතා, සන්නිවේදන කුසලතා අවම වීම, තීරණ ගැනීමට ඇති නොහැකියාව, නිර්මාණශීලීත්වයට සහ අක්ෂි ආබාධ ඇති වීම මෙහි අහිතකර ප්‍රතිවිපාක බවත් ලෝක සෞඛ්‍ය සංවිධානය අනතුරු අඟවනවා. එහි සඳහන් ආකාරයට තිර කාලය අවම කිරීමෙන් ශාරීරික ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම, වාඩිවී සිටින කාලය අඩු කිරීම සහ කුඩා දරුවන්ගේ ගුණාත්මක නින්ද සහතික කිරීම, ඔවුන්ගේ ශාරීරික මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම වැඩිදියුණු කිරීම, ළමා තරබාරුකම අවම කිරීම පසුකාලීන ව වැළඳෙන රෝග රැසක් වළක්වා ගැනීමට උපකාරී වනු ඇති.

කැනේඩියානු පරීක්ෂකයන් කණ්ඩායමක් (JAMA Pediatrics) විසින් අන්තර්ජාලය ඔස්සේ ප්‍රකාශයට පත්කරන ලද අධ්‍යයනයකට අනුව වයස අවුරුදු 02-03 වයස්වල දරුවන් පිළිවෙළින් දිනකට පැය 02-04ක් සහ 03-06ක් රූපවාහිනිය නරඹනවා. එවිට තිර කාලය අධික වීමෙන් ද වන්නේ අක්ෂි ආබාධ වැනි පසුකාලීන ප්‍රතිවිපාක. 2018 American Eye QR Survey සමීක්ෂණයට අනුව සෑම දෙමාපියන් 4/5ක් ම දිනකට අවම වශයෙන් පැය 01ක් තම දරුවාගේ කාලය ගත කරන්නේ පරිගණකයක් හෝ ජංගම උපාංගයක් හෝ භාවිත කරමින්. එයින් තහවුරු වී ඇත්තේ ඉලෙක්ට්‍රොනික උපාංග දිගුකාලීන භාවිතය හේතුවෙන් දරුවන්ගේ ඇස්වලට හානි සිදු වන බව.

අදහස් දක්වන විශේෂඥ වෛද්‍ය වරුණ ගුණතිලක; "කොවිඩ් 19 වසංගතයත් සමග ඩිජිටල් තිර භාවිත  නොකළ යුතු වයස් කාණ්ඩ පවා ඊට යොමු වුණා. ඩිජිටල් තිරවලට අප දීර්ඝකාලීන ව යොමු වන විට තාක්ෂණයත් සමග ඇබ්බැහිවන්නට පුළුවන්. එය මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වනවා හා සමානයි. තිරය ඉදිරියේ වැඩි කාලයක් රැඳීමෙන් සාමාජීය වශයෙන් පුද්ගලයන් එකිනෙකාගෙන් දුරස් වීමත් සිදුවනවා. එවිට සාමාජීය වශයෙන් ගෘහයේ ම පුද්ගලයන් හුදෙකලා බවට පත්වීම සුලබ කාරණයක්. විශේෂයෙන් දරුවන් සහ යෞවනයන් අන්තර්ජාල ක්‍රීඩාවලට යොමු වීමෙන් වැඩි කාලයක් ඩිජිටල් තිර මත වැය කරනවා. එම ඇබ්බැහි වීම නිසා මානසික ආතති, අවපීඩන තත්ත්ව, චිත්තවේගවල ප්‍රචණ්ඩත්වය සහ චර්යා රටාවල වෙනස්වීම් සිදු වන්නට පුළුවන්. ඒ නිසයි තිර කාලය කළමනාකරණය වැදගත් වන්නේ".

වෛද්‍ය උපදේශයට අනුව ආලෝකය නොමැති ව රාත්‍රියට ඩිජිටල් මෙවලම් භාවිතය සුදුසු වන්නේ නැහැ. සෑම විනාඩි 45කට වරක් විනාඩි 05ක් හෝ ඇස්වල නාභිගත කිරීම වෙනස් කළ යුතු බවයි විශේෂඥ වෛද්‍ය වරුණ ගුණතිලක සඳහන් කරන්නේ.
ඩිජිටල් තිරවලට ඇබ්බැහි කරන්නේ ශරීරයේ ඇති ඩොෆමින් (Dopamine) රසායනික සංයෝගය. මේ සංයෝගය වැඩිවීමෙන් සිත ප්‍රමෝදයට පත්වීමේ ප්‍රතිඵලයක් ලෙසයි සමාජ මාධ්‍ය කෙරෙහි දැඩි ඇබ්බැහිවීමක් ඇති වන්නේ. ඒ හේතුවෙන් පුද්ගල ප්‍රතිරූපය කිසියම් ලෙස තමාට සාපේක්ෂ ව සමාජ මාධ්‍යවල චරිත සමග සැසඳීම නිසා මානසික බිඳ වැටීමක් ද ඇති විය හැකි බවයි විශේෂඥ වෛද්‍යවරයා අවධාරණය කරන්නේ. ඔහු පවසන ආකාරයට විශේෂයෙන් රාත්‍රී කාලයට අන්තර්ජාල පහසුකම් (night time data package) වැඩි කිරීමෙන් ලැබෙන්නේ නින්ද නැති කිරීමට යම් උත්තේජනයක්. එවිට අමතර ආහාර ගැනීමට පෙළඹීමෙන් අහිතකර සෞඛ්‍යමය ගැටලු ඇති වන්නට පුළුවන්.

කොවිඩ් 19 වසංගතයත් සමග ඩිජිටල් තිර භාවිත නොකළ යුතු වයස් කාණ්ඩ පවා ඊට යොමු වුණා. ඩිජිටල් තිරවලට අප දීර්ඝකාලීන ව යොමු වන විට තාක්ෂණයත් සමග ඇබ්බැහිවන්නට පුළුවන්. එය මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වනවා හා සමානයි. තිරය ඉදිරියේ වැඩි කාලයක් රැඳීමෙන් සාමාජීය වශයෙන් පුද්ගලයන් එකිනෙකාගෙන් දුරස් වීමත් සිදුවනවා.



American Academy of Child And Adolescent Psychiatry (AACAP) විසින් සිදු කරන ලද සමීක්ෂණයකින් අනාවරණය වන්නේ වයස අවුරුදු 08-12ත් අතර දරුවන් දිනකට පැය 04-06ත් අතර තිර කාලයක් සහ යෞවනයන් පැය 09ක් දක්වා තිර කාලයක් ගත කරන බව. එලෙස තිර කාලයේ දීර්ඝ බව හේතුවෙන් පසුකාලීන ව ප්‍රචණ්ඩත්වය හෝ අවදානම් හැසිරීම්, අනාරක්ෂිත හැසිරීම් ඇති කරන බව සඳහන්. ඒ ඔස්සේ සයිබර් හිරිහැර කරන්නන්, දරුවා ඉලක්ක කරගත් වෙළෙඳ දැන්වීම්, නොමග යවන හෝ සාවද්‍ය තොරතුරුවලට දරුවන් නිරාවරණය වීමේ ඉඩකඩ ද වැඩි වන්නට පුළුවන්.

මෙවැනි පසුබිමක වර්තමානයේ පවතින පුද්ගල චර්යා වෙනස් කිරීම කළ යුත්තක්. අධ්‍යාපනික නොවන තිර කාලය සීමා කිරීම, සෞඛ්‍ය සම්පන්න පුරුදු සඳහා දිරිමත් කිරීම, පවුලේ ආහාර ගැනීම හා විනෝද චාරිකා අතරතුර සියලු ම ඩිජිටල් තිර අක්‍රිය කිරීම, දරුවන්ගේ කෝපය නැවැත්වීමට ඩිජිටල් මෙවලම් ලබා නොදීම, නින්දට අවම වශයෙන් පැයකට පෙර ඩිජිටල් තිර අක්‍රිය කර නිදන කාමරවලින් ඉවත් කිරීම, නිර්මාණශීලී ව සිතීමට දරුවන්ට අවකාශ සලසා දීම මෙහිදී ඉතා වැදගත්.

මේ නිසා ස්මාර්ට් යුගයක ලෝකය සොයන දරුවන් අතට ජංගම දුරකතනය ලබා දෙන්නේ නම් දෙවරක් ඒ පිළිබඳ සිතීම අත්‍යවශ්‍ය ම කාරණයක්. මෙහිදී ඉලක්කය විය යුත්තේ ඩිජිටල් තිරය ඉවත් කිරීම නොව තිර කාලය සහ විවේක වාර ගණන කළමනාකරණය කිරීම බව සිතට ගත යුත්තක්.



# මුල කපා ගස මැරීමේ ඊශ්‍රායල උපාය

**මොහාන් සමරනායක**

වසරක පමණ කාලයක සිට බටහිර ආසියාවේ (මැදපෙරදිග) ඇවිළ යමින් තිබෙන විනාශකාරී යුද්ධයේ තවත් උච්ච අවස්ථාවක් සලකුණු කරමින්, ඊශ්‍රායලය පසුගිය ඔක්තෝබර් 26 සෙනසුරාදා අලුයමේ ඉරානයට මහා පරිමාණ ප්‍රහාරයක් එල්ල කළා. ප්‍රහාරයේ ඉලක්ක ලෙස තෝරාගෙන තිබුණේ ඉරානය සතු මිලිටරි පහසුකම් සහ න්‍යෂ්ටික පහසුකම්. ඊශ්‍රායල් ප්‍රහාරය සිදු කළේ ඔක්තෝබර් 01 දින. ඒ, ඉරානය ඊශ්‍රායලයට කළ බැලිස්ටික් මිසයිල 180කට වැඩියෙන් උපයෝගි කරගනිමින් කළ ප්‍රහාරයට පිළිතුරු ලෙස. ඊශ්‍රායලය කියා සිටියා දිගින් දිගට ම ඉරානය කරන පසමිතුරුකම්, සතුරුකම්වලට පිළිතුරු දීමත් ප්‍රහාරයේ අරමුණක් බව. බොහෝ දෙනාගේ සැලකිල්ල යොමු වී තිබෙන්නේ ඉරානය නැවත වරක් ඊශ්‍රායලයට පිළිතුරු ප්‍රහාරයක් දෙනු ඇත්ද යන්න ගැන. එය සිදු විය හැකියි. මන්ද පහර නොදී සිටියහොත් එය ඉරානයේ අභිමානයට කැළලක් සහ තමන්ගේ මිත්‍ර පාර්ශ්ව පවා ඉරානය දුබල රටක් ලෙස සැලකීමට ඉඩ ඇති නිසා.

මැදපෙරදිග අර්බුදය 1948දී උපත ලබන්නේ පලස්තීන දේශයේ ඊශ්‍රායලය නමින් රාජ්‍යයක් ස්ථාපනය කිරීමත් සමග. එය වරින් වර උත්සන්න වෙමින් නැවත යටපත් වෙමින් ඉදිරියට යමින් තිබෙනවා. මේ ගැටුමේ ඍජු පාර්ශ්ව කිහිපයක් එළිපිට දකින්න පිළිවන්. නිසැක ව ම ඊශ්‍රායලය, පලස්තීනය, පලස්තීනයේ ගාසා තීරයේ සිට ක්‍රියාත්මක වන හමාස් සටන්කාමී සංවිධානය, ලෙබනනය මූලස්ථානය කොටගත් හිස්බුල්ලා සටන් සංවිධානය, යේමනයේ හූති සටන්කරුවන්, ඉරාකයේ සිට ක්‍රියාත්මක වන ඉස්ලාමීය සටන් කණ්ඩායම් ප්‍රධාන පාර්ශ්ව අතර දකින්න පිළිවන්. ඒ සමග ම මේ පාර්ශ්ව සඳහා විශේෂයෙන් ම හූති, හිස්බුල්ලා, හමාස් සටන්කරුවන්ට අරමුදල් හා ආයුධ සැපයීම, අවි පුහුණුව, තාක්ෂණය, බුද්ධි තොරතුරු සැපයීම සම්බන්ධයෙන් ඉරානයයි චෝදනා ලැබ තිබෙන්නේ. එය සනාථ කිරීමට සාක්ෂි තිබෙනවා. ඔවුන් ඉරානයේ සහය ලබන කණ්ඩායම්. ඒ නිසා ඉරානයත් නිසැක ව ම මේ ගැටුමේ පාර්ශ්වකරුවෙක්. මේ දීර්ඝකාලීන ගැටුමේ අලුත් අවස්ථාවක් උදා වනවා 2023 ඔක්තෝබර් 07 දින

මැදපෙරදිග අර්බුදය 1948දී උපත ලබන්නේ පලස්තීන දේශයේ ඊශ්‍රායලය නමින් රාජ්‍යයක් ස්ථාපනය කිරීමත් සමග. එය වරින් වර උත්සන්න වෙමින් නැවත යටපත් වෙමින් ඉදිරියට යමින් තිබෙනවා. මේ ගැටුමේ ඍජු පාර්ශ්ව කිහිපයක් එළිපිට දකින්න පිළිවන්.

උදේ කාලයේ ගාසා තීරයේ සිට ක්‍රියාත්මක වූ, හමාස් සටන්කරුවන් රොකට් 1000කට වැඩි සංඛ්‍යාවක් උපයෝගි කරගනිමින් දේශසීමාව හරහා ඊශ්‍රායලයට එල්ල කළ, බටහිර මාධ්‍ය හඳුන්වන විදිහට අනපේක්ෂිත, මවිතකර ප්‍රහාරය සමග. මේ ප්‍රහාරයේදී දහස් සංඛ්‍යාත පිරිසක් මිය ගියා. 200කට ආසන්න ඊශ්‍රායල් වැසියන් ප්‍රාණ ඇපකරුවන් ලෙස ගාසා තීරයට ගෙන ගියා. ඒ සමග ම ඊශ්‍රායලයේ ඉතා බියකරු දැවැන්ත ප්‍රතිප්‍රහාරය ආරම්භ වුණා. එය නතර වීමක් නැති ව ඉදිරියට යමින් තිබෙනවා තව තවත් පාර්ශ්ව ගැටුමට ඇදා ගනිමින්.

'හමාස්' යන්න ඉංග්‍රීසි භාෂාවෙන් හඳුන්වනවා 'Islamic Resistance Movement' ලෙස. එනම් 'ඉස්ලාමීය විරෝධතා ව්‍යාපාරය'. 'හමාස්' යන වචනය අරාබි භාෂාවෙන් අර්ථවත් වන්නේ 'අප්‍රතිහත ධෛර්යය' යන අදහසින්. හමාස් සංවිධානය උපත ලබන 1987දී පලස්තීනයේ ජනයා අතරින් පැනනගිනවා ඊශ්‍රායල් ආධිපත්‍යයට එරෙහි ව්‍යාපාරයක්. එය හැඳින්වෙන්නේ 'ඉන්ටිෆාඩා' නමින්. මේ ව්‍යාපාරයේ අවස්ථා දෙකක් තිබෙනවා. ඒ, ඉන්ටිෆාඩා 1 සහ ඉන්ටිෆාඩා 2 යනුවෙන්. ඉන්ටිෆාඩා 1ට මද කලකට පසුවයි හමාස් සංවිධානය උපත ලබන්නේ. එය බිහි කිරීමට නායකත්වය ගත්තේ ශේක් අහමඩ් යාසීන්. ඔහු බිහි කළ හමාස් සටන් ව්‍යාපාරය අද මැදපෙරදිග කලාපයේ මිලිටරි සහ දේශපාලන බලයක් බවට පත්

ව තිබෙනවා. ශේක් අහමඩ් යාසීන් මේ වසරේ මාර්තු 22 දින ඝාතනයට ලක්වුණා. ඔහු ආරම්භ කළ හමාස් ව්‍යාපාරයේ ප්‍රධාන අරමුණ වන්නේ පලස්තීන ජනයා සඳහා මැදපෙරදිග කලාපයේ මධ්‍යධරණී මුහුදේ සිට ඊශ්‍රායලයත් ඇතුළු භූමි භාගයක ස්වාධීන රාජ්‍යයක් ස්ථාපනය කිරීම. හමාස්වරු ඊශ්‍රායලයේ පැවැත්ම පිළිගන්නේ නැහැ. ඔවුන්ගේ එක් අධිෂ්ඨානයක් වන්නේ ඊශ්‍රායලය විනාශ කිරීම. මෙය කොයිතරම් ප්‍රායෝගික ද යන්න බලවත් ගැටලුවක්. මැදපෙරදිග ගැටුමේ ඇතැම් පාර්ශ්වකරුවන් කලක් ඉතා බලවත් තැනක සිටි ප්‍රධානම සටන් කණ්ඩායමක් වන පලස්තීන විමුක්ති සංවිධානය මුලදී 'ඊශ්‍රායලය විනාශ කළ යුතු ය' යන ස්ථාවරයේ සිටියත් පසුව එය වෙනස් කළා විශේෂයෙන් 1993දී ඔස්ලෝ සාම සම්මුතිය අත්සන් තැබීමෙන් පසු. නමුත් තවමත් හමාස්වරු ඊශ්‍රායලයේ පැවැත්ම පිළිගන්නේ නැහැ. ඔවුන් 1987දී බිහිවීමෙන් අනතුරු ව කෙමෙන් ඉරානයේ සහය ඇති ව බලවත් දේශපාලන සහ මිලිටරි බලයක් ලෙස වර්ධනය වන්නට පටන් ගත්තා. ඔවුන්ට වෙන ම මිලිටරි අංශයක් තිබෙනවා. එය හඳුන්වන්නේ 'ඉස් අල් ඩීන් අල් කොසම්' නමින්. මේ සටන් බලකායේ 25000ක් 30000ක් පමණ සිටින බවයි බටහිර මාධ්‍ය වාර්තාවලින් කියැවෙන්නේ. 2023 ඔක්තෝබර් 07 දින ඊශ්‍රායලයට කළ ඒ දැවැන්ත අනපේක්ෂිත බියකරු ප්‍රහාරය සැලසුම් කළේ හමාස් සංවිධානය. හමාස්වරු කෙමෙන් බලවත් ව 2006දී පලස්තීනයේ පැවැති මැතිවරණයට තරග කර, ගාසා තීරයේදී වැඩි ඡන්ද සංඛ්‍යාවක් හිමි කරගෙන, ඉන්පසු අවුරුද්දේ එනම් 2007දී ගාසා තීරයේ පාලනය ෆාටා සංවිධානය සමග ගැටුමකින් පසු තමන් අතට ගන්නවා. එදා සිට අද දක්වා ගාසා තීරය පාලනය කරන්නේ හමාස් කණ්ඩායම. ගාසා තීරය පලස්තීනයට අයත් කුඩා බිම්කඩක්. එහි පළල කිලෝමීටර් 10යි, දිග කිලෝමීටර් 41යි. මේ කුඩා බිම්කඩේ මිලියන 22ක ජනගහනයක් සිරවී සිටිනවා. එය ලෝකයේ වැඩි ම ජන ඝනත්වයක් සහිත ප්‍රදේශයක්. එහි සිටයි හමාස්වරු ඊශ්‍රායලයට වරින් වර ප්‍රහාර එල්ල කරන්නේ. ඝාතන සිදු කරන්නේ. ඊශ්‍රායලය තුන් වරක් පමණ හමාස්වරුන් සමග බියකරු යුද්ධයක යෙදුණා හමාස් සංවිධානය මුළුමනින් ම විනාශ කිරීමේ පරමාර්ථය ඇති ව. නමුත් එය තව ම සාර්ථක වී නැහැ. හමාස්වරු 2023 ඔක්තෝබර් 07 දින කළ ප්‍රහාරයෙන් පසුව ඊශ්‍රායලය ආරම්භ කළ ප්‍රතිප්‍රහාරයේදී සැලකිය යුතු පසුබෑමකට ලක්වී තිබෙනවා. ඔවුන්ගේ සටන් බලය දුබල වී තිබෙනවා. මෑත කාලයේදී ඔවුන්ගේ මුල් පෙළේ නායකයන් සහ මිතුරන් ගණනාවක් මරණයට පත්වී තිබෙනවා. එම ප්‍රධාන පෙළේ නායකයන් අතර කැපී පෙනෙනවා 2024 සැප්තැම්බර් 28 දින ඝාතනයට ලක්වුණු හමාස් සංවිධානයේ නායක හසන් නස්රල්ලා, ඔක්තෝබර් 17 දින ඝාතනයට ලක්වුණු හමාස් හිතවාදී හිස්බුල්ලා සංවිධානයේ මෙහෙයුම් මණ්ඩලයේ සභාපති යහියා සින්වාර්. ඊට පෙර 2024 ජූලි 31 දින හමාස් ව්‍යාපාරයේ මෙහෙයුම් මණ්ඩලයේ සභාපතිවරයා ඉස්මායිල් හානියේ ඉරානයේ ටෙහෙරාන් නුවර ගොඩනැගිල්ලක ආගන්තුක නිවාසයක සිටියදී ඊශ්‍රායල ප්‍රහාරයකට ලක් ව මරණයට පත්වෙනවා. මෙය ඉරානය බලවත් සේ කෝපයට පත් කළ කාරණයක්. මන්ද ඉරානයේ හදවතට ම පැමිණ තමන්ගේ සගයකු ඝාතනය කිරීම හේතුවෙන්.

මේ ඝාතන නිසා ඊශ්‍රායලය විශ්වාස කරනවා හමාස් සංවිධානයට ඉක්මනින් නැගී සිටින්නට නොහැකි වනු ඇතැයි කියා. ඊශ්‍රායලය මේ සටන ආරම්භ කළේ හමාස් ව්‍යාපාරය සමූල ඝාතනය කිරීමේ අරමුණෙන්. ආරම්භ කළ එම යුද මෙහෙයුමේදී මේ දක්වා ගාසා තීරයේ සිදු ව ඇති මරණ සංඛ්‍යාව පමණක් 44000ක්. එයින් අඩක් ම ස්ත්‍රීන් සහ ළමයින්. ඊශ්‍රායලය ප්‍රකාශ කරනවා හමාස් ව්‍යාපාරයට අයිති සටන්කරුවන් 17000ක් පමණ ඝාතනය කළ බව. නමුත් බටහිර මාධ්‍යවල ගණන් බැලීම අනුව නම් සටන්කරුවන් මියගොස් ඇත්තේ 8000ක් පමණ. ඊශ්‍රායල් ප්‍රහාර හමුවේ හමාස් ශක්තිය දුබල වී ඇතත් ධෛර්යය බොහෝ සෙයින් අඩාල වී ඇතත් හමාස් සංවිධානය මුළුමනින් අතුගා දමන්නට ඊශ්‍රායලයට තව ම හැකිවී නැහැ. එය කරන්නට හැකිවේ දැයි කියන්නටත් බැහැ, මින් පෙර ගත් එවැනි උත්සාහ අසාර්ථක වී තිබෙන නිසා.

දෙවැනි ලෝක යුද සමයේදී හිට්ලර්ගේ විසඳුමක් තිබුණා යුදෙව්වන් විනාශ කිරීමට. ඔහුගේ උපායමාර්ගික උපදේශකවරු එය හැඳින්වූයේ 'අවසන් විසඳුම' (The final Solution) ලෙස. ඒ තමයි සියලු යුදෙව්වන් ඝාතනය කිරීම. එවැනි පිළිවෙතක් තමයි දැන් ඊශ්‍රායලය අනුගමනය කරමින් සිටින්නේ, හමාස් සංවිධානය අරභයා. මේ සටන ඊශ්‍රායලය අපේක්ෂා කරන මට්ටමෙන් සාර්ථක වේද? යන්න අද බරපතළ සැකයක් වී තිබෙනවා. ඊශ්‍රායලයට සහය දක්වන බටහිර කඳවුරේ රාජ්‍ය පවා මේ සැකය එළිපිට ප්‍රකාශ කරන්නට පටන් අරන්. බටහිර රටවල් හමාස් සංවිධානය නම් කර තිබෙනවා, 'ත්‍රස්තවාදී ව්‍යාපාරයක්' ලෙස. ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, යුරෝපා සංගමය, කැනඩාව, ජපානය කවදත් ඊශ්‍රායලයට හිතවත් ඊශ්‍රායලයට ආධාර, අරමුදල්, ආයුධ සපයන රාජ්‍ය.

මැදපෙරදිග ගැටලුව සතුටුදායක ලෙස අවසාන සමථයකට පත්කිරීමට නම් ගැටලුවේ මුල තිබෙන ප්‍රශ්නය (න්‍යෂ්ටිය) ඉවත් කළ යුතුයි. එම ප්‍රශ්නයට විසඳුමක් සෙවිය යුතුයි. ඒ තමයි පලස්තීන ජනයාට ඔවුන්ගේ අහිමි වූ රාජ්‍යය ලබාදීම. එසේ නොකරන තාක්කල් මේ ගැටලුව නැවත නැවත උඩ යමින් යට යමින් දිගට ඇදෙන බවයි නිගමනය කළ යුත්තේ.

**කාංචනා සිරිවර්ධන**





# යුද්ධ ගැටුමක පෙර නිමිති ?

නිහාල් පීරිස්

යුක්රේන යුද්ධයත් ගාසා යුද්ධය නිසා නැගෙනහිර යුරෝපයේත් මැද පෙරදිගත් මේ වනවිට පවතින්නේ දැඩි අස්ථාවර, උණුසුම් තත්ත්වයක්. වැඩි කාලයක් නොගොස් ආසියානු කලාපයේත් මෙවැනි යුද ගැටුමක් ඇති වෙයි ද? මේ කලාපයේ ඇතැම් රටවල් අතර සිදු වෙමින් පවතින ඇතැම් කාරණා නිසා බොහෝ දෙනාට මෑත කාලයේ ඇති වෙමින් තිබෙන්නේ මෙවැනි සැකසංකා.

උතුරු කොරියාව සහ දකුණු කොරියාව අතර වර්ධනය වෙමින් ඇති ආතතිය ඊට උදහරණයක්. ඔවුන් අතර කාලයක සිට ගොඩ නැගෙමින් ඇති මේ ආතතිය වඩාත් උණුසුම් ලෙස පුපුරා ගිය අවස්ථාවක් මෙයට සති කිහිපයකට පෙර ද දැකගන්නට ලැබුණා. ඒ, උතුරු කොරියාවේ අගනුවර වන පියොංග්යැං නගරයට ඉහළින් දකුණු කොරියාව ඩ්‍රෝන යානයක් පියාසර කරවීමක් පිළිබඳ උතුරු කොරියාව චෝදනා කිරීමත් සමග. මේ ඩ්‍රෝන යානය උතුරු කොරියානු පාලනය විවේචනය කරන, අසත්‍ය තොරතුරු රැගත් ප්‍රචාරක පත්‍රිකා විසුරුවන ලද බවට ද උතුරු කොරියාව චෝදනා කළා.

උතුරු කොරියාව සහ දකුණු කොරියාව යනු දිගු කාලයක සිට ම එකිනෙකට පසමිතුරු රාජ්‍ය දෙකක් බව නොරහසක්. උතුරු කොරියාව සමාජවාදී කඳවුරේ රටක් ලෙස සැලකුණු අතර දකුණු කොරියාව බටහිර ධනවාදී රටවල් සමග මිත්‍ර සබඳතා පැවැත්වූ රටක් වුණා. අදටත් රුසියාව සහ චීනය සමග උතුරු කොරියාව සමීප සබඳතා පවත්වනවා. අනෙක් අතට දකුණු කොරියාව ක්‍රියා කරන්නේ ඇමරිකාව වැනි රටවල් සමග සමීප ව.

> උතුරු කොරියාව සහ දකුණු කොරියාව යා කරන මහා මාර්ග සහ දුම්රිය මාර්ග කිහිපයක තැන් කිහිපයක් පුපුරුවා හැරීමට උතුරු කොරියාව පියවර ගෙන තිබුණා. උතුරු කොරියානු නායක කිම් ජොං උන් ගේ සොහොයුරිය වන කිම් යෝ ජොං බරපතළ ප්‍රකාශයක් කරමින් පවසා තිබුණේ ඩ්‍රෝන යානා නැවත උතුරු කොරියාවට ඇතුළු වුවහොත් දකුණු කොරියාවට භයානක ප්‍රතිවිපාකවලට මුහුණදෙන්නට සිදුවනු ඇති බව.

1950 වසරේ දෙරට අතර ආරම්භ වූ කොරියානු යුද්ධය අවසන් වූයේ 1953 වසරේ වුවත් තවමත් මේ දෙරට සාම ගිවිසුමක් අත්සන් කර නොතිබීම විශේෂත්වයක්. මේ නිසා ඔවුන්ගේ යුද්ධය තවමත් නිල වශයෙන් අවසන් වී නැතැයි පවසන්නට පුළුවන්.

මෙවැනි පසුබිමක උතුරු කොරියාවත් දකුණු කොරියාවත් නිතර එකිනෙකා කෙරෙහි බියෙන්, සැකයෙන් පසුවන ආකාරයක් දක්නට ලැබෙනවා. මේ නිසා උතුරු කොරියාව දුන් කාලයක සිට ම ඉදිරියට ගෙන යමින් සිටින්නේ මිසයිල සහ න්‍යෂ්ටික අවි නිෂ්පාදන වැඩසටහනක්. දකුණු කොරියාව, ඇමරිකාව වැනි සිය මිත්‍ර පාර්ශ්ව සමග එක් ව හමුද අභ්‍යාස වැනි ක්‍රියාකාරකම්වල ද ඔවුන් නිරත වනවා.

ඩ්‍රෝන යානා පිළිබඳ සිද්ධියෙන් පසු උතුරු කොරියාව, දකුණු කොරියාවට තර්ජනාත්මක ආකාරයෙන් ප්‍රතිචාර දක්වා තිබෙනු දක්නට පුළුවන්. මෙවැනි

සිදුවීම් අවසානයේ අවි ගැටුමකින්, යුද ගැටුමකින් කෙළවර විය හැකි බවට එරට බලධාරීන් අනතුරු අඟවා තිබුණා. එපමණක් නොව ඕනෑ ම මොහොතක වෙඩි තැබීමට සූදානමින් සිටින ලෙස ද උතුරු කොරියාව සිය දේශසීමාවේ සිටින හමුදා සෙබළුන්ට දැනුම් දුන්නා.

දෙරට අතර ආතතියක් වර්ධනය වෙමින් තිබියදී ඔවුන් අතර යුද ගැටුමක් ඇති විය හැකි ද යන ප්‍රශ්නය සම්බන්ධයෙන් ද සංවාදයක් ඉදිරියට යමින් තිබෙනවා. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන බොහෝ විශ්ලේෂකයන්ගේ මතය වන්නේ එවැන්නක් සිදුවීමට ඇති ඉඩ අවම බව. මෙවැනි යුද්ධයකින් ඇති විය හැකි ආර්ථික බලපෑම් ආදිය ගැන මේ දෙරටට ම අවබෝධයක් ඇති බව ඔවුන් පෙන්වා දෙනවා..

දකුණු කොරියාව ද ඊට පිළිතුරු දෙමින් පවසා තිබුණේ තමන් ද ප්‍රතිචාර දැක්වීමට සූදානම් බව.

ඒ අතර උතුරු කොරියාව සහ දකුණු කොරියාව යා කරන මහා මාර්ග සහ දුම්රිය මාර්ග කිහිපයක තැන් කිහිපයක් පුපුරුවා හැරීමට උතුරු කොරියාව පියවර ගෙන තිබුණා. උතුරු කොරියානු නායක කිම් ජොං උන් ගේ සොහොයුරිය වන කිම් යෝ ජොං බරපතළ ප්‍රකාශයක් කරමින් පවසා තිබුණේ ඩ්‍රෝන යානා නැවත උතුරු කොරියාවට ඇතුළු වුවහොත් දකුණු කොරියාවට භයානක ප්‍රතිවිපාකවලට මුහුණදෙන්නට සිදුවනු ඇති බව. කිම් යෝ ජොං උතුරු කොරියානු දේශපාලනයේ සිටින ඉතා බලවත් චරිතයක්. කිම් ජොං උන් ගෙන් පසු ඇය එරට නායකත්වයට පත් විය හැකි බවට ද පසුගිය කාලයේ අදහස් පළ වුණා.

උතුරු කොරියානු අගනුවරට ඉහළින් ගමන් කළ ඩ්‍රෝන යානයක බව පැවසෙන ඡායාරූප කිහිපයක් ද උතුරු කොරියාව ප්‍රසිද්ධියට පත් කළා. එහෙත් ඇතැම් මාධ්‍ය සඳහන් කර තිබුණේ මේවායේ නිරවද්‍යතාව තහවුරු කර ගැනීමට තමන්ට හැකියාවක් නොමැති බව. උතුරු කොරියාව සහ දකුණු කොරියාව අතර ටික කලෙක සිට ආතතියක් වර්ධනය වෙමින් තිබුණත් එය මේ තරම් ඉහළ මට්ටමකට ළඟා වූයේ පළමු වරට බව දේශපාලන විශ්ලේෂකයන් පෙන්වා දෙනවා.

දකුණු කොරියාව විසින් උතුරු කොරියානු පාලනයට එරෙහි දේශපාලන ප්‍රචාරක පත්‍රිකා ගුවනින් හෙළනු ලැබීම කාලයක සිට ම සිදු වන්නක්. එහෙත් පසුගිය කාලයේ ඔවුන් මේ පත්‍රිකා හෙළන ලද්දේ





වායු පිර වූ බැලූන දේශසීමාව හරහා එවීමෙන්. මෙවැනි පත්‍රිකා හෙළීම සඳහා ඩ්‍රෝන යානා යොදගත් පළමු අවස්ථාව මෙය බව පෙනෙනවා. මේ ක්‍රියාකාරකම්වල නිරත වන්නේ දකුණු කොරියාවේ සිටින දේශපාලන ක්‍රියාකාරිකයන් බව විශ්වාස කෙරෙන්නක්.

එවැනි දේශපාලන ක්‍රියාකාරිකයන්ගේ සංවිධානයක ප්‍රධානියකු පවසා තිබුණේ උතුරු කොරියාව පවසන ඩ්‍රෝන යානා සිද්ධියට තමන්ගේ සම්බන්ධයක් නැති බව. ඉදිරියේදී මෙවැනි දේ නැවත සිදු වීම වැළැක්වීම සඳහා දකුණු කොරියාවේ නිලධාරීන් යම් පියවර ගෙන ඇති බවක් ද මාධ්‍ය වාර්තාවල දැක්වුණා. දෙරට අතර දේශසීමාවේ ඇතැම් ඉසව් අනතුරුදායක ඉසව් ලෙස නම් කිරීමට ඔවුන් ක්‍රියා කළා. ඒ, දේශසීමාව හරහා බැලූන, ඩ්‍රෝන යානා ආදිය පියාසර කරවීම වළක්වනු පිණිස.

උතුරු කොරියාවට යළිත් දකුණු කොරියානු ඩ්‍රෝන යානා ඇතුළු වුවහොත් කිසිදු පූර්ව අනතුරු ඇඟවීමකින් තොර ව ඊට එරෙහි ව පියවර ගන්නා බව උතුරු කොරියානු විදේශ අමාත්‍යාංශය පවසා ඇති බවක් ද විදෙස් මාධ්‍ය වාර්තා කර තිබුණා.

දේශ සීමාව හරහා බැලූන සහ ඩ්‍රෝන යානා යවන්නේ දකුණු කොරියාව පමණක් නොවන බව ද වාර්තා වෙනවා. උතුරු කොරියාව ද මේ ආකාරයෙන් සිය රටට බැලූන එවන බවට දකුණු කොරියාව ද චෝදනා කර තිබෙනවා. කැළිකසළ පිර වූ පොලිතින් මලු මේ බැලූන විසින් රැගෙන එනු ලබන බව ද ඔවුන් සඳහන් කරනවා. උතුරු කොරියාව පවසන්නේ තමන් මේ ආකාරයෙන් බැලූන යවන්නේ දකුණු කොරියාව තම රටට බැලූන එවීමට ප්‍රතිචාර වශයෙන් බව.

දෙරට අතර මේ ආකාරයෙන් ආතතියක් වර්ධනය වෙමින් තිබියදී ඔවුන් අතර යුද ගැටුමක් ඇති විය හැකි ද යන ප්‍රශ්නය සම්බන්ධයෙන් ද සංවාදයක් ඉදිරියට යමින් තිබෙනවා. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන බොහෝ විශ්ලේෂකයන්ගේ මතය වන්නේ එවැන්නක් සිදුවීමට ඇති ඉඩ අවම බව. මෙවැනි යුද්ධයකින් ඇති විය හැකි ආර්ථික බලපෑම් ආදිය ගැන මේ දෙරටට ම අවබෝධයක් ඇති බව ඔවුන් පෙන්වා දෙනවා.

# ජීවයේ සලකුණු හඹා යෑම

සුගත්ප්‍රිය කුලතුංග ආරච්චි

ඒදා මෙදාතුර මිනිස් අතින් නිමැවූ විශාලතම අභ්‍යවකාශ යානය බ්‍රහස්පති ග්‍රහයා දෙසට සිය දිගු දුර ගමන ඇරැඹුවා. ඒ, බ්‍රහස්පතිගේ 04 වැනි චන්ද්‍රයා 'යුරෝපා' (Europa) වෙත ළඟා වන්නට. එය මහපොළොවෙන් බැහැර ජීවය සොයා ගනිමින් මහා විශ්වයේ අප තවදුරටත් තනි වී නැති බව සනාථ කර ගන්නට ගිය ඉතිහාසගත ගමනක්. නාසා ආයතනය යැවූ මේ යෝධ යානය නම් කර ඇත්තේ 'යුරෝපා ක්ලිපර්' (Europa Clipper) ලෙස.

'යුරෝපා ක්ලිපර්' යනු බ්‍රහස්පතිගේ චන්ද්‍රයකු වන 'යුරෝපා' පිළිබඳ සවිස්තරාත්මක විද්‍යාත්මක පරීක්ෂණයක් පැවැත්වීම සඳහා ගිය පෘථිවියේ පළමු මෙහෙයුම. 2024 ඔක්තෝබර් 14 දින අභ්‍යවකාශ යානය ඈත අභ්‍යවකාශය කරා රැගෙන ගියේ, ලෝක ප්‍රකට සල්ලිකාරයා ඊලෝන් මස්ක්ට අයත් ස්පේස් එක්ස් ආයතනයේ ෆැල්කන් රොකට්ටුවක තුරුළේ හොවාගෙන. ෆ්ලොරිඩාවේ කෙනඩි අභ්‍යවකාශ මධ්‍යස්ථානයෙන් පිටත් වූ එයට තිබුණේ 'යුරෝපා' දක්වා වූ සැතපුම් බිලියන 1.8ක (කිලෝමීටර් බිලියන 2.9ක්) දුර එල්ලයක්. එහි ප්‍රධාන අරමුණක් වන්නේ 'යුරෝපා' චන්ද්‍රයා තුළ මිනිස් වාසයට සහය විය හැකි පරිසරයක් පවතී ද? යන්න සොයා බැලීම.



බ්‍රහස්පති II ලෙස ද හැඳින්වෙන 'යුරෝපා' චන්ද්‍රයා, බ්‍රහස්පති වටා කක්ෂගත වන විශාල ගැලීලියානු චන්ද්‍රයන් හතරෙන් කුඩා ම සඳ. එය බ්‍රහස්පති ග්‍රහයාගේ දන්නා චන්ද්‍රයන් 95න් ග්‍රහලෝකයට සමීපතම හයවැන්නා. එසේ ම එය සෞරග්‍රහ මණ්ඩලයේ ද විශාලතම චන්ද්‍රයන් අතර හය වැන්නා. වර්ෂ 1610 ජනවාරි 7, ගැලීලියෝ ගැලීලි සහ සයිමන් මාරියස් විසින් සොයා ගන්නා ලද මෙහි වයස අවුරුදු බිලියන 4.503ක්.

'යුරෝපා' මතුපිට තැනී ඇත්තේ ජල අයිස්වලින්. මේ නිසා එය අපගේ චන්ද්‍රයාට වඩා 5.5ක ගුණයක් හිරුඑළිය පරාවර්තනය කරන්නට සමත්. 'යුරෝපා' සැතපුම් 417,000ක් (කිලෝමීටර් 671,000) පමණ දුරින් බ්‍රහස්පති වටා කක්ෂගත වන අතර බ්‍රහස්පති පිහිටා ඇත්තේ සූර්යයා වටා සැතපුම් මිලියන 500ක් (කිලෝමීටර් මිලියන 780ක්) හෙවත් තාරකා විද්‍යාත්මක ඒකක 5.2 (AU)ක් ඈතින්. පෘථිවි චන්ද්‍රයාට වඩා තරමක් කුඩා යුරෝපා සඳෙහි විෂ්කම්භය සැතපුම් 1,940 (කිලෝමීටර් 3,100)ක්. 'යුරෝපා' මත එක් දිනක් පෘථිවි දින 3.5ක් වනවා.

මීට පෙර ගිය ගවේෂක යානා ලබා දුන් දත්තවලින් යුරෝපා සඳෙහි මිදුණු මතුපිටට යටින් කාබනික ද්‍රව්‍ය සහ ලවණ සරු පෘථිවියේ සියලු ම සාගරවල ජලය මෙන් දෙගුණයකට සමාන ජලකඳක් සහිත අභ්‍යන්තර සාගරයක් පැතිර ඇති බවට විද්‍යාඥයන්ට සාක්ෂි ලැබී තිබුණා. ඊට යටින් ම ඇත්තේ ඝන කඩතොලු ගිනිකඳු පර්වත පතුළක්. හබල් අභ්‍යවකාශ දුරේක්ෂයෙන් ලද ඡායාරූපවලින් පෙන්නුම් කළේ යුරෝපා සඳේ දක්ෂිණ ධ්‍රැවයෙන් ජලවාෂ්ප පිරි යෝධ දිය මල් ඉහළට විදින ආකාරය. ජේම්ස් වෙබ් අභ්‍යවකාශ දුරේක්ෂයෙන් තහවුරු කළේ 'යුරෝපා'හි අයිස් මතුපිට නිශ්චිත කලාපයක කාබන්ඩයොක්සයිඩ් පැතිර ඇති බව. ජීවයේ ප්‍රධාන සංරචකයක් වන ජලය සහ අත්‍යාවශ්‍ය නිසි රසායන මූලද්‍රව්‍ය දැනටමත් 'යුරෝපා'හි පැවතිය හැකි බවට තවත් විද්‍යාත්මක ඔත්තු සරු ව ලැබී තිබුණා. ඒ අනුව මේ වන විට පෘථිවියෙන් පිටත ජීවයේ වාසයට සුදුසු තත්ත්වයන් සෙවීම ඇරැඹීමට වඩාත් ම සුදුසු ම ස්ථානයක් ලෙස ඔවුන් දුටුවේ 'යුරෝපා' සඳ.

මේ සඳේ ඝන ශීත කබොල්ලට යටින් ජීවයේ වාසයට සුදුසු කලාප තිබේද යන්න තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය දත්ත රැස් කිරීමට යානය බ්‍රහස්පති වටා කක්ෂගත වී සඳට සමීප පියාසර කිරීම් වාර 45ක් සිදු කරන්නට නියමිත ව තිබෙනවා. මේ ගමන් වාර අතර යානය එහි දකුණේ දිය මල් හරහා පවා යනු ඇති. කෙසේ වෙතත් නාසා ආයතනය පවසන්නේ Europa Clipper යනු 'සඳ මත ජීවය හඳුනාගැනීමේ මෙහෙයුමක්' නොවන බව. මේ අභ්‍යවකාශ යානය උත්සාහ





කරන්නේ යුරෝපා සඳේ අයිස් කබොලට යටින් ජීවයේ පැවත්මට සහය විය හැකි ස්ථාන තිබේදැයි හඳුනා ගැනීමට. ඒ ඔස්සේ සූර්ය පවුලේ මෙන් ම විශ්වයේ ද අප තනි වී නැති බව සාක්ෂි සහිත ව ඒත්තු ගැන්වීමට.

යුරෝපා සඳෙහි අයිස් සහිත කවචයේ ඝනකම නිර්ණය සහ එය පහළින් ඇති සාගරය සමග අන්තර්ක්‍රියා කරන ආකාරයත් මුහුදේ සංයුතිය පරීක්ෂා කිරීම සහ එහි භූ විද්‍යාව ගුණාංගීකරණය කිරීමත් Europa Clipperහි අනෙක් මූලික විද්‍යාත්මක ඉලක්ක. ඒ අනුව පෘථිවි ගෝලයෙන් ඔබ්බට මිනිසාට වාසය කළ හැකි ලෝක තුළ තාරකා ජීව විද්‍යාත්මක විභව සොයා ගැනීම සඳහා යුරෝපා මංගල මෙහෙයුම සිදුකරන්නේ පරිසමාප්ත පරීක්ෂණයක්. එබැවින් Europa Clipper යනු පෘථිවිය හැර සාගර සහිත වෙනත් ලෝකයක් පිළිබඳ විමර්ශනය සඳහා ගිය මුල් ම නාසා අභ්‍යවකාශ යානය බවටත් ඉතිහාසගත වනවා.

නාසා ආයතනය Europa Clipper සමගින් ලොව මෙතෙක් තැනූ වඩාත් ම දියුණු විද්‍යා උපකරණ එකතුව ද යවා තිබෙනවා. යානයේ ක්‍රියාත්මක වන්නේ ඒ සඳහා ම වෙන් වූ විද්‍යාත්මක උපකරණ නවයක්. එහි සියලු ම ඇන්ටනා සහ සූර්ය පැනල අරාවන් ද සහිත ව අභ්‍යවකාශ යානය දළ වශයෙන් පළල අඩි 58 (මීටර් 17.6)ක් සහ දිගින් අඩි 100 (මීටර් 30.5)ක් පමණ වනවා. මේ නිසා යානයේ සමස්ත ප්‍රමාණය පැසිපන්දු පිටියකට වඩා විශාල බව සඳහන්. විවිධ පර්යේෂණ උපකරණ, ඉලෙක්ට්‍රොනික උපකරණ සහ අනෙකුත් උප පද්ධති බල ගැන්වීම සඳහා බ්‍රහස්පතිට සමීප ඇත දුරක සිටියදී ප්‍රමාණවත් තරම් හිරුඑළිය එක්රැස් කිරීම සඳහා මෙහි සූර්ය ආරා සැලකිය යුතු තරම් විශාල ව තනා තිබීමයි මෙයට හේතුව.

යෝධ යානයේ තවත් විශේෂයක් වන්නේ මිනිසා තැනූ මේ විශාල ම අභ්‍යවකාශ යානය එක් ජල ලෝකයකින් තවත් ජල ලෝකයකට සුබ පැතුම් ද රැගෙන යන පණිවුඩකරුවකු වීම. එයට හේතුව ලොව සෑම ජාතියක් ම නියෝජනය කරමින් පුද්ගලයන් මිලියන 2.6ක් විසින් නිර්මාණය කරන ලද 'බෝතලයක් තුළ පණිවිඩයක්' ලෙස හඳුන්වන එහි ඇති සටහන් පුවරුවක්. ඒවා ස්ටෙන්සිල් කර ඇත්තේ යානයේ ඉලෙක්ට්‍රොනික සුරක්ෂිතාගාරය වට කර සවි කර ඇති ටැන්ටලම් ලෝහ තහඩුවක. තහඩුව මත ප්‍රදර්ශනය කර තිබෙන තවත් අපූරු දෙයක් වන්නේ ලොව මිනිසුන් කතා කරන භාෂා 100කට වඩා වැඩි ගණනකින් 'ජලය' යන වචනය උච්චාරණය කරන ආකාරය දැක්වෙන තරංග ආකෘති සටහනක්. ඒ අතර මුල් තැන ලැබෙන්නේ සම්මානලාභී එක්සත් ජනපද කවියකු වන Ada Limónගේ කවියකට.

Europa Clipper එක්සත් ජනපදයේ සහ යුරෝපයේ ආයතනවල සහයෝගී නිෂ්පාදනයක්. වර්ෂ 1995, ගැලීලියෝ අභ්‍යවකාශ යානය බ්‍රහස්පති වටා කක්ෂගත වූ පළමු ගවේෂණ යානය. වර්ෂ 2016දී ගිය ජූනෝ යාත්‍රාවයි දෙවැන්න. යුරෝපීය අභ්‍යවකාශ ඒජන්සිය විසින් 2023 අප්‍රේල් මාසයේ දියත් කරන ලද Jupiter Icy Moons Explorer (Juice) තෙවැන්න. 'යුරෝපා ක්ලිපර්' හතර වැන්න.

මේ මෙහෙයුමට දැනට එක් ව ඇති පිරිස එක්සත් ජනපදයේ සහ යුරෝපයේ විද්‍යාඥයන් 220කට අධික සංඛ්‍යාවක් ඇතුළු ව කම්කරුවන් 1,000කට අධික සංඛ්‍යාවක්. 2015හි මෙහෙයුම ප්‍රථම වරට අනුමත වූ දා සිට Europa Clipper වෙත දායක වී තිබෙන කොන්ත්‍රාත්කරුවන් සහ උප කොන්ත්‍රාත්කරුවන්ගේ කණ්ඩායම් ඇතුළු සමස්තය, සැබැවින් ම 4,000කට වඩා වැඩි පිරිසක්.

එලෙස ම Europa Clipperගේ දිගු දුර ගමන වේගවත් කිරීම සඳහා මෙහෙයුම් නිර්මාණකරුවන් යොදා තිබෙන්නේ විශේෂ උපක්‍රමයක්. ඒ, අභ්‍යවකාශ යානය ග්‍රහ මණ්ඩලය තුළින් අඟහරු ග්‍රහයා ද පෘථිවිය ද පසුකර දිගු ගමනක් වටා යවමින් මේ ග්‍රහලෝකවල ගුරුත්වාකර්ෂණ බලය කැටපෝල විදිනයක් ලෙස භාවිත කිරීමෙන් තල්ලුවක් ලබාගැනීම. මේ අන්දමට අවුරුදු 5½කට වැඩි කාලයක් සැතපුම් බිලියන 1.8ක් (බිලියන 2.9ක්) ගමන් කිරීමෙන් පසු බ්‍රහස්පති ග්‍රහයා වටා කක්ෂයට ඇතුළු වීම සඳහා අභ්‍යවකාශ යානය එහි එන්ජින් පණ ගැන්වීමට නියමිත ව ඇත්තේ 2030 වසරේදී.



# ජීවිතයට ආදරය කරන්න

**නුවන් කුමාර කටුගම්පල**
**රංගිකා අබේසේකර**

ශ්‍රී ලංකාවේ පාසල් වියේ පසුවන දරුවන් සියදිවි නසා ගැනීම පිළිබඳ සාකච්ඡා පුළුල් වන කම්පන රැල්ලක් ඇතිවෙමින් තිබෙනවා. ලොවට ම ගැටලුවක් ව ඇති සියදිවි නසාගැනීම් පිළිබඳ කාරණයට විසඳුම් සෙවීමට වෛද්‍ය, උපදේශන, නීති, අධ්‍යාපන, ආරක්ෂක යනාදී ක්ෂේත්‍රවල වෘත්තිකයන් මෙන් ම ක්‍රියාකාරීන් සහ සමාජ විද්‍යාඥයන් ද වෙහෙසෙනවා. ලෝක සෞඛ්‍ය සංවිධානය, යුනිසෙෆ් වැනි ආයතනත් ස්වේච්ඡා සංවිධානත් ඊට දක්වන්නේ පුළුල් දායකත්වයක්. ඔවුන්ගේ පර්යේෂණ, ව්‍යාපෘති වාර්තා සහ දත්ත පාදක කර ගනිමින් මනෝවිද්‍යාත්මක, ජීවවිද්‍යාත්මක, සමාජවිද්‍යාත්මක සහ වෙනත් සාධක ඇසුරින් ඒ පිළිබඳ අවබෝධය සමාජගත කරවීමේ කාලීන අවශ්‍යතාව සඳහා යම් දායකත්වයක් දැක්වීමයි මෙවර දෙසතිය කවරයේ කතාවේ අපේක්ෂාව.

**කාල මරණ සහ අකාල මරණ යනුවෙන් මරණයක් සිදුවන අවස්ථා තිබෙන්නේ ආකාර දෙකක්. ඒ අතරින් කාල මරණ යනු නිසි වයස් සම්පූර්ණ ව ස්වාභාවික ව සිදුවන මරණ. ලෙඩරෝග සහ හදිසි අනතුරු යනාදිය හේතුවෙන් අනපේක්ෂිත අවස්ථාවල සිදුවන මරණ, ඝාතන සිදුවීම් නිසා සිදුවන මරණ සහ සියදිවි නසා ගැනීම් නිසා සිදුවන මරණ අකාල මරණ ලෙස ගැනෙනවා.**

කාල මරණ සහ අකාල මරණ යනුවෙන් මරණයක් සිදුවන අවස්ථා තිබෙන්නේ ආකාර දෙකක්. ඒ අතරින් කාල මරණ යනු නිසි වයස් සම්පූර්ණ ව ස්වාභාවික ව සිදුවන මරණ. ලෙඩරෝග සහ හදිසි අනතුරු යනාදිය හේතුවෙන් අනපේක්ෂිත අවස්ථාවල සිදුවන මරණ, ඝාතන සිදුවීම් නිසා සිදුවන මරණ සහ සියදිවි නසා ගැනීම් නිසා සිදුවන මරණ අකාල මරණ ලෙස ගැනෙනවා. මෙසේ සිදුවන අවස්ථා අනුව ආකාර දෙකකටත් සිදුවන විදිය අනුව සිව් ආකාරයකටත් මරණයක් සිදුවිය හැකි බව පෙන්වා දෙන්නේ මනෝ උපදේශකයන්. මේ අතරින් සිය දිවි නසාගැනීම යනු ජීවත් ව සිටින පුද්ගලයකු විසින් සිදුකළ හැකි බලවත් ම වැරැද්දක්.

## ලෝක තත්ත්වය

ලෝකයේ දළ වශයෙන් වසරකට 726,000කට අධික පිරිසක් සියදිවි නසා ගන්නා බව ලෝක සෞඛ්‍ය සංවිධානයේ දත්ත අනාවරණය කරනවා. සියදිවි නසාගැනීම් වැළැක්වීමේ දිනය ලෙස සෑම වසරක ම සැප්තැම්බර් 10 දින නම් කරනු ලැබ ඇත්තේ ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) සමග එක් ව සියදිවි නසාගැනීම් වැළැක්වීම සඳහා වූ ජාත්‍යන්තර සංගමය

(IASP) විසින්. සියදිවි නසා ගැනීම වැළැක්විය හැකි බවට ලෝක ජනතාව දැනුවත් කිරීමයි එහි අරමුණ.

2024-2026 ලෝක සියදිවි නසාගැනීම් වැළැක්වීමේ දිනය සඳහා ඔවුන් තේමාව කර ගන්නේ 'සියදිවි නසාගැනීම් පිළිබඳ ආඛ්‍යානය වෙනස් කිරීම (Changing the narrative on suicide)' යන්න. සියදිවි නසාගැනීම් සම්බන්ධ සම්මත වෙනස් කිරීමේ වැදගත්කම සහ සියදිවි නසාගැනීම් සංජානනය කරන ආකාරය පිළිබඳ දැනුවත් කිරීමයි මෙහි අපේක්ෂාව. එහිදී මානසික සෞඛ්‍යයට ප්‍රමුඛත්වය දෙන ප්‍රතිපත්ති සහ නීති සම්පාදනය කිරීම, රැකවරණය සඳහා ප්‍රවේශය වැඩි කිරීම සහ අවශ්‍යතා ඇති අය සඳහා සහය ලබා දීම එක් කාර්යයක්. සියදිවි නසාගැනීමේ සංකීර්ණතා වඩා හොඳින් අවබෝධ කර ගැනීම සඳහා පර්යේෂණවලට ආයෝජනය කිරීම වැනි තවත් කාර්ය ඊට ඇතුළත්.

## මානසික බලපෑම

දිගු කාලයක් යටි සිතේ තැන්පත් ව පවතින ස්වයංව විනාශය ළඟා කර ගැනීමට තිබෙන අපේක්ෂාව සිය දිවි නසා ගැනීමට කෙනකු තුළ බලය උත්පාදනය කරනවා. මනසේ එවැනි වෙනසක් සිදුවිය හැක්කේ කෙනකුගේ අභ්‍යන්තරයේ සිදුවන ප්‍රබල කම්පනයකින්. එවැනි කම්පනයකට බලපාන හේතු සාධක ගණනාවක් වනවා. ඒ අතර මූලික වන්නේ තමා සතු සියලු ම බලාපොරොත්තු සුන් වූ බව සිතීමත් තමාගෙන් කිසිවකුටවත් වැඩක් නැතැයි යන හැඟීමත් තමන්ගේ වටිනාකම නොවැටහීමත් නිසා ඇතිවන ඉච්ඡාභංගත්වය වැනි කාරණා නිසා හටගන්නා මානසික රෝගී තතත්ව තීව්‍ර වීම. එබඳු ව්‍යාධි නිසා අධික වන මානසික අවපීඩනය ඇතිකරන චිත්තවේගයි මිනිසා සියදිවි නසා ගැනීමට මෙහෙයවන්නේ.

ආතතිය (Stress), කාංසාව (Anxiety), හිස්ටීරියාව (Hysteria), භින්නෝන්මාදය (Schizophrenia), භීතිකාව (Phobia) සහ විෂාදය (Depression) වැනි රෝග හටගන්නට පෙර පුද්ගලයන් වෙතින් යම් යම් චර්යාත්මක වෙනස්කම්, ප්‍රකාශවල වෙනස්කම් සහ චින්තනමය වෙනස්කම් බාහිරට දිස්වන්නේ කැපී පෙනෙන ආකාරයෙන්. ආතතිය සමග බැඳී එන නොඉවසිලිමත්භාවය, නොසැලකිලිමත්භාවය, නුරුස්නාගතිය, හිසරදය, හදිසි කෝපය, ආවේග කළමනාකරණ දුර්වලතා, ආමාශගත රෝග, ලිංගික දුර්වලතා, ප්‍රතිශක්තිය අඩුවීම, රුධිර පීඩනය වැඩිවීම වැනි රෝග ලක්ෂණ එලෙස පෙන්නුම් කෙරෙනවා. මෙහි සඳහන් අනෙක් බොහෝ රෝගී තත්ත්වවල මූලික ලක්ෂණ ද බොහෝදුරට ඒවාට සමානයි. හිස්ටීරියා තත්ත්වයේදී වෛද්‍ය පරීක්ෂණවලට රෝග ලක්ෂණ ලෙස හසු නොවන හදිසි ශාරීරික අකර්මන්‍යතා, ඇස් පෙනීම දුර්වල වීම, කතා කිරීමට නොහැකි වීම වැනි අසාමාන්‍යතා හටගන්නවා. කාංසාව ඇකි අයකු පෙන්වන්නේ නොසන්සුන් බව, තැති ගැන්ම, කණස්සල්ල, බියසුළු ස්වභාවය, සමබරතාව ගිළිහීම, සන්ත්‍රාසය, අධික දහදිය ගැලීම, හිරිය, කරකැවිල්ල,



**2024-2026 ලෝක සියදිවි නසාගැනීම් වැළැක්වීමේ දිනය සඳහා ඔවුන් තේමාව කර ගන්නේ 'සියදිවි නසාගැනීම් පිළිබඳ ආඛ්‍යානය වෙනස් කිරීම (Changing the narrative on suicide)' යන්න. සියදිවි නසාගැනීම් සම්බන්ධ සම්මත වෙනස් කිරීමේ වැදගත්කම සහ සියදිවි නසාගැනීම් සංජානනය කරන ආකාරය පිළිබඳ දැනුවත් කිරීමයි මෙහි අපේක්ෂාව.**

හුස්ම හිරවීම, හෘදයස්පන්දනය වැඩිවීම වැනි ලක්ෂණ. උදාසීනත්වය, අමතකවීම, අධි හෝ ඌන ක්‍රියාකාරීත්වය, ගුප්ත හැසිරීම් පෙන්වීම, කතාබහේ දුර්වලතා, ශරීරයේ සංවේදීභාවය අඩු වීම සහ අංශභාගය වැනි තත්ත්වවලට ගොදුරු වීම හිස්ටීරියා රෝගයේදී පෙන්වන ලක්ෂණ. භීතිකාවෙන් පෙළෙන අය දක්වන්නේ අසාමාන්‍ය සබකෝලය, අහේතුක ව දක්වන අධික බියසුළු බව, අවස්ථා මගහැර පලා යාම, සමාජ ආශ්‍රයෙන් මිදීම, පිරිස් සමූහයා අතරේදී දහදිය



**සියදිවි නසාගැනීමේ හැසිරීම් සඳහා බලපාන ජීව විද්‍යාත්මක සාධක අතරට ස්නායු සම්ප්‍රේෂක අසමතුලිතතාව (Neurotransmitter Imbalance), ජානමය සාධක, ආතති ප්‍රතිචාරය (Hypothalamic Pituitary Adrenal), ප්‍රදාහය (Inflammation), මොළයේ ව්‍යුහය යනාදිය අයත්. ජාත්‍යන්තර වෛද්‍ය පර්යේෂණ ආයතන සහ විශ්වවිද්‍යාල සිදු කළ අධ්‍යයනවලින් පෙන්වා දී ඇති ආකාරයට ස්නායු සම්ප්‍රේෂක පද්ධතිවල අසාමාන්‍යතා, විශේෂයෙන් සෙරොටොනින් රසායනිකය (Serotonin) සියදිවි නසාගැනීමේ සිතිවිලි සහ හැසිරීම්වලට දායක වනවා.**

දැමීම, වෙව්ලීම, මුහුණ රතු වීම, බඩ දැවිල්ල, නිතර වැසිකිළි යාමේ අවශ්‍යතා ඇතිවීම, මාංශ පේෂි තද වීම, කරකැවිල්ල, ඔක්කාරය වැනි සංකූලතා සහ හැසිරීම් ලක්ෂණ. කාන්තාවකට නම් කන්‍යාභාවය අහිමිවීම වැනි සමාජ සංස්කෘතික වශයෙන් ආචාරධර්මීය ව සහ හරපද්ධතිමය ලෙස දැඩි ව ප්‍රශ්න කරන ජීවවිද්‍යාත්මක කාරණා ද දිවි නසා ගැනීමට හේතුකාරක වන අවස්ථා බහුලයි.

සියදිවි නසාගැනීමේ හැසිරීම් සඳහා බලපාන ජීව විද්‍යාත්මක සාධක අතරට ස්නායු සම්ප්‍රේෂක අසමතුලිතතාව (Neurotransmitter Imbalance), ජානමය සාධක, ආතති ප්‍රතිචාරය (Hypothalamic Pituitary Adrenal), ප්‍රදාහය (Inflammation), මොළයේ ව්‍යුහය යනාදිය අයත්. ජාත්‍යන්තර වෛද්‍ය පර්යේෂණ ආයතන සහ විශ්වවිද්‍යාල සිදු කළ අධ්‍යයනවලින් පෙන්වා දී ඇති ආකාරයට ස්නායු සම්ප්‍රේෂක පද්ධතිවල අසාමාන්‍යතා, විශේෂයෙන් සෙරොටොනින් රසායනිකය (Serotonin) සියදිවි නසාගැනීමේ සිතිවිලි සහ හැසිරීම්වලට දායක වනවා. මනෝභාව හැසිරවීම සම්බන්ධ රසායනික ද්‍රව්‍යයක් වන සෙරොටොනින් අඩුවීම සියදිවි නසාගත් සහ සියදිවි නසාගැනීමට උත්සාහ කළ පුද්ගලයන්ගේ වැඩි වශයෙන් දක්නට ලැබෙන බව පර්යේෂකයන් සඳහන් කරනවා. මේ රසායනික අසමතුලිතතාව මානසික අවපීඩනය, ආවේගශීලීත්වය සහ දුර්වල චිත්තවේගී හැසිරීම්වලට හේතු වන්නක්.

මානසික රෝග හෝ සියදිවි නසාගැනීම පිළිබඳ පවුල් ඉතිහාසයක් ඇති අයගේ ද සියදිවි නසාගැනීමේ හැඟීම් ඇති වීමේ යම්කිසි අවදානමක් තිබෙනවා. විශේෂයෙන් මනෝභාව හැසිරවීම සහ ආතතියට අදාළ විශේෂ ජාන විකෘතිතා ඔවුන්ට ඇති වී තිබෙන්නට පුළුවන්. හයිපොතලමික් (Hypothalamic), පිටියුටරි (Pituitary), අධි වෘක්ක (Adrenal) ග්‍රන්ථි ශරීරයේ ප්‍රතිචාර පාලනය කරනවා. මේ පද්ධතියේ අක්‍රමිකතා උත්සන්න වීමෙන් පෙර සාකච්ඡා කළ බොහෝ මානසික රෝග ලක්ෂණ දිස්වන්නට පුළුවන්. මේ සියල්ල සියදිවි නසාගැනීමේ අවදානම වර්ධනය කරන්නේ නිධන්ගත ආතති තත්ත්වය ඇතිකරමින්.

මේ තත්ත්ව සියදිවි නසා ගැනීමක් දක්වා ප්‍රබල නොවී පහසුවෙන් සුව කර ගත හැකි වුවත් ඒවා නොසලකා හැර සිටීමෙන් සිදුවන්නේ ජීවිතය එපා වීම දක්වා තත්ත්වය උග්‍ර වීම. සියදිවි නසා ගැනීම සඳහා ප්‍රබල ව ම පාදක වන රෝගයක් විෂාදය. විෂාදයේ ලක්ෂණ වන්නේ නිරන්තරයෙන් ම කල්පනා කිරීම, කණස්සලු බව, නිතර කනගාටුවෙන් පසුවීම, අධික වෙහෙස, ශාරීරික අප්‍රාණිකත්වය, අවධානය ගිලිහී යාම, ලිංගික ක්‍රියාකාරකම් හීන වීම, ආහාර අරුචිය, බර අඩු වීම, නින්ද නොයාම, අසුබවාදී ව සිතීම, දැකීම සහ කතා කිරීම, හැඬුම්බර වීම, දිවි තොර කර ගැනීමේ අදහස් පහළ වීම යනාදිය. ස්නායු පද්ධතියට සිදුවන හානි නිසා මොළයේ ක්‍රියාකාරිත්වය මෙන් ම රුධිර සංසරණයේ අක්‍රමිකතා ද ඇතිවනවා. ඒ හේතුකොටගෙන හටගන්නා ඉන්ද්‍රිය

මූලික රෝග සහ මතක ශක්තිය දුර්වල වීම යනාදිය නිසා ද පුද්ගලයකු සියදිවි නසා ගන්නට පුළුවන්. ශ්‍රී ලංකාවේ විශේෂයෙන් ගැමි ජනයා අතර පවතින හදි හූනියම් වැනි ගුප්තවිද්‍යා පිළිබඳ දැඩි විශ්වාසය හේතුවෙන් ජීවිතය සහ තමා පිළිබඳ මෙන් ම අනුන් පිළිබඳ අවිශ්වාසය, සැකය සහ බිය හටගැනීම නිසා ද කෙනකුට ජීවිතය එපා වන්නට පුළුවන්.

## යෞවනය සහ තාරුණ්‍යය

සමාජ වාතාවරණවලට අනුවර්තනය වීමේ දුර්වලතා වයස අවුරුදු 15-29 පමණ වන නව යොවුන් සහ තරුණ වියේ දරුවන්ට පවතින ගැටලුවක්. බොහෝ විට ඊට බලපානු ලබන්නේ දරුවන් කුඩා කලදී නිසි සමාජානුයෝජනය නොවීම. එසේ ම ඔවුන්ට යහපත් සමාජ ජීවිතයක් (Successful Community life) නැතිකම සහ ශක්තිමත් පුද්ගලික ජීවිතයක් (Successful inner personal life) නිර්මාණය වී නොතිබීම ද ඊට මුල්වනවා. මේ පිළිබඳ ඍජු වගකීම දෙමව්පියන්ට සහ භාරකරුවන්ට පැවරෙන්නක්. සමාජීය ඇවතුම් පැවතුම්, අන්තර් පුද්ගල සහසම්බන්ධතා, සමවයස් කණ්ඩායම් සමග හැසිරීම, රටේ සම්මත නීතිරීති, සංස්කෘතිකමය කාරණා, ස්වයං අවබෝධය, විවිධ පුද්ගල චර්යා වටහා ගැනීම, ගැටුම් නිරාකරණය, ජය පරාජය සම ව භාරගැනීම, පළි නොගැනීමේ චේතනාව, නූතන ලෝක තත්ත්ව ගැන අවබෝධය, සමාජ සංකීර්ණභාවය වටහා ගැනීම වැනි පුද්ගල සංවර්ධන අවශ්‍යතා දරුවකුට නොසපිරෙන්නේ සමාජානුයෝජන ක්‍රියාවලිය නිසි පරිදි සිදු නොවීම සහ අධ්‍යාපනය අඩාල වීමෙන්. ඔවුන්ට නැත්තේ ප්‍රශ්න හමුවේ ඔරොත්තු දීමේ හැකියාව. එවිට ඉතා සරල ප්‍රශ්නවලින් පවා සිත් තැවුලට පත් ව මානසික ව බිඳවැටීම නිසා සිදුවන ප්‍රබල පෞරුෂ හානිය හේතුවෙන් සිය දිවිනසාගැනීම වැනි භයානක වැරදි විසඳුම්වලට එළැඹෙනවා.

පෞරුෂ ගැටලු මතුවිය හැකි වෙනත් අවස්ථා ද තිබෙනවා. කුඩා කල සිට ම පවුලේ සහ ඉන් බාහිර ව විවිධ තාඩන පීඩන, හිංසන සහ අපයෝජන යනාදී අමිහිරි අත්දැකීම්වලට මුහුණපෑම, අසම්මත චර්යාවල සහ අපචාර ක්‍රියාවල



**සමාජ වාතාවරණවලට අනුවර්තනය වීමේ දුර්වලතා වයස අවුරුදු 15-29 පමණ වන නව යොවුන් සහ තරුණ වියේ දරුවන්ට පවතින ගැටලුවක්. බොහෝ විට ඊට බලපානු ලබන්නේ දරුවන් කුඩා කලදී නිසි සමාජානුයෝජනය නොවීම. එසේ ම ඔවුන්ට යහපත් සමාජ ජීවිතයක් (Successful Community life) නැතිකම සහ ශක්තිමත් පුද්ගලික ජීවිතයක් (Successful inner personal life) නිර්මාණය වී නොතිබීම ද ඊට මුල්වනවා.**

ගොදුරු බවට පත් ව සමාජයේ උදහසට, ප්‍රතික්ෂේපවීමට සහ දෝෂාරෝපණයට ලක්වීම, පවුල් කඩාකප්පල් වීම නිසා සමාජයේ අවතැන් ව පිළිසරණක් නොමැති තත්ත්වයට පත්වීම, ළමා කාලයේදී ලැබිය යුතු ආදරය, පිළිගැනීම, ආත්මාභිමානය, ගෞරවය පෞද්ගලිකවත් සමාජීයවත් අහිමි වීම, පවුලේ ආර්ථික ප්‍රශ්න නිසා මූලික මිනිස් අවශ්‍යතාවත් සම්පූර්ණ කර ගත නොහැකි වීම, මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වී දරාගත නොහැකි (Sick) තත්ත්වයට පත්වීම, පවුලේ අන් අයගේ අදහස් නොතකා මව්වරුන් සහ බිරින්දෑවරුන් ගෘහසේවය වැනි රැකියාවලට විදේශගත වී අන් අය නිවෙස් තුළ හුදෙකලා වීම, විවාහක පුද්ගලයන් අනියම් සම්බන්ධතා පැවැත්වීම, දෑවැදි ප්‍රශ්න, වැන්දඹු ප්‍රශ්න, මුදල් ගනුදෙනු සහ දේපොළ උරුම සම්බන්ධ මතභේද සහ තරහ මරහ දුරදිග යාම නිසා ඇතිවන වෛරය, වේදනාව වැනි හැඟීම් වර්ධනය වීම, යුද්ධවලදී සතුරාට හසුවීමට වඩා සිය දිවිනසා ගැනීම අභිමානයක්යැයි සිතීම, යුද්ධය වැනි යම් නිශ්චිත අරමුණු උදෙසා මරාගෙන මැරීමට ලැබෙන පුහුණුව අනුව සියදිවි නසා ගැනීම, එය පරිත්‍යාගයක් හෝ වීරක්‍රියාවක් ලෙස අර්ථකථනය සහ ඒවා විශ්වාස කිරීම, මාධ්‍ය ප්‍රචාරණවලින් හෝ සියදිවි නසා ගන්නා අවස්ථා පුද්ගලික ව නිරීක්ෂණය කිරීමෙන් එවැන්නකට උත්තේජනයක් සහ පෙළඹීමක් ඇති වීම යනාදිය ඊට අයත්.

ශ්‍රී ලංකාවේ සියදිවි නසාගැනීම් සහ ස්වයං හානිය සැලකිය යුතු මහජන සෞඛ්‍ය ගැටලුවක්. 1997 සිට ශ්‍රී ලංකාව සියදිවි නසාගැනීම්වල සැලකිය යුතු අඩුවීමක් අත්කර ගෙන ඇතත් අඛණ්ඩ ව වාර්තා වන සියදිවි නසාගැනීම් ගෝලීය සාමාන්‍යයට වඩා ඉහළ අගයක් ගන්නවා. ජාතික පොලිස් සංඛ්‍යාලේඛන මත පදනම් ව 2022 වසරේදී ශ්‍රී ලංකාවේ සියදිවි නසාගැනීම් අනුපාතය පුරුෂ 100000:27ක්, ස්ත්‍රී 100000:05ක් සහ සමස්ත සියදිවි නසාගැනීම් අනුපාතය 100000:15ක් වනවා.

මේ අතරට යොවුන් වියේ සහ තරුණ වියේ පසුවන දරුවන්ගේ සියදිවි නසාගැනීමේ ඉහළ අගය ද ඇතුළත්.

**දරුවන්ගේ හැසිරීම් රටාවේ ක්ෂණික ව ඇතිවන පැහැදිලි වෙනස්කම් හඳුනාගැනීමට දෙමව්පියන්, පවුලේ වැඩිහිටියන්, ගුරුවරුන්, ආගමික සහ සමාජීය නායකයන් යනාදී පාර්ශ්වවලට පුහුණුව ලබාදීමෙන් දරුවන්ට ආදරණීය ව සැලකීම සහ පිළිගැනීම ලබාදීමෙන් ද එවැනි හානි වළක්වා ගැනීම පහසු වනවා.**

මානසික වශයෙන් දරුවන් දුර්වල වන අවස්ථා හඳුනා ගැනීමට සමාජය දැනුමෙන් සන්නද්ධ නොවීම මේ ප්‍රවණතාවට බලපාන මූලික ම කාරණයක්. ඔවුන් සියතින් තමන්ට හානි කර ගන්නට පෙළඹීම පිටුපස ඇති සංවේදී කාරණා මෙනවාදැයි සමාජය දැන හඳුනාගත යුතු වනවා.

විශේෂයෙන් ම ආදරය, විවාහය සහ ලිංගිකත්වය වැනි දේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පවතින සංස්කෘතික, සමාජීය සහ ප්‍රතිපත්තිමය දැඩි බව, විවිධ කාලීන නොවන විශ්වාස, පිළිගැනීම්, අභිචාර විධි, සිරිත්විරිත්, සහ වැඩිහිටි පරපුරේ පවත්නා ගතානුගතික ආකල්ප යනාදිය බලපෑමෙන් ඔවුන්ගේ නිදහස සීමා වනවා. වධබන්ධනවලට ලක්වනවා. එවැනි දේ ඉවසා දරා ගත නොහැකි වීම නිසා තමාගෙන් පළි ගැනීම වැනි දරුණු තීරණ ගැනීමට දරුවන් පෙළඹෙනවා.

ප්‍රේමය බිඳවැටීම්, ලිංගික ඊර්ෂ්‍යාව, අත්කර ගැනීමට අපොහොසත් වීම, වැනි හේතු නිසා ඇතිවන මානසික ව්‍යාකූලත්වය පාදක ව බහුල සියදිවි නසාගැනීම් සංඛ්‍යාවක් වාර්තා වුවත් ඊට ප්‍රබල ව බලපාන සාධක තව බොහෝ තිබෙනවා. ආර්ථික, රැකීරක්ෂා, අධ්‍යාපන (විභාග අසමත්වීම් වැනි), නව සමාජ මාධ්‍ය සහ ඩිජිටල් තාක්ෂණ විප්ලවයේ ප්‍රතිඵල ලෙස පැමිණෙන සියදිවි නසා ගැනීමෙන් අවසන් වන ආකාරයේ අන්තර්ජාල පරිගණක ක්‍රීඩාවලට ඇබ්බැහි වීම, ගුරුවරුන්ගේ සහ වෙනත් හිතවත් වැඩිහිටියන්ගේ අවවාද අනුශාසනා පිළිනොගැනීමේ අකීකරු අභිමානයක් ඇතැම් දරුවන්ගේ සිත්වල හට ගැනීම. දරුවන්ගේ ආකල්ප සංවර්ධනයට සහ ඔවුන් තුළ සහකම්පනය ඇතිකිරීමට රටේ වගකිවයුතු අංශ දක්වන අවධානය ප්‍රමාණාත්මක නොවීම, සමාජයේ මානුෂීය සබඳතා, ගුරු-ශිෂ්‍ය සම්බන්ධතා දුරස් වීම සහ විෂයමාලා ආවරණයට පමණක් පාසලේ පන්ති කාමරය සීමා වීම, ආගම, ක්‍රීඩාව, සාහිත්‍ය, කලාව වැනි ප්‍රායෝගික ක්‍රියාකාරකම් පාදක විෂය ක්ෂේත්‍ර සහ සෞන්දර්යාත්මක භාවිතාවන්ගෙන් ඈත් ව දැනුම සෙවීම අධ්‍යාපනයේ මූලික කාර්යය බවට පත්වීම යනාදිය ඒ අතර වනවා. තමා මුහුණදෙන ප්‍රශ්නයට වඩා බරපතළ ප්‍රශ්නවලට අනෙක් අය මුහුණදෙන බව නොසිතා ක්‍රියා කිරීම සහ තමා මුහුණදෙන්නේ ලෝකයේ තිබෙන බැරෑරුම්ම ප්‍රශ්නයටය යනාදී වශයෙන් වන හුදෙකලා පීඩිත මානසිකත්වය දරුවන් තුළ ඇති වීම ද ඊට හේතු. යම් කරදරයකට, වරදකට හෝ පරාජයකට මුහුණපෑ දරුවන් සමාජය සැමදා කොන් කර තැබීම, දිගින් දිගට ම පරිභව කිරීම, උසුළුවිසුළු කිරීම, ඔවුන් හිරිහැරයට සහ කරදරයට පත්කිරීම වැනි හේතු නිසා ද යමකුට ජීවිතය එපා වීමට පුළුවන්. අපචාර, අපයෝජන, ගෘහස්ථ හා සමාජ හිංසනවලට ගොදුරු වීම, දූෂණයට ලක්වීම, පාතාල සහ මැර කණ්ඩායම්වල ක්‍රියාකාරකම් සඳහා පෙළඹීම යනාදිය නිසා ළමයින් දරුණු වීමත් අනාථ අසරණභාවයට පත්වීමත් ඔවුන්ට සාමාන්‍ය පුද්ගලයන් ගෙවන සමාජ ජීවිතය ගත කිරීමට නොහැකි වීමත් නිසා ද ජීවිතය කලකිරෙනවා.

තවත් විශේෂිත කාරණයක් වන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හෝ ලිංගික දිශානතිය ගවේෂණය කරන හෝ ඒ සඳහා අරගල කරන යෞවනයන් බොහෝ විට සියදිවි නසාගැනීමේ අවදානම වැඩි පිරිසක් ලෙස හඳුනාගෙන තිබීම. ඒ, ඔවුන් සමාජ අපකීර්තියට, වෙනස් කොට සැලකීම්වලට, ප්‍රතික්ෂේප කිරීම්වලට මුහුණපෑම හේතුවෙන්.

**මානසික සෞඛ්‍ය ප්‍රතිකාර සඳහා ප්‍රවේශ වීමට, මානසික අවපීඩනය සහ කාංසාව වැනි මානසික සෞඛ්‍ය තත්ත්වයන් කළමනාකරණය කිරීමට ඖෂධ සහ චිකිත්සාව උපකාරී වනවා. සංජානන චර්යා චිකිත්සාව (Cognitive behavioral therapy) සහ අපෝහක හැසිරීම් ප්‍රතිකාරය (Dialectical behavior therapy) සියදිවි නසාගැනීම පිළිබඳ සිතිවිලි අඩුකිරීමට සමත් සාර්ථක චිකිත්සක ක්‍රම බව වෛද්‍ය විද්‍යාත්මක ව තහවුරු කර තිබෙනවා. ආතති කළමනාකරණ සහ ගැටලු විසඳීමේ ශිල්පීය ක්‍රම ඉගැන්වීමත් අයිතිවාසිකම් පිළිබඳ හැඟීම් ඇති කිරීමත් ඊට උපකාරී වන පියවර.**

සියදිවි නසාගැනීමේ ප්‍රවණතා ඇති ඇතැම් යෞවනයන්ගේ මොළයේ ව්‍යුහාත්මක ක්‍රියාකාරී වෙනස්කම් පෙන්නුම් කරනවා. ඒ, තීරණ ගැනීම, ආවේග පාලනය, චිත්තවේග හැසිරවීම වැනි අවස්ථාවලදී. මෙහිදී මොළයට ඇති වන බලපෑම නිසා යෞවනයන් ආතතියට සහ චිත්තවේග අක්‍රමිකතාවලට ගොදුරුවීමට ඇත්තේ වැඩි ඉඩක්.

වැඩිහිටියන් ළමයින්ට සවන් නොදීම මෙන් ම කිසිවකු එතරම් මායිම් නොකරන ළමයින් වැඩිහිටියන්ට සවන් දීමෙන් ඈත් වීම ද සැලකිය යුතු ප්‍රශ්නයක්.

මේ සම්බන්ධය ගිලිහී යාම සහ ඔවුන් දෙපාර්ශ්වය ම තාක්ෂණයේ වහලුන් බවට පත්වීම නිසා ළමයා ළමයාගේ ලෝකයේත් වැඩිහිටියා වැඩිහිටියාගේ ලෝකයෙත් හුදෙකලා වීම මෙබඳු තත්ත්වයක් ඇතිවීම කෙරෙහි පුළුල් ව බලපා තිබෙනවා.

දැඩි සොම්නස, දැඩි දොම්නස, බිය, කෝපය, ක්ෂණිකාවේගය, ඊර්ෂ්‍යාව, පළිගැනීමේ චේතනාව, දුක, වියෝව, පසුතැවීම, තනිකම, ලැජ්ජාව, විරහව, හීනමානය, පරාජිත බව, ශාරීරික බෙලහීනතාව, ලෙඩ රෝග නිසා ඇතිවන ඉසිලිය නොහැකි වේදනාව, අහිමිවීම වැනි හැඟීම් සහ මානසික ව්‍යාකූලතා හටගැනීම කෙරෙහි දැඩි බලපෑමක් සිදු කරනවා. එක් එක් පුද්ගලයන්ගේ අඩු වැඩි වශයෙන් පවතින මේ චිත්ත ස්වභාව තේරුම් ගැනීමට අනෙක් අය අසමත්. ඔවුන්ට ඒ ගැන තැකීමක් නැහැ. එවැනි තත්ත්ව අවබෝධ කරගත හැකි අය ද ඒ බව ගැටලුවට මුහුණපා ඇති පුද්ගලයාගේ භාරකරුවන්ට හෝ අදාළ වගකිවයුතු පාර්ශ්ව වෙත ප්‍රකාශ කර ඊට පිළියම් යෙදීමට ඉදිරිපත් වන්නේ නැහැ. ඒ නිසා අවසානයේ බොහෝ කිට්ටුවන්තයන් සියදිවි නසාගෙන කනගාටුදායක ලෙස ජීවිතයෙන් සමුගන්නා අවස්ථා අත්දකින්නට ජීවත් ව සිටින අයට සිදු වනවා. සියදිවි නසා ගැනීම් පිටුපස තිබන ඊට ආබද්ධ අනෙක් ප්‍රමුඛ බේදවාචකය එය.

## පිළියම්

පාසල් කාලය ඉක්ම යන්නට පෙර මනුෂ්‍ය සමාජයේ සංකීර්ණතා, ජීවිතයේ වටිනාකම සහ නීතියේ බලවත්කම අවබෝධ වන ආකාරයේ විෂයයක් පාසල් විෂයමාලාවේ ප්‍රමුඛස්ථානයෙහිලා හඳුන්වා දීමෙන් මේ තත්ත්වයට පත්වන දරුවන් සංඛ්‍යාව අඩු කර ගත හැකියි. දරුවන්ගේ ක්ෂණිකාවේග පාලන ශක්‍යතා වර්ධනයට පියවර ගැනීම ද ඒ සඳහා රුකුලක්. විවෘත සහ සරල මනසකින් ගැටලු, බාධක සහ කම්කටොළු දෙස බැලීමට කුඩා අවධියේ සිට ම චින්තන විප්ලවයක් සිදු කිරීම ද මේ ගැටලුවට විසඳුමක්. නිසි අධීක්ෂණයෙන් යුතු ව වයස් කාණ්ඩවලට ගැළපෙන අත්දැකීම් ලබාගැනීමට සහ කණ්ඩායම් ක්‍රියාකාරකම්වලට යොමු කිරීමට ඉඩප්‍රස්ථා සැලැස්වීම ඔස්සේ ද මීට පිළියම් සොයා ගන්නට පුළුවන්.

මානසික සෞඛ්‍ය ප්‍රතිකාර සඳහා ප්‍රවේශ වීමට, මානසික අවපීඩනය සහ කාංසාව වැනි මානසික සෞඛ්‍ය තත්ත්වයන් කළමනාකරණය කිරීමට ඖෂධ සහ චිකිත්සාව උපකාරී වනවා. සංජානන චර්යා චිකිත්සාව (Cognitive behavioral therapy) සහ අපෝහක හැසිරීම් ප්‍රතිකාරය (Dialectical behavior therapy) සියදිවි නසාගැනීම පිළිබඳ සිතිවිලි අඩුකිරීමට සමත් සාර්ථක චිකිත්සක ක්‍රම බව වෛද්‍ය විද්‍යාත්මක ව තහවුරු කර තිබෙනවා. ආතති කළමනාකරණ සහ ගැටලු විසඳීමේ ශිල්පීය ක්‍රම ඉගැන්වීමත් අයිතිවාසිකම් පිළිබඳ හැඟීම් ඇති කිරීමත් ඊට උපකාරී වන පියවර.

දරුවන්ගේ හැසිරීම් රටාවේ ක්ෂණික ව ඇතිවන පැහැදිලි වෙනස්කම් හඳුනාගැනීමට දෙමව්පියන්, පවුලේ වැඩිහිටියන්, ගුරුවරුන්, ආගමික සහ සමාජීය නායකයන් යනාදී පාර්ශ්වවලට පුහුණුව ලබාදීමෙන් දරුවන්ට ආදරණීය ව සැලකීම සහ පිළිගැනීම ලබාදීමෙන් ද එවැනි හානි වළක්වා ගැනීම පහසු වනවා. එහිදී අදළ පාර්ශ්ව බලගැන්විය යුත්තේ දරුවන්ගේ කලකිරුණු ආකාරයේ ප්‍රකාශ, අමුතු හැසිරීම් සහ ඉඟිකිරීම්, හුදෙකලාව ප්‍රියකිරීම්, ආරාවුල් ඇතිකර ගැනීම්, හිතුවක්කාර ලෙස හැසිරීම්, වැඩකිරීම මන්දගාමීවීම්, කලින් නොතිබුණු වෙනස් මිතුරු ඇසුරු කරා යොමුවීම්, මත්පැන්, දුම්වැටි සහ මත්ද්‍රව්‍ය යනාදියට යොමු වීම්, ඉගෙනීමෙන් දුරස් වීම්, දෙමව්පියන් සහ කුටුම්භ සාමාජිකයන් නුරුස්නා ස්වභාවයට පත්වීම්, කතාබහ අඩු වැඩි වීම්, නින්දේ වෙනස්කම්, ඉදිරිපත් වීමේ ගැටලුසහගත බව පෙන්වීම්, කොන්වීම්, අධික පසුතැවිලි වීම්, සියලු දේ ප්‍රතික්ෂේප කිරීම්, ආහාර අරුචිය ඇතිවීම්, ශරීරය කෙට්ටු වීම්, මුහුණු කළුවීම් සහ ඇස් යට ගිලීම් වැනි වෙනස්කම් හඳුනාගෙන දරුවන්ට නොදැනෙන ලෙස ඒවාට සංවේදී වී ප්‍රතිකර්ම යෙදීම සඳහා දරුවාගේ සිත පළුදු නොවෙන ආකාරයෙන් උපක්‍රමික ව උපදේශන සේවා සහ වෛද්‍ය අංශ වෙත යොමුකරවීමට.

## වැළැක්වීම

මේ සංකීර්ණ ගැටලුවට බලපාන්නේ මනෝ විද්‍යාත්මක, ජීව විද්‍යාත්මක සහ සාමාජීය සාධකවල එකතුවක්. මේ හැසිරීම් අවම කිරීම සඳහා මානසික සෞඛ්‍ය ප්‍රතිකාර, සමාජ සහයෝගය, ජීව විද්‍යාත්මක මැදිහත්වීම සහ සියදිවි නසාගැනීම් වැළැක්වීමේ උපායමාර්ග ඒකාබද්ධ කරමින් පරිපූර්ණ ප්‍රවේශයක් අවශ්‍ය කර තිබෙනවා. දැනුවත්භාවය ඇතිකිරීම සහ පූර්ව මැදිහත්වීම් සිදුකිරීම ඔස්සේ ද සියදිවි නසා ගැනීමේ අවදානම අඩු කරන්නට පුළුවන්.

වර්තමානයේ සියදිවි හානිකර ගැනීමට තැත්කරන අවස්ථා සංඛ්‍යාත්මක ව වැඩිවීමක් පෙන්නුම් කළ ද ඔවුන්ගේ ජීවිත හානිවීම් වළක්වා ගන්නා අවස්ථා වර්ධනය වී තිබෙනවා. ඒ, නවීන තාක්ෂණික පණිවුඩ හුවමාරු ක්‍රම, ප්‍රවාහන සහ යටිතල පහසුකම්, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ භෞතික සහ මානව සම්පත් දියුණු වීම සහ කාර්යක්ෂම වීම නිසා අවදානමට මුහුණදුන් අයට ඉක්මන් ප්‍රතිකාර ලබා දී බේරා ගැනීමට ඇති හැකියාව නිසා. මේ බව පවසන්නේ කලපලුවාව, ප්‍රජා සවිබලගැන්වීම් පිළිබඳ අධ්‍යයන හා පුහුණු ආයතනයේ මනෝවිද්‍යා උපදේශක දසනායක ලියනගේ. දිවිනසා ගැනීම් සහ විවිධ හිංසන, අපරාධ, සමාජවිරෝධී ක්‍රියා ප්‍රවර්ධනය වන ආකාරයේ ප්‍රවෘත්ති, ටෙලිනාට්‍ය, රූපවාහිනි සහ ගුවන්විදුලි වැඩසටහන්, සමාජ මාධ්‍ය වැඩසටහන්, පරිගණක ක්‍රීඩා යනාදියට නිදහසේ පිවිසීමට දරුවන්ට ඇති අවස්ථා හැකිතාක් මඟහැරවිය යුතු බවත් ඔහු අවධාරණය කරනවා.

**වර්තමානයේ සියදිවි හානිකර ගැනීමට තැත්කරන අවස්ථා සංඛ්‍යාත්මක ව වැඩිවීමක් පෙන්නුම් කළ ද ඔවුන්ගේ ජීවිත හානිවීම් වළක්වා ගන්නා අවස්ථා වර්ධනය වී තිබෙනවා. ඒ, නවීන තාක්ෂණික පණිවුඩ හුවමාරු ක්‍රම, ප්‍රවාහන සහ යටිතල පහසුකම්, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ භෞතික සහ මානව සම්පත් දියුණු වීම සහ කාර්යක්ෂම වීම නිසා අවදානමට මුහුණදුන් අයට ඉක්මන් ප්‍රතිකාර ලබා දී බේරා ගැනීමට ඇති හැකියාව නිසා.**

මානසික රෝග ශරීරයේ ස්නායු පද්ධතියට කරන හානි නිසා ශාරීරික සහ මානසික සමබරතාව ගිලිහී යන අතර එවිට පුද්ගලයකු ක්ෂණික තීරණ ගැනීමට පෙළඹෙනවා. අනෙකාගෙන් පළි ගැනීමට දක්වන බිය, චකිතය සහ ලැජ්ජාව නිසා ඇතැමුන්ගේ ක්ෂණික අවසාන තීරණය වන්නේ අන් කිසිවකුගෙන් නොව තමාගෙන් පළි ගැනීම.
කෙනකු ඒ තත්ත්වයට පත්වන්නට පෙර ඊට බලපාන හේතු හඳුනාගෙන ඒවා මඟහැරවීම සියදිවි නසා ගැනීම් අවම කර ගැනීමට රුකුලක්. ඒ සඳහා ප්‍රධාන වශයෙන් ම මිනිස් සිතේ අභ්‍යන්තර ශක්ති ප්‍රභව ප්‍රවර්ධනය කර අවදි කිරීමට ක්‍රියාමාර්ග යෙදීමයි සුදුසු. එවිට පුද්ගල යටි සිතේ ඇතිවන අවගමනීය තත්ත්ව, ප්‍රගමනීය බවට වෙනස්කරන්නට පුළුවන්. කෙනකුට තමාගේ වටිනාකම ඔහුට හෝ ඇයට හඳුන්වා දෙමින් ධනාත්මක ව අභිප්‍රේරණය කිරීමෙන් මානසික අවපීඩනය උග්‍ර රෝග දක්වා වර්ධනය වීම වළක්වා ගත හැකි වනවා. වැඩමුළු, දේශන, ලේඛන, ප්‍රායෝගික ක්‍රියාකාරකම්, උපදේශන සේවා, ආගමික වැඩසටහන්, අධ්‍යාපන හා මනෝවිද්‍යාත්මක දැනුවත් කිරීම් වැනි ව්‍යාපෘති වැඩිකිරීමෙන් සහ ඒවාට අඛණ්ඩ ව සහභාගි වන පිරිස වැඩි කිරීමෙන් මානසික වියවුල් යම් පාලනයකට නතු කළ හැකියි. ඊට



සමගාමී ව වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය ද? නැද්ද? යන්න සලකා බලා අවශ්‍ය අයට ප්‍රතිකාර ලබා දීමටත් ක්‍රියා කිරීම වැදගත්. කුඩා අවධියේ පටන් සිත දියුණු කිරීමේ ක්‍රියාකාරකම් සහ මනෝ ව්‍යායාම වැනි දේට ද දරුවන් යොමු කිරීමයි සුදුසු. සියදිවි නසා ගැනීම ව ැනි බිහිසුණු අවස්ථාවලට මැදි නොවන, සමාජාවබෝධය සහිත, පුළුල් දැක්මකින් යුත් උසස් පුද්ගලයකු සමාජගත කරවන්නට එවිට හැකි වනවා. අනාගත පරපුර පීඩා පාලනය කරගත හැකි සහ අභිමිවීම් භාරගෙන ඉවසීමෙන් ජීවත්විය හැකි සමබර මිනිසුන් බවට පත් කිරීමේ අනිවාර්ය වගකීම වර්තමාන පරපුර භාරගත්තා වන්නේ එවිට.

ශ්‍රී ලංකාව වැනි රටක මානසික සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ ජනතාවගේ පිළිගැනීම, අවබෝධය සහ උනන්දුව ඉතා දුර්වල මට්ටමක පවතින්නක්. මානසික ගැටලුවක් යනු 'පිස්සු' කියා රෝගයක් ය යන 'පිස්සු' ආකල්පය ජන මනැස්වල මුල්බැසගෙන තිබීම එවැනි දුර්වල පිළිගැනීමක් මීට හිමිවන්නට පාදක වී ඇති බවයි පෙනී යන්නේ. බොහෝ මානසික රෝග උපදේශනයෙන් පහසුවෙන් ම විසඳාගත හැකි බව සහ සෑම විට ම රහස්‍යභාවය ආරක්ෂා කරමින් ප්‍රතිකාර ලබා ගත හැකි ස්ථාන සහ ක්‍රමවේද තිබෙන බව පිළිබඳ ජනතාව නොදැනුවත්. අවසානයේ සියදිවි නසා ගැනීමෙන් කෙළවර වන බිහිසුණු වාතාවරණය දක්වා උත්සන්න රෝගියකු ලෙස දරුවකු නිර්මාණය වන්නේ මෙවැනි වාතාවරණයක. මුල් වකවානුවේ මානසික ගැටලුව හඳුනාගැනීමට සහ පුහු මතවල එල්බගෙන නොසිටීමට සමාජය හුරු කරවීමයි මේ සඳහා ඇති හොඳම විසඳුම. ඊට සාම්ප්‍රදායික මාධ්‍ය පමණක් නොවෙයි නව සමාජ මාධ්‍ය වේදිකා පාවිච්චි කිරීමට ද වගකිව යුතු අංශ ආකල්පමය වෙනසට සැදී පැහැදිය යුතු වනවා.

## ඉදිරිය

සියදිවි නසාගැනීම් වැළැක්වීම සඳහා පුළුල් ජාතික උපායමාර්ගයක් ක්‍රියාත්මක කිරීම, 'LIVE LIFE' අනුගමනය කිරීම වැනි වැඩසටහන් ඔස්සේ 2030 වන විට ගෝලීය සියදිවි නසාගැනීමේ මරණ අනුපාතය 1/3කින් අඩු කිරීම එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) සහ WHOහි 2013-2030 විස්තීරණ මානසික සෞඛ්‍ය ක්‍රියාකාරී සැලැස්මේ දර්ශකයක් සහ ඉලක්කයක්. මානසික සෞඛ්‍යය සම්බන්ධ අග්නිදිග ආසියාවේ කලාපීය කමිටු යෝජනා අනුව මානසික සෞඛ්‍යය ප්‍රවර්ධනය සහ සියදිවි නසාගැනීම් වැළැක්වීම සඳහා පුළුල් ප්‍රතිපත්ති සහ උපායමාර්ග ද යොද ගැනෙනවා.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපදෙස් වන්නේ ප්‍රධාන වශයෙන් මනෝ සමාජීය උපදේශනය පිළිබඳ ජාතික තරුණ සේවා උපදේශකවරුන් පුහුණු කිරීම, මනෝ සමාජීය සහය සහ මානසික යහපැවැත්ම පිළිබඳ දහම්පාසල් ගුරුවරුන් පුහුණු කිරීම, සෞඛ්‍ය සේවා ශ්‍රම බලකායේ මෙන් ම අනෙකුත් කාණ්ඩවල කාර්යමණ්ඩලවල ධාරිතා වර්ධනය සඳහා සහය ලබා දීම, සියදිවි නසාගැනීම් පිළිබඳ වගකීමෙන් වාර්තා කිරීම පිළිබඳ මාධ්‍යවේදීන් පුහුණු කිරීම සහ දිස්ත්‍රික් මට්ටමින් ජාතික මානසික සෞඛ්‍ය උපකාරක සේවාව (1926) පුළුල් කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා සෞඛ්‍ය සේවකයන් පුහුණු කිරීම.



මෙතෙක් ශ්‍රී ලාංකිකයා අත්දුටු තරගකාරීත්වය, බල උන්මාදය, ගැටුම්, ධන ලෝභය සහ පුහු ආටෝපය මූලික කර ගත් ජීවන රටාව විසින් බහුතරයක් අසරණභාවයට සහ අතරමංවූ තත්ත්වයට පත්වූ රාජ්‍යයක වගඋත්තරකරුවන් වන්නට වත්මන් ළමා සහ තරුණ පරපුරට මෙන් ම වැඩිහිටියන්ට ද සිදු ව තිබෙනවා. දිගින් දිගට ම පවත්වාගෙන ආ රටට සහ සමාජයට නොගැළපෙන පාලන ව්‍යුහවල දේශපාලන සිරකරුවන් වීමේ අනිටු ප්‍රතිඵලය ද මේ කතාබහ වන මාතෘකාව උද්ගත වීමට හේතුවක්. ඊට නිසි පිළියම් යෙදීමේ භාරදූර වගකීම නව ජනාධිපතිවරයා ප්‍රමුඛ රජයට පැවරෙන ප්‍රමුඛතම කාර්යයක්. මෙවැනි මාතෘකා සමාජ ආර්ථික දේහයේ පිළිල. ඒවා තවදුරටත් කතා කිරීමට අනාගතයේ ඉඩක් නොතැබිය යුතු අතර එවැනි සිද්ධි කේවල සිද්ධි ලෙසවත් වාර්තා නොවන වාතාවරණයකුයි රටේ නිර්මාණය විය යුත්තේ. එවිට දියුණු මිනිසුන් වාසය කරන සමාජයක් පවතින රටක් ලෙස ලෝකය ශ්‍රී ලංකාව හඳුනා ගනීවි.

**දිගින් දිගට ම පවත්වාගෙන ආ රටට සහ සමාජයට නොගැළපෙන පාලන ව්‍යුහවල දේශපාලන සිරකරුවන් වීමේ අනිටු ප්‍රතිඵලය ද මේ කතාබහ වන මාතෘකාව උද්ගත වීමට හේතුවක්. ඊට නිසි පිළියම් යෙදීමේ භාරදූර වගකීම නව ජනාධිපතිවරයා ප්‍රමුඛ රජයට පැවරෙන ප්‍රමුඛතම කාර්යයක්.**

# දරුවන්ගේ ගැටලු දරුවන්ගේ ඇසින්



නීතිවේදී, සමාජ විද්‍යාඥ
**ශානිකා මලල්ගොඩ**
අධ්‍යක්ෂ (සැලසුම් හා තොරතුරු)
ජාතික ළමාරක්ෂක අධිකාරිය

සියදිවි නසාගැනීම ලොව ඕනෑම සමාජයක අඩු වැඩි වශයෙන් පවතින සමාජ ගැටලුවක්. නිවසේ ඇතිවන ගැටලු, මානසික පීඩන, සම වයස් කණ්ඩායම්වල පීඩන, ආදර සබඳතා, මත්ද්‍රව්‍ය භාවිතය වැනි විවිධ හේතු මත දරුවකු සියදිවි නසාගන්නට පෙළඹෙන්නට පුළුවන්.

යහපත් දෙමාපිය දූ දරු සම්බන්ධතා, යහපත් ගුරු-ශිෂ්‍ය සම්බන්ධතා සහ යහපත් ගුරුවර දෙමාපිය සබඳතා තුළ මෙවැනි අහිතකර තත්ත්ව ඇති වීමේ ප්‍රවණතාවක් නැහැ. සමාජ සම්බන්ධතා ගොඩනැගීම, හුදෙකලා නොවීම යන කාරණා සහ සමාජ සම්බන්ධතාවල ඇති වටිනාකම් පෙන්වාදීමෙන් දරුවකුට සියදිවි නසාගැනීමේ ඉලක්කයට යාම අවශ්‍ය වන්නේ නැහැ.

දරුවන්ගේ සියදිවි නසාගැනීම යන සමාජ කාරණයේදී මූලික ඒකකය වන පවුලට විශාල කාර්යභාරයක් හිමිවනවා. වර්තමානයේ බොහෝ බිඳුණු පවුල් දක්නට පුළුවන්. එවිට දරුවන්ගේ භාරකාරිත්වය පිළිබඳ ගැටලු මතු වනවා. එහෙත් ඔවුන්ට වගකීමක් පැවරෙනවා වයස අවුරුදු 18 වන තෙක් දරුවා සුරක්ෂිත ව රැක බලා ගැනීමට. දරුවාට අවශ්‍ය නිවැරදි මානසික ශක්තිය, රැකවරණය හා පෝෂණය ආදිය ලබාදීමට.

ජාතික ළමාරක්ෂක අධිකාරිය දෙමව්පියන්ට අවධාරණය කරන්නේ ආර්ථික කාර්යයට දායක වන අතර 'දරුවන් නොසලකා හරින්න එපා' යන කාරණය. දරුවන් සමග ඉතා සමීප ඇසුරක් තබා ගැනීමෙන් ඔවුන් සුරක්ෂිත වනවා පමණක් නොව ගැටලුකාරී අවස්ථා දෙමාපියන් සමග බෙදා ගන්නට දරුවන්ට අවකාශය හිමිවනවා. එවිට සියදිවි නසා ගැනීමට ඔවුන්ට ඉඩක් ලැබෙන්නේ නැහැ. විශාල වශයෙන් දරුවන් සියදිවි නසා ගැනීම හෝ ලිංගික අපචාරයකට හෝ ලක්වන්නේ දෙමාපිය රැකවරණය නොමැති පසුබිමක.

පවුලක ගැටලුකාරී අවස්ථාවකදී දරුවන්ට පවුලෙන් නොලැබෙන ආරක්ෂාව ඌන පූර්ණය කිරීමට සිදුවන්නේ පාසලෙන්. එහෙත් පාසලෙන් ද එම දරුවන්ට නොසලකා හැරීමකට හෝ හිංසනයකට හෝ ලක් වුවහොත් ඔවුන් විකල්ප සොයනවා සමාජයෙන්. ඒ, ජීවත්වීම පිළිබඳ ආශාව අතහැරීමෙන්. මේ නිසා පාසලක මනෝ උපදේශක ගුරුවරයාගේ භූමිකාව ඉතා වැදගත්. එය පුළුල් වුවක්. පාසලක එක් උපදේශක ගුරුවරයකු පමණක් සිටීම ප්‍රමාණවත් නැහැ. සෑම ගුරුවරයකු ම හොඳ සවන්දෙන්නකු වුවහොත් දරුවන්ට ප්‍රසන්න ස්ථානයක් බවට පාසල පත් කරන්නට පුළුවන්. එබැවින් සෑම ගුරුවරයකුට ම, සෑම පාර්ශ්වකාර ආයතනයකට ම දරුවන් සියදිවි නසාගැනීමේ තත්ත්වය අවම කිරීමට විශාල වගකීමක් තිබෙනවා. ඒ, සියදිවි නසාගැනීමට හේතු වන සාධක සොයා ඒවාට ප්‍රායෝගික පිළියම් යෙදීමෙන්.

සියදිවි නසා ගන්නා ආකාරයත් එහිදී භාවිත ක්‍රමවේද පිළිබඳවත් විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යයෙන් පැහැදිලි ව ගෙන එන පුවත් වර්තමානයේ දක්නට ලැබෙන සුලබ කාරණයක්. එම වාර්තාකරණය බොහෝ විට තරුණ සිත් පෙළඹවීමට යොදාගන්නා ආයුධයක් වැනියි. එය යහපත් නොවන්නේ දරුවන් යනු නිරන්තරයෙන් අනුකරණය කරන පිරිසක් නිසාත් පරිණත බුද්ධියක් සහිතවූවන් නොවන බැවිනුත්. අවබෝධ කරගැනීමට හැකියාවක් ඇති නිසා වැඩිහිටි ප්‍රජාව සමග සියදිවි නසාගැනීම යන කාරණය සාකච්ඡා කිරීම ගැටලුවක් වන්නේ නැහැ. එහෙත් මාධ්‍යයේ පෙළඹවීම් සහිත වාර්තාකරණයෙන් දරුවන්ට සිදුවන්නේ අනර්ථයක්. වගකීම් සහගත පිරිසක් ලෙස මාධ්‍යයට සහ වැඩිහිටි පුරවැසියන්ට වගකීමක් තිබෙනවා සියදිවි නසාගැනීම් සම්බන්ධයෙන් දැනුවත් කිරීමේදී වඩාත් ප්‍රවේසම් වීමට. විශේෂයෙන් සියදිවි නසාගැනීමක් වැනි සිදුවීමක් සම්බන්ධයෙන් නාට්‍ය, ගීත, චිත්‍රපට ඔස්සේ ප්‍රචාරණයක් ලබාදීමෙන් වන්නේ පෙළඹවීමක් සහ වීරත්වයක් දරුවාගේ සිතට ආරෝපණය කරවීමෙන් ඊට අනුබල දීමක්.

'සියදිවි නසාගැනීම' යන කාරණය සාකච්ඡා කළ යුත්තේ වැඩිහිටියන් සමග. එහිදී විශේෂ අවධානයක් ලබා දිය යුත්තේ මනෝ සාමාජීය ව ළමයකු ශක්තිමත් කරන්නේ කෙසේද? දරුවකුට ඇතිවිය හැකි ගැටලු මොනවාද? ගැටලුවකට ශක්තිමත් ව මුහුණ දෙන්නේ කෙසේද? ඒවාට විසඳුම් සොයාගන්නේ කෙසේද? උපකාර ලබාගත හැකි පුද්ගලයන් හා ආයතන මොනවාද යන්න.

දරුවකු සියදිවි නසාගැනීමට හේතු වන විවිධ ගැටලුවට සරිලන විසඳුම් සෙවිය යුතුයි. එක ම විසඳුම සෑම අවස්ථාවකට ම ආදේශ කරන්නට බැහැ. එහිදී දරුවන් අපහසුතාවට පත්වන අයුරින් ක්‍රියාත්මක වුවහොත් වන්නේ ඔවුන්ට මානසික අසමතුලිතතාවක් ඇතිවීමේ අවදානමක් මතු වීම.

ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී ළමා අපයෝජනය කාණ්ඩ 4කට වෙන් කරනවා. ඒ, කායික අපයෝජනය, ලිංගික අපයෝජනය, මානසික අපයෝජනය සහ නොසලකා හැරීම ලෙස. එය අවම කිරීමේ භාරදූර කර්තව්‍යයේ ප්‍රමුඛ වගකීමක් පැවරෙන්නේ ජාතික ළමාරක්ෂක අධිකාරියට.

පාසල් ශිෂ්‍ය ප්‍රජාව, විශ්වවිද්‍යාල ප්‍රජාව සහ වැඩිහිටි සමාජය ඒකාබද්ධ වෙමිනුයි සියදිවි නසාගැනීම් වැළැක්වීම වැනි ළමා සුරක්ෂිත කාරණා පිළිබඳ උත්සුක විය යුත්තේ. මෙතෙක් කාලයකට ජාතික ළමාරක්ෂක අධිකාරියට හැකියාවක් තිබුණේ නැහැ දරුවන්ගේ ගැටලු දරුවන්ගේ ඇසින් දැකීමට. අප අසාර්ථක වූයේ ඒ නිසා වන්නට

පුළුවන්. ඒ සඳහා විසඳුමක් ලෙසයි දරුවන් බල ගන්වන්නේ. ඔවුන්ට එහි නායකත්වය ලබාදීමෙන් ඔවුන්ගේ දායකත්වයෙන් තම සහෝදර ශිෂ්‍ය ප්‍රජාවගේ ගැටලු දෙස සාමූහික ව වගවීම ඉතා වැදගත්. දරුවන්ගේ විසඳුම් විශිෂ්ටයි. අපූරුයි සහ නිර්මාණශීලීයි.

ඒ යටතේ විශේෂ වැඩසටහන් 02ක් ක්‍රියාත්මක කරනවා. ළමා ආරක්ෂාව පිළිබඳ පාසල් ශිෂ්‍ය තානාපති වැඩසටහන එහි පළමු වැන්න. එහිදී වන්නේ පාසල්වල ශිෂ්‍ය නායකයන් ළමා ආරක්ෂාව පිළිබඳ දැනුමෙන්, ආකල්පවලින් සන්නද්ධ කරමින් තමන්ගේ ගැටලු ඔවුන් විසින් ම හඳුනාගනිමින් ඒ සඳහා විසඳුම් යෝජනා ඉදිරිපත් කිරීම. දිස්ත්‍රික් මට්ටමින් අප ඒ සඳහා සකසා තිබෙන්නේ වේදිකාවක්. එක් පාසලකින් ශිෂ්‍ය නායකයන් 05 දෙනෙක් තානාපතිවරුන් ලෙස පත්කර තිබෙනවා. මේ කාර්යයේදී දිස්ත්‍රික්ක 25ක පාසල් දරුවන් නියෝජනය කිරීමට සැලැස්වීම විශේෂත්වයක්. ශිෂ්‍ය තානාපති දිස්ත්‍රික් සමුළුවක් පැවැත්වීමෙන් පසු අපේක්ෂා කරනවා 2025 වසරේදී ශිෂ්‍ය තානාපති ජාතික සමුළුව පැවැත්වීමට. එවිට ශිෂ්‍ය නියෝජනයෙන් ශිෂ්‍ය නායකයන් ම උපකාර කරාවි මෙරට දරුවන්ට තිබෙන ගැටලුවලට විසඳුම් සෙවීමට. ශිෂ්‍ය තානාපති වැඩසටහන යටතේ ම තවත් වැඩසටහන් 15ක් ද හඳුන්වා දී තිබෙනවා.

විශ්වවිද්‍යාල ප්‍රජාව යනු විවිධ ක්ෂේත්‍රවල කුසලතාව, හැකියාව වර්ධනය වූ පිරිසක්. ළමයින්ගේ ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියාත්මක දෙවැනි වැඩසටහන වන්නේ විශ්වවිද්‍යාල ශිෂ්‍ය තානාපති වැඩසටහන. එය ආරම්භ කළේ 2023 වසරේදී. රජයේ විශ්ව විද්‍යාල 17 ම නියෝජනය වන ආකාරයෙන් ශිෂ්‍ය තානාපති වැඩසටහන මෙහෙයවනවා. ඒ සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍ය පිරිස් සම්බන්ධ වන්නේ ස්වේච්ඡාවෙන් ම. මේ වැඩසටහන් 2න් බලාපොරොත්තු වන්නේ ළමයින්ගේ සුරක්ෂිතතාව සම්බන්ධයෙන් නව යෞවනයාගේ සිට වැඩිහිටි ප්‍රජාව දක්වා ක්‍රියාත්මක වන පුළුල් ක්‍රියාදාමයක් රටේ ඇති කරලීම.

ළමාරක්ෂක සමුළු 2023, 2024 වසරවල පැවැත්වුණා. එහෙත් සෑම දිස්ත්‍රික්කයක් ම එහිදී ආවරණය කිරීම අපහසු වුණා. ජාතික ළමාරක්ෂක අධිකාරිය ලෙස 2025 වසරේදී ජාතික සමුළුව පවත්වමින් දරුවන්ගේ ගැටලු පිළිබඳ මෙරට විධායකය සහ ව්‍යවස්ථාදායක දැනුවත් කිරීමට බලාපොරොත්තු වනවා. ඊට අමතර ව අධිකරණ අමාත්‍යාංශය සම්බන්ධ කර ගනිමින් ප්‍රායෝගික විසඳුම් සෙවීමටත් ක්‍රියාත්මක විය යුතුයි. දරුවන් පිළිබඳ නීති ලේඛනගත ව තිබෙනවාට වඩා ප්‍රායෝගික විසඳුම් සෙවීමයි වැදගත්. ළමාරක්ෂක අධිකාරිය ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකසා අවසන්. පස් අවුරුදු සැලැස්මක් ද සකස්කර කැබිනට් අනුමැතියට යොමු කර තිබෙනවා.


**විශ්වවිද්‍යාල ප්‍රජාව යනු විවිධ ක්ෂේත්‍රවල කුසලතාව, හැකියාව වර්ධනය වූ පිරිසක්. ළමයින්ගේ ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියාත්මක දෙවැනි වැඩසටහන වන්නේ විශ්වවිද්‍යාල ශිෂ්‍ය තානාපති වැඩසටහන. එය ආරම්භ කළේ 2023 වසරේදී. රජයේ විශ්ව විද්‍යාල 17 ම නියෝජනය වන ආකාරයෙන් ශිෂ්‍ය තානාපති වැඩසටහන මෙහෙයවනවා. ඒ සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍ය පිරිස් සම්බන්ධ වන්නේ ස්වේච්ඡාවෙන් ම.**




වෛද්‍ය
**චමින්ද විජේසිරිවර්ධන**
ජ්‍යෙෂ්ඨ මනෝ උපදේශක
මනෝ චිකිත්සක


සියදිවි නසාගැනීම ආකාර කිහිපයකට සිදුවන්නට පුළුවන්. විශේෂයෙන් නවයොවුන් වියේ දරුවකුට වයස අනුව විවිධ ගැටලු මතු වීමේ හැකියාව තිබෙනවා. ජීවිත අත්දැකීම් අඩුකම, ආවේගශීලීවීම, අන් අය අනුකරණය කිරීම, බහුතර මතයට නැඹුරු වීම, විප්ලවවාදී බව, කැපී පෙනීමට ඇති කැමැත්ත, කුමකට හෝ ඉක්මනින් ඇබ්බැහි වන ගතිය, යහළුවන්ගේ මත සමග සිටීම, තර්කානුකූල බවට වඩා චිත්තවේගාත්මක භාවමය ප්‍රතික්‍රියා වැඩි වීම, අසාධාරණයට විරුද්ධ වීම එවැනි ගැටලු කිහිපයක්. ප්‍රේම සබඳතා, මත්ද්‍රව්‍ය, අනාගත සැලසුම්, පවුල් පරිසරය, අධ්‍යාපනය, ලිංගිකත්වය සම්බන්ධයෙන් ද ඔවුන්ට ගැටලු පැන නැගීම සුලබ ව දක්නට ලැබෙන්නක්.

ජීවිතය පිළිබඳ දැක්ම, නිවැරදි තොරතුරු ග්‍රහණය කරගන්නා ආකාරය සහ ඒ සඳහා ප්‍රවේශ වීම සම්බන්ධයෙන් තරුණ පිරිසට ඇත්තේ ඉතා අඩු අවබෝධයක්. ඒ, ඔවුන් වැඩිපුර රැඳෙන්නේ ඩිජිටල් මාධ්‍ය සමග නිසා. පවතින තරගකාරී අධ්‍යාපන ක්‍රමය හේතුවෙන් දරුවන්ගේ



# වැඩිම වගකීම පවුලට

ජීවන කුසලතා ප්‍රවර්ධනය ඉතා අවම මට්ටමක පවතිනවා. එවිට ඔවුන්ට යම් කාරණයක් දෙස නිවැරදි ව බැලීමට සහ ඒවා තර්කානුකූල ව විශ්ලේෂණාත්මක ව බැලීමට ඇති හැකියාව අවමයි. ඇති වන මානසික ව්‍යාධිය ඉහළයි. විෂාදය, පෞරුෂ අක්‍රමිකතා, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම්, කාංසා ආබාධ ඒ ඔස්සේ ඇති වන්නට පුළුවන්.

සියදිවි නසාගැනීම්වල ප්‍රධාන හේතුවක් ලෙස මානසික ආබාධ හඳුනා ගන්නට පුළුවන්. ඇතැම් යෞවනයන්ට මානසික රෝග පැවතියත් ඒවා හඳුනාගෙන නැහැ. එහි ප්‍රතිඵලයක් ලෙස සියදිවි නසාගැනීමේ හැකියාවක් තිබෙනවා. යෞවනයන් තීරණ ගන්නේ ක්ෂණික ව. ආවේගශීලීත්වය, චිත්තවේගික ව කලබල වීමේ ගතිය ඇති වන්නේ පෞරුෂත්වයේ ඇති වන නොයෙකුත් අඩුපාඩු නිසා. අන් අය පාලනය, බියගැන්වීම, ඇතැම් දේ දිනා ගැනීම ආදිය සඳහා සියදිවි නසාගැනීමට තැත් කරන අවස්ථා දැක ගන්නට පුළුවන්. විශේෂයෙන් දෙමාපිය දූ දරු සබඳතා පළුදු වීම ඊට බලපාන ප්‍රමුඛ කාරණාවක්. එවිට දරුවන්ට තමන්ගේ ගැටලු සාකච්ඡා කිරීමට කිසිවකු නොමැතිවීමෙන් වන්නේ ඔවුන් හුදෙකලා වී ක්ෂණික තීරණ ගැනීමට පෙළඹීම.

සමාජයක් සංකීර්ණ වන විට ඊට සමාන්තර ව වෙනස්වන සේවා පැවතිය යුතුයි. විශේෂයෙන් සියදිවි නසාගැනීමේ සංස්කෘතියක් නිර්මාණය වන පසුබිමක වෙනත් රටවල තිබෙනවා ඒවා වැළැක්වීමට සේවා සපයන ආයතන. එම ආයතනවල දුරකතන අංක, ගිලන් රථ සේවා පවතිනවා. යම් අයෙක් තමාට සියදිවි නසාගැනීමට අවශ්‍ය බව පවසමින් දුරකතන සහය පතන අවස්ථාවල පුද්ගලික ව ගිලන් රථ සේවා ක්ෂණික ව ක්‍රියාත්මක වන රටවල් තිබෙනවා. එහිදී සිදු කරන්නේ එම පුද්ගලයාගේ ගැටලුවලට ඇහුම්කන් දීම, පිළිතුරු සොයා දීම හා සන්සුන් කිරීම. එම දුරකතන ඇමතුම් සඳහා ශාස්ත්‍රඥ අය කිරීමක් නැහැ. සමාජයත් ඒ පිළිබඳ දැනුවත්. අපේ මෙවැනි සේවා නැහැ. ඇතැම් සේවා තිබුණත් අවශ්‍ය අවස්ථාවල ක්‍රියාත්මක නැහැ. සමාජයේ නොදැනුවත් බව තරුණ දිවි අහිමිවීමට තවත් එක් හේතුවක්.

මෙරට සිද්ධි වාර්තාකරුවන් ක්‍රියා කරන්නේ මාධ්‍ය ආචාර ධර්මවලට පටහැනි ව. ශ්‍රී ලංකාවේ ශිෂ්‍යයෙක් කැනඩාවේ පවුලක් ම ඝාතනය කළ සිද්ධිය එරට මාධ්‍ය වාර්තා කළේ එක් මරණයක්, ලේ පැල්ලමක් හෝ නොපෙන්වමින්. එය මාධ්‍ය සංදර්ශනයක් ලෙස එළිදැක්වූයේ නැහැ. එහෙත් ශ්‍රී ලංකාවේ සියදිවි නසා ගන්නට පෙළඹවීම් කරන ආකාරයේ සිද්ධි වාර්තාකරණයක් දක්නට පුළුවන් විශේෂයෙන් සියදිවි හානි කර ගත් පුද්ගලයාට වීරත්වයක් ආරෝපණය කිරීමක් එහිදී සිදු වනවා. එය බරපතළ වැරැද්දක්.

විශේෂයෙන් සිය දිවි නසාගැනීමට තවත් හේතුවක් පාසල්වල සහ පවුල්වල සිදුවන හිංසන, ළමා කාලයේ වාචික අපයෝජන, ලිංගික අපයෝජන, පවුල් ආරවුල්, ගුරුවරුන්ගේ හිංසන වැනි ව්‍යසන. මේ අත්දැකීම්වලට මුහුණදෙන දරුවන්ගේ පෞරුෂ අක්‍රමිකතා, භින්නෝන්මාද තත්ත්ව ඇති වන්නට පුළුවන්. සාමාන්‍යයෙන් එවැනි අයගේ මොළයේ රසායනික වෙනස්කම් තිබෙනවා. මෙවැනි මානසික ගැටලු පසුකාලීන සියදිවි නසාගැනීම්වලට හේතු වන්නට පුළුවන්.

බොහෝ රටවල් පීඩනය අඩු, යහපත්, සුන්දර ළමා කාලයක් දරුවන්ට උදා කර දීමට උත්සාහ දරනවා. විශේෂයෙන් භෞතික සංවර්ධනයෙන් රටක් සංවර්ධිත යැයි සිතන්නට බැහැ. සංවර්ධිත කොරියාව, ජපානය වැනි රටවල ආතතිය, පීඩනය හේතුවෙන් සියදිවි නසාගැනීම් විශාල සංඛ්‍යාවක් සිදුවන බවට තොරතුරු වාර්තා වනවා. එහෙත් ෆින්ලන්තය, නෝර්වේ වැනි මිනිසුන් සතුටින් සිටින රටවල භෞතික සංවර්ධනයත් සමග මානසික සංවර්ධනයත් සමාන්තර ව ගමන් කරන නිසා එවැනි සිදුවීම් ඉතා අවමයි.

දරුවන් හඳුනාගැනීම, ඔවුන් පිළිබඳ අවබෝධයෙන් සිටීම, දරුවන් සමග සමීප ව ක්‍රියා කිරීමෙන් මෙවැනි අවස්ථා මගහරවා ගැනීමට සෑම ගුරුවරයකුට ම මානසික සෞඛ්‍ය උපදේශන පුහුණුවක් ලබාදීම වැදගත්. එංගලන්තයේ පාසල් නොයන දරුවන් ගැන පසු විපරම් කරනවා. මෙරට පාසල්වල හිංසන (නවක වදය), ගුරුවරුන්ගෙන් වන හිංසන අවම කළ යුතුයි. පාසල්වල මනෝ උපදේශන සේවාව සක්‍රීය මට්ටමක පවත්වා ගත යුතුයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන් ක්‍රියාකාරී මනෝ උපදේශන සේවා ක්‍රියාත්මක කිරීමත් යහපත් මනෝ පරිසරයක් රැක ගැනීමට වැදගත්.

දරුවන් පෙර මෙන් කතා නොකිරීම, අධික ලෙස කෝපවීම, තනි ව සිටීමට දක්වන කැමැත්ත, යහළුවන් ආශ්‍රය කිරීමට මැලිවීම, ආතතියෙන් පසුවීම, ආහාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම වැනි චර්යා වෙනස්කම් පිළිබඳ දෙමව්පියන් සැලකිලිමත් විය යුතුයි. එනම් දරුවන්ගේ චර්යා සම්බන්ධයෙන් වැඩි වගකීමක් පවුලට පැවරෙනවා. එවැනි අවස්ථාවක දෙමව්පියන් කළ යුතු වන්නේ ළඟ ම ඇති රජයේ රෝහලක මනෝ විද්‍යා උපදේශන සායනය වෙත ගොස් දරුවන්ට මානසික රෝගයක් ඇත්දැයි තහවුරු කර ගැනීම. එවිට එවැනි මානසික රෝගී තත්ත්වයක දරුවකු පසුවන්නේ නම් මනෝ විද්‍යා උපදේශකයකුගේ හෝ වෛද්‍යවරයකුගේ හෝ තක්සේරුවකින් පසු ඔහු හෝ ඇය මනෝ චිකිත්සක ක්‍රම සඳහා යොමු කරවීමට පුළුවන්. මානසික රෝගවල එක් එක් සංකීර්ණතා මට්ටම් තිබෙනවා. සියදිවි නසාගැනීමට තැත් කරන්නකුගේ සිතිවිලි වෙනස් කිරීමට මෙන් ම නිවැරදි පෞරුෂයක් ගොඩනැගීමටත් උපදේශන සේවාව ඉතා වැදගත්.





# නීතිය පමණක් ප්‍රමාණවත් නැහැ



නීතිඥ
**නිහාල් තල්දුව**
නියෝජ්‍ය පොලිස්පති
පොලිස් මාධ්‍ය ප්‍රකාශක

සියදිවි නසාගැනීම 1998 වසර වන තෙක් ම පැවතියේ නීතියේ අපරාධමය වරදක් ලෙස. ඒ, දණ්ඩ නීති සංග්‍රහයේ 302 වගන්තිය අනුව. 'යම් තැනැත්තකු සිය පණ හානි කරගැනීමට තැත් කරතොත් හා එම වරද සිදුකිරීම සඳහා යම් ක්‍රියාවක් කරතොත් ඔහුට වසරක් දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය' යන්න එහි දක්වා තිබෙනවා. එහෙත් 1998 අංක 29 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනතේ 4 වැනි වගන්තියෙන් මුල් පනතේ 302 වගන්තිය ඉවත් කර තිබෙනවා. ඒ අනුව වර්තමානයේ සියදිවි නසාගැනීම යන කාරණය නීතියට අනුව අපරාධමය වරදක් ලෙස සලකන්නේ නැහැ. එහෙත් සියදිවි නසා ගැනීමට ආධාර අනුබල දීම වරදක් බවට දණ්ඩ නීති සංග්‍රහයේ 299 වගන්තියෙන් දක්වා තිබෙනවා. ඒ, 'යම් තැනැත්තකු සිය පණ හානි කරගනු ලැබුවහොත් එකී සිය පණ හානි කරගැනීමේ ක්‍රියාවට අනුබල දෙන තැනැත්තකුට මරණ දඬුවමින් දඬුවම් කළ යුතුය' යන්න. එම වගන්තිය අනුව සියදිවි නසාගැනීමකට උත්සාහ දැරීම මීට අදාළ වන්නේ නැහැ.

දණ්ඩ නීති සංග්‍රහයේ ඇතුළත් කර ඇති උක්ත කාරණා නෛතිකමය වශයෙන් පුද්ගල සියදිවි නසා ගැනීම් සම්බන්ධයෙන් දැක්විය හැකියි. එක් එක් කාලසීමාවල ශ්‍රී ලංකාවේ සියදිවි නසාගැනීම්වල සංඛ්‍යාත්මක යම් වර්ධනයක් දක්නට ලැබුණා. සමාජයේ විවිධ සාධක සියදිවි නසාගැනීම් සඳහා හේතු වනවා. අද වන විටත් දිවි නසාගැනීමට උත්සාහ දරන අවස්ථා සුලබයි. යම් පුද්ගලයකු සියදිවි නසාගැනීමට තැත් කළ විටෙක තවදුරටත් අධිකරණයක නඩු දමා චෝදනා එල්ල කිරීමෙන් වන්නේ ඔහු හෝ ඇය තවදුරටත් මානසික පීඩනයකට ලක්වීමත් අපහසුතාවට පත් වීමත්. ඒ හේතුව නිසයි දණ්ඩ නීති සංග්‍රහයේ 302 වගන්තිය ඉවත් කර ඇත්තේ.

දඬුවම් ලබා දෙනවාට වඩාත් සුදුසු වන්නේ පුද්ගලයකුගේ දිවි නසාගැනීමට හේතු වන කාරණය පිළිබඳ සොයා බලා එම පුද්ගලයා එලෙස ක්‍රියා කිරීමට හේතු වූයේ කුමන තත්ත්වයක් ද? යන්නත් ඔහුගේ හෝ ඇයගේ මනස නැවත යථාතත්ත්වයට පත් කිරීමෙන් (පුනරුත්ථාපනය) සහ එම පුද්ගලයා එයින් මුදවා ගැනීමේ ධනාත්මක ක්‍රමවේදයක් අනුගමනය කිරීමත්.

සියදිවි නසා ගැනීමක් අපරාධමය වරදක් ලෙස දැනට නොසැලකුවත් නීතිය ක්‍රියාත්මක කරන ආයතනයක් ලෙස ශ්‍රී ලංකා පොලිසිය සියදිවි නසා ගැනීමකට පසුව එහි විමර්ශන සඳහා පූර්ණ ලෙස මැදිහත්වනවා. ඒ, එය මනුෂ්‍ය ඝාතනයක් ද? සියදිවි නසා ගැනීමක් ද? යන්න අනාවරණය කර ගැනීමට විමර්ශනය කිරීම සඳහා. එය සියදිවි නසා ගැනීමක් ලෙස තහවුරු වුවහොත් ඒ සම්බන්ධයෙන් අධිකරණයට කරුණු වාර්තා කිරීමක් සිදු කරනවා. එහිදී සිදුවන්නේ පශ්චාත් වෛද්‍ය පරීක්ෂණයකින් සහ මරණ පරීක්ෂණයකින් අනතුරු ව මියගිය පුද්ගලයා මියගිය ස්ථානය, මියගියේ කෙසේ ද? යන්න අනාවරණය කර ගැනීමක්. විශේෂයෙන් ම මරණයකදී සියදිවි නසා ගැනීමක් නම් ඒ බව බවට තහවුරු කර ගැනීම මරණ පරීක්ෂණයේදී වැදගත්. ඒ සඳහා ප්‍රමාණවත් කරුණු තහවුරු කිරීම අවශ්‍ය වන්නේ එය මනුෂ්‍ය ඝාතනයක් නොවන බවට. ශ්‍රී ලංකා පොලිසිය සිය විමර්ශනවල කරුණු අධිකරණයට ඉදිරිපත් කරන්නේ 'A' වාර්තාවකින්.


සියදිවි නසාගැනීම වැළැක්වීම නීතිය ක්‍රියාත්මක කිරීමෙන් පමණක් සිදු කරන්නට බැහැ. එය සමස්ත සමාජයේ ම මැදිහත් වීමෙන් සිදු කළ යුත්තක්.



# උරුම යළි කියවා බැලීම

නිශාන්ත පීරිස්

වර්ෂ 2023 ජූලි 10 දින පළමු වරට මේ ගැන වාර්තා වූයේ නාමල්පොකුණ ආශ්‍රිත ප්‍රදේශයේ මී කැඩීමට ගිය එම ගමේ ගැමියන් දෙදෙනකුගෙන්. ඔවුන් දෙබෙල් ගල් පර්වතය හා එහි කොටා තිබූ සෙල්ලිපිය දැක ඒ ගැන පුරාවිද්‍යා බලධාරීන් දැනුවත් කිරීම මත මේ අගනා ජාතික උරුමය මතු පරපුරට දැක ගත හැකි වුණා. ඒ අනුව ශිලා ලේඛනය පිටපත් කිරීම හා එහි තාක්ෂණික පසුබිම විමසා බැලීම පී.ඩග්ලස් බණ්ඩාර, එම්.පී. රත්නපාල යන පුරාවිද්‍යා නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදු වුණා. අසීරුතා රාශියක් මධ්‍යයේ ඇරඹි එම මූලික විමර්ශන මේ වන විට ඵල දරා තිබෙනවා.





ශ්‍රී ලංකාවේ බෞද්ධ ඉතිහාසය විමසීමේදී පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර අතිශය වැදගත්. ඒ අතරින් සෙල්ලිපිවලට හිමි වනුයේ විශේෂ ස්ථානයක්. වසර දෙදහස් පන්සියයකටත් එහා ඉතිහාසය හැදෑරීමට නව මානයක් එක් කරමින් මෙරට දීර්ඝතම සෙල්ලිපිය දිඹුලාගල නාමල්පොකුණ ප්‍රදේශයෙන් 2023 වසරේදී හමු වුණා. එම සෙල්ලිපියේ පෙළ හා අර්ථ දැක්වීම් මෙන් ම එහි නවතම තොරතුරු අනාවරණය වුණේ නොබෝදා. කාලානුවර්තී ව ඉතිහාස තතු විත්ති යාවත්කාලීන කළ එම සොයා ගැනීමෙන් මෙරට ඓතිහාසික ගමන් මගේ නව සංධිස්ථානයක් මතු කළා පමණක් නොව මෙරට අතීත උරුමය ලෝකය අවදි කළා.

දිඹුලාගල නාමල්පොකුණ පුරාවිද්‍යා භූමි ප්‍රදේශය පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැදගත් පෞරාණික බිමක්. ඓතිහාසික දිඹුලාගල හෙවත් දුමරක්ඛ පබ්බතයට නුදුරින් පිහිටි භූමියේ වනගත සීමාවේ ස්වාභාවික සංසිද්ධියක් නිසා දෙපලු වූ ගල් පර්වතයක එක් මුහුණතක කොටා ඇති මේ සෙල්ලිපියයි දැනට ශ්‍රී ලංකාවෙන් වාර්තා වී ඇති බ්‍රාහ්මී අක්ෂර මාලාවෙන් ලියන ලද දිග ම සෙල්ලිපිය.

එම තොරතුරු අනුව ලිපිය කියවා අර්ථ සපයා ගැනීම සිදු වුණේ අවස්ථා කිහිපයකදී ම. ඒ සඳහා නවීන තාක්ෂණික ක්‍රමවේද පවා යොදා ගැනුණා. ලිපිය කියවා ගැනීම වඩාත් අසීරු වූයේ එහි බොහෝ අක්ෂර මැකී ගොස් ඇති නිසාත් ඇතැම් අක්ෂර කියවා ගැනීමට නොහැකිවීම නිසාත්. ආචාර්ය මාලනී ඩයස්, මහාචාර්ය කරුණාසේන හෙට්ටිආරච්චි ප්‍රමුඛ පුරාවිද්‍යා කණ්ඩායමක් මූලික වශයෙන් එය කියවූ අතර තවත් ආකාර කිහිපයකින් යළි එම සමස්ත කියවීම සිදු කෙරුණා.

දිඹුලාගල නාමල්පොකුණ සෙල්ලිපිය කියවා අර්ථ සපයා ගැනීමේ කාර්යය පිළිබඳ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය කරුණාසේන හෙට්ටිආරච්චි අදහස් දක්වූයේ මෙලෙස. ඔහු; "මේ ලිපිය ලියා ඇත්තේ අඩි 18ක් උස හා අඩි 55ක් පළලින් යුතු සමතල ගල් මුහුණතක. එහි අක්ෂර පේළි 11ක් හඳුනා ගැනීමට පුළුවන්. මේ සෙල්ලිපිය ක්‍රිස්තු පූර්ව

දෙවැනි සියවස හෙවත් අදින් අවුරුදු 2200කට පමණ පෙර ලියූවක් බවයි අනාවරණය වන්නේ. නිශ්චිත ව ම එය ක්‍රි.පූ 137-119 වකවානුවේ රජ කළ සද්ධාතිස්ස රාජ්‍ය සමයට අයත් වන්නට පුළුවන්. මේ සෙල්ලිපිය කියවීමට ශේෂ ස්පර්ශ ලාංඡන ක්‍රමය, නේත්‍ර පිටපත් ක්‍රමය, ඩිජිටල් ඡායාරූප හා බහුවර්ණාවලීක්ෂ ඡායා ක්‍රම වැනි ක්‍රමවේද රාශියක් භාවිත කළා. විශේෂයෙන් ආචාර්ය අර්ජුන තන්තිලගේගේ ප්‍රධානත්වයෙන් හා සුලකෝ ආයතනයේ දායකත්වයෙන් මල්ටි පෙට්‍රම් ක්‍රමය හා ඩිජිටල් ක්‍රමවේදය ඔස්සේ සෙල්ලිපි හා ඒ ආශ්‍රිත ව ඉතා සියුම් තොරතුරු පවා සොයා ගත හැකි වුණා. මේ සඳහා ඩ්‍රෝන කැමරා පවා භාවිත කළා.”

මෙවැනි ඩිජිටල් ඡායාරූප ක්‍රම භාවිත කරමින් සෙල්ලිපි කියවීම සිදු කළ ප්‍රථම අවස්ථාව මෙය බවත් මහාචාර්යවරයා පවසනවා. මේ සෙල්ලිපියේ 'අය තිශ' නමින් කාවන්තිස්ස යන්න ද 'මහ රඣ තිශ' යන්නෙන් සද්ධාතිස්ස ද අරුත් ගැන්වෙන බව සනාථ කොට තිබෙනවා. වැඩි ම පිරිසකගේ දායකත්වයක් නිරූපණය කරන පැරණිතම ශිලා ලේඛනය ද මෙය වන අතර අනුරාධපුර රාජධානිය සමයේ, මුල් අවධියේ දිඹුලාගල කලාපය සම්බන්ධ තොරතුරු රාශියක් මෙහි ඇතුළත් වීමත් විශේෂත්වයක්. එම සෙල්ලිපිය හමුවූ මුල් කාලයේ සමාජයේ පැතිර ගිය බොහෝ දුර්මත මේ සමග නිෂ්ප්‍රභා වීමත් සුවිශේෂත්වයක්.

නාමල් පොකුණ සෙල්ලිපියෙන් තත්කාලීන කෘෂි ආර්ථිකය හා වෙළෙඳ ආර්ථිකය ගැනත් තොරතුරු එළිදැක්වීම වැදගත්. කුඹුරු බදු, බිම් බදු හා ඉඩම් කොටස් ආරාමයකට පූජා කිරීම ගැනත් වෙළෙඳ හා මූල්‍ය ආයතන ක්‍රියාකාරීත්වය පිළිබඳවත් එහි සඳහන්. මේ බව අනාවරණය කරන මහාචාර්ය කරුණාසේන හෙට්ටිආරච්චි පවසන්නේ වත්මන් බැංකු හා සමාන ව එදා පැවති මූල්‍ය ආයතන හැඳින්විය හැකි බව. මූලතන, දෙවතන, බදන නම අරිහතන යනුවෙනුයි ඒවා දක්වා ඇත්තේ. එසේ ම අදින් වසර 2200කට පෙර බුදු දහම හා තදානුබද්ධ සංස්ථාදිය පැතිර තිබූ ආකාරය පිළිබඳ ව ද මේ සෙල්ලිපියෙන් පැහැදිලි වන බව ඔහු පවසනවා.


ඉන් වඩාත් ප්‍රබල ව දක්වා ඇත්තේ භික්ෂු ශාසනයේ උන්නතිය සඳහා කර ඇති පරිත්‍යාග. බුදු සසුන වෙනුවෙන් කරන ලද මහා පරිමාණ පරිත්‍යාග පිළිබඳ සඳහන් වන මෙතෙක් හමුවී ඇති පැරණිම සෙල්ලිපිය මෙය වීම ද විශේෂත්වයක්. මේ විහාරය එකල හඳුන්වා ඇති නාමය කවරේද යන්න නිශ්චිත ව කියන්නට බැහැ. ඇතැම් විට "අජගිරි" යන්න එහි පැරණි නාමය විය හැකි බවටයි පර්යේෂණ කණ්ඩායමේ අදහස. එකල සමාජයේ විවිධ වෘත්තිකයන් හා සමාජ කොටස් ගැන ද මෙහි කරුණු ඇතුළත්. සෙල්ලිපිය දක්වා ඇති පුද්ගල නාම ද එකල සමාජ පද්ධතිය ගැන තොරතුරු දනවනවා. අරික, අරිදල, උතරපුෂ, තිශ, දෙවතිශ, නග,මිත, රමදත, ශකසදේව, ශිවගුත වැනි නම් ඊට කදිම නිදසුන්. අනුරාධපුර රාජධානි සමයේ මුල් යුගයේ දේශපාලන, ආර්ථික, ආගමික හා සමාජ තොරතුරු බොහෝ සෙයින් අනාවරණය වන නිසා මේ ගැන තව තවත් අධ්‍යයනය කිරීම වැදගත් බවයි මහාචාර්යවරයා පවසන්නේ.

මේ සෙල්ලිපියේ බ්‍රාහ්මීය අක්ෂර, සිංහල ප්‍රාකෘත වැනි භාෂා යෙදුම් කියවා ගැනීමේදී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ මහාචාර්ය රත්නසිරි අරංගල දායක වී තිබෙනවා. එසේ ම ඊට ලැබී තිබෙන්නේ ආචාර්ය පූජ්‍ය ගල්වැව විමලකන්ද හිමි ඇතුළු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හා විශ්වවිද්‍යාල ආයතන කිහිපයක ම විද්වතුන්ගේ ද සහාය. මහාවංශය ඇතුළු වංශකතා තොරතුරුවලට ද මෙයින් යම් පිටුබලයක් ලැබෙන බව පැහැදිලි වනවා. මෙරට මානව වංශකතාවට ද නව පරිච්ඡේදයක් ඉන් එක්වනු ඇති.

දිඹුලාගල නාමල්පොකුණ සෙල්ලිපිය පිළිබඳ තවත් බොහෝ පැතිකඩ ඔස්සේ කරුණු විමසා බැලීමට විද්වතුන්ට අවස්ථාව තිබෙනවා. එහි අධ්‍යයන ක්ෂේත්‍ර ගැඹුර වැඩි වන්නට වැඩි වන්නට තවත් බොහෝ දේ විවර කර ගත හැකි අතර ම එයින් අනාගතයේ ශ්‍රී ලංකා ඉතිහාසයේ සොඳුරු චින්තාවලියක් පත් ඉරු මත දිග හැරෙනු ඇති.








# බලන් කඩතුරා හැර දෑසේ

තුසිත ජයසුන්දර



සිනමාකරුවාගේ සැබෑ කාර්යභාරය නිශ්චය කර ගත හැක්කේ පොදුවේ කලාකරුවාගේ සැබෑ කාර්යභාරයේ මූලිකාංග හා සමගාමී ව. මෙතැනදී සිනමාවේ අනන්‍යතාව හා ස්වීයත්වය කෙරෙහි අපමණ සැලකිල්ලක් දක්වන්නට සිදුවනවා. සිනමාකරුවා ද මේ සමාජයේ ම සාමාජිකයෙක්. මේ නිසා ම සමාජයීය, දේශපාලනික, සංස්කෘතික තතු වෙතින් විනිර්මුක්ත වීමේ කිසිදු අවසරයක් සිනමාකරුවකුට ලැබෙන්නේ නැහැ. ඔහුගේ පළමු කාර්යයක් වනුයේ මෙසේ සැකසෙන වටපිටාව රසික ජීවිත පරිඥානය වඩවන අයුරින් ප්‍රතිනිර්මාණය හා ඒ ඔස්සේ අභිනව කතිකා ගෙන හැර පෑමට ඇවැසි සුදුසු ම පියවර අනුගමනය කිරීම. එහෙත් මේ සම්බන්ධයෙන් සිනමාකරුවකුට අණ පැනවීමේ වුවමනා අනුමත කරන්නට බැහැ. 'සිනමාවේ හා පොදුවේ කලාවේ ප්‍රකාශන හිමිකාරිත්වය සුරැකීම යහපත් මානව හා සමාජ ජීවිතයක අනිවාර්ය අංගයක් වන්නේ ය' යන්න නිසි පරිදි වටහා ගැනීම වැදගත්.

99 වසරක සිරිලක වෘත්තාන්ත සිනමාව විෂයෙහි මෙකරුණු වටහාගෙන නිර්මාණකරණයෙහි නිරත සිනමාකරුවන් පිරිසක් සිටින වග හඳුනා ගත හැක්කේ ආකාර කිහිපයකින්. පළමුකොට ම ඒ ඒ කාල වකවානු මත රැඳෙමින්. දෙ වැනි ව විෂය කර ගන්නා කාරණා යටතේ. තෙ වැනි ව නිපැයුම්කරුවන්ගේ අරමුණු ආදියට අදාළ ව. සිව් වැනි ව සමකාලීන ව රජයන මතවාද හා පවත්වන ඒකග්‍රතා හා නොඑකඟතා සමඟ. පස් වැනි ව සර්වකාලීන යැයි හඟවන දෑ නිරූපණයට ගන්නා පියවර හා බැඳෙමින්. සය වැනි ව බහුතර රසිකයා හෝ සුළුතර රසිකයා හෝ සමග පවත්වන සබඳතා ඇසුරෙන්.

'සිනමාව සාකල්‍යයෙන් ම රසිකයා වෙත ආනන්දයක් ම ගෙන එන මඟක් ය' යන අර්ධ සත්‍යය බැහැර කොට එය රසික ජීවිත පරිඥානය වඩවන මඟක් ද වන බව අවධාරණය කරන්නට මේ සිනමාකරුවන් සිය නිපැයුම් පාර්ශ්ව හා ඒ ඒ අනුෂාංගික අංග පිළිබඳ වගකීමට බැඳෙන පාර්ශ්ව සමග ඉටු කළ අසීරු, විවාදාත්මක හා වරෙක ප්‍රශ්නකාරී වූ ප්‍රයත්න නිසාමයි මේ වන විට සිරිලක වෘත්තාන්ත සිනමාව කිසියම් පමණකට හෝ දකුණු ආසියානු කලාපයේ හා එය ඉක්මවා ආසියානු කලාපයේ කැපී පෙනෙන්නේ. එසේ ම



බටහිර කේන්ද්‍රීය අන්තර්ජාතික සිනමා උත්සව විෂයෙහි සම්මාන, ඇගැයීම් ආදිය ලබා ගනිමින් ප්‍රකට කරන තතු ද මෙහිලා සලකා බැලීම අත්‍යන්තයෙන් ම වැදගත්.

මෙසේ සිරිලක වෘත්තාන්ත සිනමාවේ නිම් වළලු පුළුල් කරලනු පිණිස සක්‍රිය වූ අවස්ථා වෙතින් නිශ්චිත දේශපාලනික චරිත, දේශපාලනික සිදුවීම් හා දේශපාලනික සිදුවීම්මාලා දත හැක්කේ කවර ප්‍රමාණයකින්දැයි යන්න විමසා බැලීමටයි මෙහිලා සැකෙවින් උත්සුක වන්නේ. නිශ්චිත හෝ කල්පිත දේශපාලනඥයන්ගේ චරිත, ඔවුන් හා බැඳෙන සිදුවීම් හා සිදුවීම්මාලා විෂය කර ගත් පමණින් හෝ නිරූපිත පමණින් යම් සිනමාපටයක් සැබවින් ම දේශපාලනික සිනමාපටයක් සේ අරුත් ගැන්වීම සහේතුක නැහැ. 'සිනමාව සෑම යුගයකදී ම පාහේ හැසිරුණේ හා හැසිරෙමින් සිටින්නේ නා නා විධ පිවිසුම් ඔස්සේ ය' යන සැබෑව මෙතැනට ගළපා ගත යුතු වනවා. අද වන විට මේ පිවිසුම් සිනමාපට පිළිබඳ නොවෙනස්වනසුළු හඳුන්වාදීම් අතික්‍රමණය කරන බවත් පෙනී යනවා. මේ අනුව දේශපාලනික සිනමාපටයක නිල හෝ නොනිල දේශපාලනික චරිත, සිදුවීම් හෝ සිදුවීම්මාලා හෝ දක්නට නොලැබෙන අවස්ථා ද පවතින බව වටහා ගන්නට පුළුවන්.

සිරිලකම සසල කළ දේශපාලනික කාරණා තෝරා ගැනීමට ගෙවුණු දශක ගණනාවේ ම දැරූ ප්‍රයත්න පිළිබඳ විමසීමකදී දත හැකි එක් බැහැර කළ නොහැකි කරුණක් මෙතැනදී සිහිපත් කරලීම වැදගත්. ඒ, මෙබඳු තෝරා ගැනීම් කෙතෙක්දුරට යුක්ති සහගත ද යන්න. එසේ ම මෑතකදී 'සිරිලක සසල කළ ඇතැම් දේශපාලනික කාරණා විෂය කර ගැනීමේ යම් පැකිලීමක් දැකිය හැකි ය' යන්න ද අමතක කරන්නට බැහැ. සිනමා නිර්මාණකරණය, නිපැයුම අරභයා පවතින ඉඩකඩ මනාව උපයෝගී කර නොගැනීමක් පිළිබඳ අදහසක් ද මෙතැනදී ගම්‍ය වන්නේ නිරායාසයෙන්.

තමා දිවි ගෙවන සමයේදී අත්දුටු දේශපාලනික කාරණා සිනමාගත කිරීමට දැරූ ප්‍රයත්නයි මෙහිලා අවධානයයට ලක් කෙරෙන්නේ. මේ අනුව ගාමිණී ෆොන්සේකා, රන්ජිත් කුරුප්පු, ඩී.බී. වර්ණසිරි, උදයකාන්ත වර්ණසූරිය, බෙනට් රත්නායක, අනුරුද්ධ ජයසිංහ, ෂෙල්ටන් පයාගල වැනි සිනමාකරුවන් පිරිසකගේ සිනමා ප්‍රයත්න සලකා බලන්නට හැකියාව තිබෙනවා. ඔවුන් විසින් 1970-1977 සිරිලක පාලන තන්ත්‍රය, 1971 අප්‍රියෙල් සිදුවීම්, තිස් වසක් තිස්සේ ඇදී ගිය යුද්ධය, පුවත්පත් මණ්ඩල පනත නිසා ඇතිවූ ව්‍යාකූලතා, 1983 ජූලි ජනවාර්ගික ගැටුම්, 1988 -1990 සමයේ උණුසුම, 1994න් පසු සමයේ දේශපාලනමය තීන්දු හා ඒවායේ ප්‍රතිඵල විෂය කර ගනු ලබන්නේ වෙසෙසින් ම විද්වත් රසිකයන්ගේ තියුණු ප්‍රතිචාර ලබමින්. මේ ප්‍රතිචාර වෙතින් එකඟ නොවීමේ ලකුණු ද එකඟ වීමේ ලකුණු ද හරි හරියට දක්නට ලැබෙන බව සඳහන් කළ යුත්තක්.

ධර්මසේන පතිරාජ, ප්‍රසන්න විතානගේ, අශෝක හඳගම, විමුක්ති ජයසුන්දර යන සිනමාකරුවන් සිරිලක දේශපාලනික සිනමාව පොහොසත් කරන්නේ ඍජු චරිත, සිදුවීම් හෝ සිදුවීම්මාලා හෝ රහිත ව. 'බඹරු ඇවිත්', 'සොල්දාදු උන්නැහේ', 'ඉර මැදියම', 'ඉනි අවන්', 'සුළඟ එනු පිණිස' මෙතැනට රැගෙන ආ හැකි නිදසුන් කිහිපයක්. මේ සිනමාපට සමකාලීන ව සේ ම පසුකාලීන ව ද විවිධ විචාරාත්මක සංකථන සඳහා පාදක වනවා.

සිනමාවේ සියුම් සංජානන සමත්කම ප්‍රශස්ත ව වඩවනු පිණිස උත්සුක වන තරුණ හා ප්‍රතිභාසම්පන්න සිනමාකරුවන් පිරිසකගේ සපැමිණීමක්




පසුගිය අවදියේ සිරිලක දේශපාලන බිම මත දත හැකිවූ සුවිශේෂ චරිත, සිදුවීම් හා සිදුවීම්මාලා අත් නොහැරීම සිනමාකරුවන් මත පැටවෙන වගකීමක්. '2015, 2019 හා 2024 යන වසර විෂයෙහි සිරිලක පාලන තන්ත්‍රයේ වූ බල හුවමාරු, පාස්කු දින ප්‍රහාරය, අනපේක්ෂිත ආර්ථික අර්බුදයෙන් සිදුවූ හානිය, කොවිඩ් වසංගත සමයේ නොදුටු පැති, ගෝල්ෆේස් පාදක ව ඇරඹුණු ජන අරගලය, බලසම්පන්න දේශපාලන චරිත හා මතවාද බණ්ඩනය දේශපාලනික සිනමාපට නිමැවුමට කදිම තෝරා ගැනීම් ය' යන්න පැහැදිලි කරුණක්.

වත්මන් සිරිලක සිනමාව වෙතින් දක්නට පුළුවන්. අවාසනාවකට සිය සිනමාපට නිර්බාධිත ව සිනමාශාලා වෙත මුදාහැරීමේ පුළුල් සමත්කමක් මොවුන් වැඩිදෙනකු සතු ව නැහැ. තවමත් සිරිලක සිනමාව මෙහෙයවන හා හසුරුවන පාර්ශ්ව තරුණ හා ප්‍රතිභාසම්පන්න සිනමාකරුවන්, නිපැයුම් පාර්ශ්ව හා ඒ ඒ අනුෂාංගික අංග නියෝජනය කරන්නවුන් සම්බන්ධයෙන් දක්වන්නේ ප්‍රමාණවත් නොවන අවධානයක්. මෙහෙයින් සිනමා පරපුරක් ම සැඟවී යාමට ඉඩ තිබෙනවා. ජීවිතයේ, සමාජයේ හා පුද්ගල සබඳතා ආදියේ ඇතැම් ඉසව් විෂය කර ගැනුමට මේ සිනමාකරුවන් දක්වන උනන්දුව අතිමහත්. එනමුදු සමකාලීන ව තමන් අත්විඳින දේශපාලනික තතු විෂය කර ගන්නට මොවුන් දක්වන උනන්දුව සම්බන්ධයෙන් සෑහීමකට පත්වන්නට බැහැ.

පසුගිය අවදියේ සිරිලක දේශපාලන බිම මත දත හැකිවූ සුවිශේෂ චරිත, සිදුවීම් හා සිදුවීම්මාලා අත් නොහැරීම සිනමාකරුවන් මත පැටවෙන වගකීමක්. '2015, 2019 හා 2024 යන වසර විෂයෙහි සිරිලක පාලන තන්ත්‍රයේ වූ බල හුවමාරු, පාස්කු දින ප්‍රහාරය, අනපේක්ෂිත ආර්ථික අර්බුදයෙන් සිදුවූ හානිය, කොවිඩ් වසංගත සමයේ නොදුටු පැති, ගෝල්ෆේස් පාදක ව ඇරඹුණු ජන අරගලය, බලසම්පන්න දේශපාලන චරිත හා මතවාද බණ්ඩනය දේශපාලනික සිනමාපට නිමැවුමට කදිම තෝරා ගැනීම් ය' යන්න පැහැදිලි කරුණක්.

මෙබඳු තෝරා ගැනීම් වළක්වන තතු කිසිවක් දක්නට ද නැහැ. සිනමාකරුවන්ගේ ප්‍රකාශන හිමිකම සුරැකීම සිය පරම වගකීමක් කොට සලකන නව සිනමා බලධාරීන් හෙට දිනයේදීත් එසේ ම ක්‍රියා කරනු ඇතැයි යන්න සිනමාකරුවන් ඇතුළු සිනමා නිර්මාණ පාර්ශ්වයේ හා විද්වත් රසික පාර්ශ්වයේ අපේක්ෂාවක්. එසේ ම මෙහිලා උචිත දිරිගැන්වීම් සහතික කරලීම කෙරෙහි බලධාරීන් අවධානය යොමු කළ යුතු වනවා. නව කල්පනා සහිත නවක සිනමාකරුවන් පසුපසට යන්නේ ම නිපැයුම් පාර්ශ්ව සපයා ගත නොහැකි වීම ද නිසා. සිනමා බලධාරීන් මේ කෙරෙහි ද අවධානය යොමු කළ යුතු වනවා. ඉන් යම් අගතිගාමී බලපෑමක් සිදුවන්නේ නම් එය පරාජය කිරීම ද ඔවුන්ගේ වගකීමක්.




# GFU
## රූපමය පෙළහර 4

චානුක දුල්ශාන් ද මැල්


මෙවර අප ඔබට ආරාධනා කරන්නේ රජයේ චිත්‍රපට අංශයේ යූටියුබ් නාලිකාවට (GFU Sri Lanka) පිවිස The Living Wild චිත්‍රපටය නරඹා රසඥතාව වර්ධනය කර ගැනීමටත් ඉතිහාසය යළි කියවා ගැනීමටත්. ඒ අනුව මේ ගෙනෙන්නේ චිත්‍රපට පිළිබඳ පසුබිම් කතා ඇතුළත් සිව් වැනි කෙටි විමසුම.

වැන්කුවර් ජාත්‍යන්තර සිනමා උළලේ සම්මානයට පාත්‍ර වූ The Living Wild වාර්තා සිනමාපටය 1959 වර්ෂයේදී රූගත කරන ලද්දක්. මි.මි 35 කාණ්ඩයේ වර්ණ වාර්තා සිනමාපටයක් වූ මෙය ධාවනය වන්නේ මිනිත්තු 30ක කාලයක්. මෙරට වැදි ජනයාගේ ජීවන මුද්‍රාව අඩංගු මානව විද්‍යාත්මක වටිනාකම පිළිබඳ අල්පමාත්‍රයක සිදුවිම් අඛ්‍යානයක් රූපමය භාෂාවෙන් මෙලෙස පෙළ ගස්වා තිබෙන්නේ අර්වින් දසනායක. ඊට ඉංග්‍රිසි භාෂාවෙන් පසුබිම් කථනය කරන්නේ හර්බට් කෙව්නිමන් හා ඇල්ෆ්‍රඩා ද සිල්වා. ඒ, චලනය වන රූප ඛණ්ඩවලට ජීවමය ගුණයක් ලබා දෙමින්. හුසේන් මොහොමඩ් විසින් ජන සංගීතය ස්වාභාවික ශබ්දයෙන් හැඩ කර ඇති මෙහි ලීයෝ වික්‍රමරත්න හා සනත් ලියනගේ තෙවැනි ඇසට හසුකරගත් රූප එකට ගළපා ඇත්තේ ජුවාන් ඒ කමුර්. එෆ් සේරා The Living Wild වාර්තා සිනමා පටයේ ශබ්ද පරිපාලනය කර තිබෙනවා.

කතන්දරය ගොඩනැගෙන්නේ වනගත මිනිසාගේ චර්යාව පදනම් කරගෙන. වන දිවිය කටුක වුවත් අවදනම් සහගත වුවත් ආදී මානවයා ගත කළ දිවියේ රැඳී තිබුණේ සංතෘප්ත බවක්. එහෙත් වනන්තරයත් සතා සීපාවත් ගහ කොළත් අතර ආදි මිනිසාගේ කාලාන්තරයක් පැවැති සුසංගත ලැබැඳියාව ජනාවාස ඇතිවීමත් සමග බිඳ වැටී වත්මන වන විට ඉතා සංකීර්ණ වී තිබෙනවා. දිගුකාලීන මානව චර්යාව පරිසරය ද වෙනස් කර ඇති අතර මානව සංස්කෘතිය ද සොබාදහම සමග ම පරිණාමය වී තිබෙනවා. එසේ ම සොබාදහමෙන් මිනිසා ඈත් ව සිටින බවත් වාර්තා සිනමාපටයෙන් අපට සිහි ගන්වනවා.

මෙවැනි පසුබිමක ගංගාවක් ආපස්සට හැරවිය නොහැකි සේ මානව ජීවන රටාව, ආධ්‍යාත්මික ගුණ වගාව, සාරධර්ම ආදිය පෙර පැවැති තත්ත්වයට පත්කරලීම කළ නොහැක්කක්. මානව කුටුම්භයේ පෙර පැවැති ළැබැඳියාව, පතිපතිනි භක්තිය, දාරක ස්නේහය, සදාචාරය, සංහිඳියාව වැනි ගුණාංග නැවත ඇති කිරීමත් කළ නොහැකි කාර්යයක්. කළ හැක්කේ මතුපරපුරයට දැකගැනීම සඳහා ඒවා ගැඹුරින් විමසා බලා විග්‍රහකර යථා ආකාරයෙන් එය වාර්තා කර තැබීම. Tha Living Wild වාර්තා සිනමපටය අප වඩාත් අගය කළ යුතු වන්නේ මේ දෘෂ්ටිකෝණයෙන්. එදා එලෙස රූපගත නොවන්නට තත්කාලීන වනගත දිවිය පිළිබඳ මෙකල වසන අපට ඉතිරි වනුයේ බොඳ ව ගිය අඳුරු චිත්‍රයක්.














# හෙළ මුද්‍රා නාටකයේ කාන්තා මුද්‍රාව

## වජිරා චිත්‍රසේන

සුභා රත්නායක

ශ්‍රී ලාංකේය නර්තන කලාවේ කාන්තා භූමිකාවේ පෞරුෂවත් ම මුද්‍රාව ලෙසින් දේශීය සහ ජාත්‍යන්තරය හඳුනාගෙන ඇති වජිරා චිත්‍රසේන නොබෝදා (සැප්තැම්බර් 23) තම දිවිසැරිය නිමා කළේ වයස අවුරුදු 92ක පරිපූර්ණ ජීවිතයක ගෞරවය උරුම කර ගනිමින්. 'වජිරා' හෙළයේ මහා නර්තන ශිල්පී චිත්‍රසේනයන් විසින් දේශීය නර්තන කලාවටත් ලෝකයටත් දායාද කරනු ලැබූ අපූර්වතම ශිල්පිනියක්. මහත් වූ ප්‍රතිභාව, කැපවීම සහ අනාගතවාදී දෘෂ්ටිකෝණය විසින් ලාංකික නර්තන කලාවේ කාන්තා භූමිකාවට නව මංපෙත් විවර කර දෙනු ලැබීම වජිරාවන්ගේ එම අපූර්වත්වය විශද කරන්නක්.


ශ්‍රී ලංකාවේ ප්‍රධාන නර්තන සම්ප්‍රදා අතුරින් උඩරට නර්තන සම්ප්‍රදාය හඳුනා ගැනෙන්නේ තාණ්ඩව ලක්ෂණ බහුල නැටුම් සම්ප්‍රදායක් ලෙස. කාන්තාවන්ට නර්තනය අකැපයැයි දෘෂ්ටිවාදී ව සමාජය පිළිගත් පසුබිමක එම දෘෂ්ටිවාදයට අභියෝග කරමින් පුරුෂාධිපත්‍ය මත දිග හැරුණු නර්තන ක්ෂේත්‍රයට වජිරාවන්ගේ පිවිසීම ම ඇයගේ උත්තුංග පෞරුෂයේ නොසෙල්වෙන බව කියාපාන්නක්. 1943 වසරේදී තමා උපන් කළුතර ප්‍රදේශයේ, එනම් කළුතර නගර ශාලාවේ කේවල නර්තනයක නිරත වෙමින් වේදිකාවට අත්පොත් තැබූ ඇය ලොවෙන් සමුගන්නේ ශ්‍රී ලංකාවේ පළමු සහ විශිෂ්ටතම නර්තන ශිල්පිනිය ලෙස. 1948 වසරේදී පාසල් අධ්‍යාපනයෙන් ඉවත්වන ඇය ඉන්පසු තම ජීවිතය ම කැප කරන්නේ පූර්ණකාලීන නර්තන ශිල්පිනියක් ලෙස. ඇයගේ නර්තන ගුරුවරයා වන්නේ ශ්‍රී ලංකාවේ පළමු වෘත්තීය නර්තන ශිල්පියා ලෙස අභිමන් ලබන එම්. ඩී. චිත්‍රසේනයන්. තම ගුරුවරයා, තම ජීවන සහකරුවා ද බවට පත්වීම ඇයගේ සහජ ප්‍රතිභාව ඇයගේ 'හඳුනාගැනීම' බවට රූපාන්තරණය කරන සන්ධිස්ථානයක්.

ප්‍රසිද්ධ වේදිකාවට අවතීරණය වූ ලංකාවේ ප්‍රථම වෘත්තීය කාන්තා නර්තන ශිල්පිනිය වන වජිරාගේ පළමු ප්‍රසිද්ධ රංගනය වන්නේ ලංකාවට නිදහස ලැබීම නිමිත්තෙන් ජේ.ඩී.එන්. පෙරේරා විසින් නිෂ්පාදනය කරන ලද පැජෙන්ඩ් ඔෆ් ලංකා ප්‍රසංගයේ ඉදිරිපත් කළ, චිත්‍රසේනයන් නිර්මාණය කළ 'රාමායනය' නර්තනයේ 'රන් මුවැත්තියක්' ලෙස කළ රංගනය. එම වසරේදී ම චිත්‍රසේනයන් විසින් නිර්මාණය කරන ලද 'චණ්ඩාලි' මුද්‍රා නාට්‍යයේ ප්‍රධාන භූමිකාව රඟන්නේත් වජිරාවන්. චිත්‍රසේනයන්ගේ රිද්මයෙහි හුස්ම ගනිමින්, නර්තනය ජීවිතයට බද්ධ කරගත් ඇය ජගත් ප්‍රේක්ෂක සහ විචාරක පැසසුම් ලබා ගන්නේ නර්තන ශිල්පිණියක සහ රංග වින්‍යාස ශිල්පිණියක ලෙස ඇය දැක්වූ අසමසම ප්‍රතිභාව නිසා.

ඇය මුද්‍රා නාට්‍ය ශිල්පිනියක් ලෙස තම චාරිකාව අරඹන්නේ 'කුමුදුනී' නම් ළමා මුද්‍රා නාට්‍යයෙන්. එයට සංගීතය සපයන ලද්දේ ආනන්ද සමරකෝන් ශූරීන් විසින්. ඉන් ඇරඹි ඇයගේ මුද්‍රා නාට්‍ය චාරිකාව 'වනජ, රන් කිකිළි, නිල්යකා, නිරාශා, අණ බෙරය, හපනා වැනි ළමා මුද්‍රා නාට්‍ය සහ 'ගිනි හොරා, චණ්ඩාලිකා, රශෝමෝන්, බෙරහඬ, ශිව රංග ආදී කලාත්මක මුද්‍රා නාට්‍ය ගණනාවක අස්වැන්නකින් පෝෂණය වූ කෙත්බිමක්. 1965 සහ 1972 වසරවල නිර්මාණය වූ චිත්‍රසේනයන්ගේ නිත්‍යාංජලී සහ නවාංජලී නර්තන ප්‍රසංග සඳහා ශාස්ත්‍රීය, අර්ධ ශාස්ත්‍රීය හා ජන නැටුම් ගණනාවක් නිර්මාණය වන්නේ වජිරාවන්ගෙන්. ලී කෙළි, සවරන්, රබන්, තාලම් වැනි ජන නැටුම් නූතන වේදිකාව සඳහා ප්‍රතිනිර්මාණය කරමින් ඇය ක්ෂේත්‍රයට හඳුන්වා දුන්නේ නව රංග වින්‍යාස ව්‍යාකරණයක්. අද දක්වා බොහෝ ආධුනික නිර්මාණකරුවන්ට ඇය ගුරු අත්පොතක් සහ පාඨශාලාවක්.

'ප්‍රීමා බැලරිනා' බටහිර බැලේ නර්තන කලාවේ අග්‍රගණ්‍ය චරිතයක්. වජිරා චිත්‍රසේන ලාංකික නර්තන කලාවේ 'ප්‍රීමා බැලරිනා' යැයි ප්‍රකට නාට්‍යවේදියකු, විචාරකයකු වන බන්දුල ජයවර්ධනගේ මතය වනවා. ලෝකයේ උසස් ම මුද්‍රා නාට්‍ය කලාවේ විචාරකයන් විසින් ඇය ජගත් මුද්‍රා නාට්‍ය කලාවේ මහා සලකුණ වන ගලීනා උලනෝවාට සමාන කරනු ලබනවා. මුද්‍රා නාට්‍ය කලාවේ ජීවය වන්නේ නර්තනය, රංගනය සහ සියුම් භාව ප්‍රකාශනය යන අංග ත්‍රිත්වය. වජිරාවන්ගෙන් විහිදුණු එකී ජීවය ඇය ව ගලිනා උලනෝවාට සමාන කිරීමට සුදුසුකම් සපුරා දෙනවා. විශේෂයෙන් ඇගේ 'හංස නැටුම' එයට උදාහරණයක්. ලාංකික මුද්‍රා නාට්‍යය කලාවේ ඓතිහාසික උරුමයක් බවට පත් ව ඇති චිත්‍රසේනයන්ගේ 'කරදිය' සහ 'නල දමයන්ති' කෘතිවල සාර්ථකත්වය පිටුපස ඇති ප්‍රබල හස්තය වජිරාවන්ගේ ජව සම්පන්න රංගනය. සංගීතය සහ සෞන්දර්ය ගුණයෙන් අනූන 'නල





දමයන්ති'හි හංසයා ලෙස ඇය විහිද වූ භාවපූර්ණ රංගනය ශිල්පියකුගේ උපරිම ධාරිතාව සටහන් කරන්නක් ලෙසයි විචාරක අදහස වන්නේ.

නිවැරදි රේඛා චලන, සෞන්දර්යපූර්ණ හැඩතල, විශ්මයජනක සංයමයකින් යුතු එහෙත් ප්‍රකාශනාත්මක රංගනය හේතුවෙන් වජිරා අත්පත් කරගන්නේ මුද්‍රා නාට්‍ය සහ නර්තන ක්ෂේත්‍රයේ වෙනත් ආදේශ කළ නොහැකි පෞරුෂයක්. නර්තනයට සහ රංගනයට පමණක් සීමා නොවන ඇයගේ අසමසම ප්‍රතිභාව වේදිකා රංග වින්‍යාසය නම් ක්ෂේත්‍රය ද ඇය සතු කර ගැනීමට තරම් සමත් වන්නක්. ඒ අර්ථයෙන් ඇය අභිභවා යන්නට සමත් ශ්‍රී ලාංකික ශිල්පිණියක් තවමත් බිහි නොවී ඇති බවයි විෂය ප්‍රාමාණික විද්වතුන්ගේ මතය. කලා ශූරී, ආචාර්ය රවිබන්දු විද්‍යාපති පවසන ආකාරයට උඩරට නැටුම් ශිල්පියකුගේ සිට නූතන වේදිකා නර්තන ශිල්පියකු දක්වා වූ අන්ත දෙකක් නියෝජනය කරන ශිල්පියාට පුහුණුවීමට අවශ්‍ය විවිධ ශිල්පක්‍රම ඇතුළත් පුහුණු විෂය නිර්දේශයක් නිර්මාණය කිරීම වජිරා චිත්‍රසේනයන්ගෙන් සිදු වූ ඓතිහාසිකම කාර්යභාරය වනවා. එය ඇයගේ ප්‍රතිභාව, අධ්‍යයනයේ ගැඹුර සහ අනාගතවාදී දෘෂ්ටිකෝණයේ ප්‍රබලත්වය ප්‍රතිමූර්ත කරවන්නක්. උඩරට කාන්තා නර්තන ශිල්පයේ හැඩතල ආකෘතිය ප්‍රමිතිගතභාවය සම්මතකරණයෙහි පුරෝගාමියා ද ඇය. දීර්ඝකාලීන, අඛණ්ඩ අභ්‍යාසය, විෂය සහ ක්ෂේත්‍රය සම්බන්ධ ඇය සිදු කළ අධ්‍යයනවල සාරවත් ඥානය, ඇයගේ අත්දැකීම් නැටුම් ශිල්පිණියක සිට රංග වින්‍යාස ශිල්පිණියක් ලෙස ඇය ව උස්මහත් කරනවා පමණක් නොව එහි ශාක්‍ය ලීලාව ද ඇයට උරුම කර දෙනවා.


ඇය නිර්මාණය කළ 'ගිනි හොරා' මුද්‍රානාට්‍ය සහ 'ශිව රංග' මුද්‍රා නාට්‍යය වජිරාගේ රංග වින්‍යාස අභ්‍යාස අතර සුවිශේෂ කෘති. චිත්‍රසේනයන්ගේ ශිෂ්‍යාවක ලෙස ආරම්භ කරන ලද වජිරාගේ නර්තන දිවිය අඛණ්ඩවූත් දීර්ඝවූත් උරුමයක්. ජාතික පමණක් නොව ජාත්‍යන්තර වේදිකාව මෙන් ම රංග ශාලාහි ප්‍රේක්ෂකයන් ඇය දිනා ගන්නේ ඉතිහාසයට නොමැකෙන සලකුණක් ඉතිරි කරමින්. වජිරාවන්ගේ දියණියත් ඇයගේ මිණිපිරියත් යන දෙදෙනාත් ඉදිරියට රැගෙන යන්නේ ඇය විසින් ආරම්භ කර, දියුණු කරන ලද ලාංකික කාන්තා නර්තන කලාවේ ප්‍රබුද්ධ ස්වරූපය. එය ජාතියක් ලෙස අපට සතුටු විය හැකි මෙන් ම උරුමයක් ලෙස ඇය ඉතිරි කළ ගිය වටිනාම දායාදය. ඇයගේ බාලම මිණිපිරිය තජී, ඇයගේ මග යමින් ජාතික සහ ජාත්‍යන්තර නර්තන ශිල්පිනියක් ලෙස ලොව ජයගත්තියක්. ඇයගේ වැඩිමහල් මිණිපිරිය රංග වින්‍යාස ශිල්පිනියක් ලෙස අත්තම්මාගේ මුද්‍රාව තවත් ලෙසකින් බබලවන්නියක්. වජිරාවන්ගේ සමු ගැනීම ජාතියට ම පිරවිය නොහැකි හිඩැසක් වුවත් ඇය බොහෝ මහන්සියෙන්, අරපිරිමැස්මෙන්, අධිෂ්ඨානයෙන් රැකගෙන වර්ණවත් සහ සාරවත් කළ කලාව රැගෙන යාමට පරම්පරාවක් සිටීම ගැන අද දවසේ අපට සතුටු වන්නට පුළුවන්.

නිවැරදි රේඛා හා හැඩතල පවත්වා ගනිමින් සාම්ප්‍රදායික රාමුව නොබිඳිමින් එය වඩාත් ප්‍රසාරණය කරමින් උඩරට නර්තනයෙහි ලාස්‍ය ආකෘතිය ස්ථාපිත කිරීම, 'කරදිය'හි සිසී, 'නල දමයන්ති'හි හංසයා හා 'චණ්ඩාලිකා'හි 'මායා' වැනි චරිත ඔස්සේ ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය චරිතාංග රංගනය පිළිබඳ ප්‍රමිති සකස් කිරීම, 'කරදිය', 'නල දමයන්ති', 'කිංකිණි කෝලම', 'ශිව රංග' යන මුද්‍රා නාට්‍ය හා අනෙකුත් මුද්‍රා නාට්‍යවල රංග රචනා ඔස්සේ ශ්‍රී ලංකාවට උචිත නූතන මුද්‍රා නාට්‍ය රංග වින්‍යාස හා අංග චලන ව්‍යාකරණයක් හඳුන්වාදීම, 1950 දශකයේ සිට පුරෝගාමී ළමා මුද්‍රා නාට්‍ය නිර්මාණය කරමින් ඒ සඳහා පැහැදිලි ආකෘතියක් හඳුන්වාදීම, හුදු සාම්ප්‍රදායික නර්තනයෙන් පරිපූර්ණ වේදිකාව නර්තන ශිල්පියකු පුහුණු කිරීම සඳහා සාම්ප්‍රදායික මූලයන්ගේ ආභාසයෙන් පුළුල් සරඹ අභ්‍යාස හා චලන මාලාවක් නිර්මාණය කිරීම, තමාගෙන් පසු ජාතික තලයට පැමිණිය හැකි වෘත්තීය මට්ටමේ දෙවැනි ගෝල පරපුරක් බිහි කිරීම, වසර 70ක ශ්‍රී ලාංකේය නව නර්තන ඉතිහාසයේ ගුරුවරියක හා නිර්මාණ ශිල්පිණියක වූ වජිරා චිත්‍රසේනයන් අතික්‍රමණය කිරීමට කිසිදු ලාංකේය නර්තන ශිල්පිනියකට මෙතෙක් නොහැකි වීම ලෙස වජිරාවන්ගේ සමස්ත කලා මෙහෙවර ධාරා කිහිපයක් ඔස්සේ ආචාර්ය රවිබන්දු විද්‍යාපති සම්පිණ්ඩනය කර දක්වනවා.

2020 වසරේදී ඉන්දියාවේ සිව් වැනි ඉහළ ම සම්මානය ලෙස සැලකෙන 'පද්ම ශ්‍රී' සම්මානයෙන් ඇය පිදුම් ලබන්නේ, ලාංකේය කාන්තා නර්තනයේ ප්‍රගමනය උදෙසා ඇය කළ අසමසම මෙහෙවර වෙනුවෙන්. එසේ ම 2011 වසරේදී සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය ඇයට දර්ශන විශාරද උපාධිය පිරිනමනවා.

වසර 92ක් දක්වා විහිදුණු වජිරාවන්ගේ ගමන් මග ඇයට 'ජීවිතය' වුව ද අපට එය ජාතියක් ලෙස ආදේශ කළ නොහැකි වටිනාකමක්, ඉතිහාසයක් සහ උරුමයක්.

# නොබෙල් සාහිත්‍ය තෑග්ග






ප්‍රියන්ජන් සුරේෂ් ද සිල්වා

සාහිත්‍යය සඳහා වන නොබෙල් ත්‍යාගය-2024 හිමි කරගෙන ඇත්තේ දකුණු කොරියානු ලේඛිකා හැන් කැංග්. ඒ, ඇය රචිත 'ද වෙජිටේරියන්' (THE VEGETARIAN) නවකතාව උදෙසා. නොබෙල් සාහිත්‍ය කමිටුව හැන් කැංග්ගේ නවකතාව හඳුන්වා ඇත්තේ 'ඓතිහාසික කම්පනයන්ට මුහුණදෙන සහ මිනිස් ජීවිතයේ බිඳෙනසුලු බව හෙළිදරව් කරන තීව්‍ර ගද්‍ය කාව්‍යයක් ලෙස. නොබෙල් සාහිත්‍ය කමිටු සභාපති ඇන්ඩර්ස් ඕල්සන් ප්‍රකාශ කළේ ආත්මය සහ ශරීරය, ජීවත් ව සිටින අය සහ මළවුන් අතර ඇති සබඳතා පිළිබඳ ඇයට සුවිශේෂ අවබෝධයක් පවතින අතර ඇයගේ කාව්‍යමය හා පර්යේෂණාත්මක ලේඛන ශෛලිය සමකාලීන ගද්‍ය සාහිත්‍යයේ නවෝත්පාදකයක් වී ඇති බව. නොබෙල් සාහිත්‍ය ත්‍යාගය ලෙස ඇයට හිමි වූ මුදල ඇමරිකානු ඩොලර් මිලියන 1.1ක්.

ඇය සාමාන්‍ය ලෙස දිනය ගත කරන බවක් පෙනෙන්නට තිබුණා. ඒ වෙලාවේ ඇය තම පුත්‍රයා සමග රාත්‍රී ආහාරය ගෙන අවසන් වුණා පමණයි. ඇයට සම්මානය හිමි ව ඇති බව පැවසූ විට එය අදහා ගත නොහැකි වුණා.

'ද වෙජිටේරියන්' නවකතාවට පාදක වන්නේ යළි කිසි දිනෙක මස් මාංශ අනුභව නොකරන්නට එක්තරා රැයක හදිසියේ තීරණය කළ මැදිවියේ කොරියානු කාන්තාවකගේ කතාවක්. එම තීරණය හේතුවෙන් ඇයට මුහුණදෙන්නට සිදුවන අප්‍රසන්න සිදුවීම් කිහිපයක් පාදක කරගනිමින් මේ කෘතිය රචනා වී තිබෙනවා. නිහඬ චරිතයක් වන කාන්තාවගේ කතාව ගලා යන්නේ ඇගේ සැමියා, ඇගේ මස්සිනා සහ ඇගේ වැඩිමහල් සහෝදරිය තරන ආඛ්‍යාන තුනක් ඔස්සේ. ඔවුන්ගේ විවිධ ප්‍රතිචාර, කොන් කිරීම්, පිළිකුල සහ ලිංගික ආකර්ෂණය, ඊර්ෂ්‍යාව, පවුලට සිදු වූ අපකීර්තිය වැනි කරුණු මත මානසික ආතතියට පත් වන කාන්තාවක ඇගේ පවුලෙන් නොසලකා හැරීම යන තේමාවක් ඔස්සේ නවකතාව ගලා යනවා. මේ ප්‍රතිචාරවලින් වෘත්තීයවාදයෙන් සහ දැඩි, ඇතැම් විට පීඩාකාරී සමාජ සම්මත මෙන් ම සම්මුතිවලින් පිරුණු පීතෘමූලික සමාජයක් පිළිබඳ කැඩපතක් පාඨකයාට ඉදිරිපත් කරන්නට ලේඛිකාව සමත් වනවා.

කොරියානු බසින් ග්‍රන්ථකරණයේ යෙදෙන 53 හැවිරිදි හැන් කැංග් වාසය කරන්නේ දකුණු කොරියාවේ සෝල් නගරයේ. 1970 නොවැම්බර් 27 දින ග්වංජුහි උපත ලද ඇය කොරියානු නවකතාකරුවකු වන හැන් සෙං-වොන්ගේ දියණිය. ඇගේ සොහොයුරු හැන් ඩොං රිම් ද ලේඛකයෙක්. හැන් කැංග් සෝල් ඉන්ස්ටිටියුට් ඔෆ් ආට් ආයතනයේ නිර්මාණාත්මක රචනය පිළිබඳ ගුරුවරියක්.

'ද වෙජිටේරියන්' නවකතාවට පෙර ඇය නවකතා කිහිපයක් ම රචනා කර තිබෙනවා. ඇගේ පළමු නවකතාව 'ලව්

ඉන් යෙවුසු' නිකුත් වුණේ 1995දී. 'වී ඩූ නොට් පාට්', 'බ්ලැක් ඩියර්' (1998) 'මයි වුමන්ස් ෆෲට්' (2000) 'යුවර් කෝල්ඩ් හැන්ඩ්ස්' (2002) 'ග්‍රීක් ලෙසන්ස්' (2011) 'හියුමන් ඇක්ට්ස් (2014) සහ 'ද වයිට් බුක්' (2016) ඇය පළ කළ අනෙක් නවකතා. ඇගේ නවකතා අතරින් පළමුවරට ඉංග්‍රීසි බසට පරිවර්තනය වූයේ 2007 රචිත 'ද වෙජිටේරියන්' නවකතාව. එයට 2016 මෑන් බුකර් සම්මානය ද හිමි වුණා. ඇගේ පියා වන හැන් සෙං වොන් තම දියණියගේ ජයග්‍රහණය පිළිබඳ සඳහන් කරමින් කියා සිටියේ තම දියණියගේ කෘතිය ඉංග්‍රීසි බසට පරිවර්තනය වීම හේතුවෙන් ඇයට ජාත්‍යන්තර සම්මාන දිනා ගැනීමට හැකි වූ බව. "මගේ දියණියගේ ලේඛනය ඉතා සියුම්. ඒවා සුන්දර මෙන් ම වේදනාබර රචනා. ඒ වේදනාබර රචනා කොරියානු බසේ අද්විතීය රසය නොමරා විදේශීය බසකට සාර්ථක ලෙස පරිවර්තනය කිරීමේදී ඇගේ ජයග්‍රහණය රැඳී තිබුණා." යනුවෙන්.

ඇගේ ඇතැම් කෘති කොරියානු සමාජය මුහුණ පෑ ඛේදවාචක අළලා රචනා වී තිබෙනවා. 'හියුමන් ඇක්ට්ස්' කෘතියට පාදක වී ඇත්තේ 1980දී දකුණු කොරියානු හමුදාව විසින් ග්වංජු නගරයේ සිවිල් වැසියන් සිය ගණනක් සමූලඝාතනය කිරීම සහ දකුණු කොරියානු ඉතිහාසයේ වේදනාකාරී පරිච්ඡේද. 'වී ඩූ නොට් පාට්' කෘතිය 1948-1954දී ජේජු දූපතේ සිදු වූ සමූලඝාතන ඇසුරින් රචනා කර තිබුණා. එම දිවයිනේ ජනගහනයෙන් දස දෙනකුගෙන් එක් අයකු කොමියුනිස්ට් විරෝධීන් ලෙස සලකා කළ ඝාතන පිළිබඳ ඇය අවධානය යොමු කර තිබුණා. "එම නවකතාවලින් වින්දිතයන්ගේ සහ දිවි ගලවා ගත් අයගේ ආත්මයන් ඔවුන් විඳි වේදනාවෙන් සහ කම්පනයෙන් සුවපත් වනු ඇතැයි මම සැබවින් ම අපේක්ෂා කරමි." යනුවෙන් ජේජු සමූලඝාතනයෙන් වියෝ වූ පවුල් සඳහා වූ සංගමයේ සභාපති කිම් චැං-බීම් එම කෘතිය පිළිබඳ අදහස් දක්වමින් සඳහන් කර තිබුණා.

හැන් කැංග්ට නොබෙල් සාහිත්‍ය ත්‍යාගය හිමි වූ බවට ප්‍රචාරය වීමත් සමග කොරියානුවන් වෙබ් අඩවි වෙත පිවිසීම මත ඒවාට පිවිසිය නොහැකි තත්ත්වයක් ඇති වුණා. දකුණු කොරියාවේ දැවැන්තම පොත් සාප්පු ජාලය වන කයොබොහි වෙබ් අඩවියට අනුව, නොබෙල් ත්‍යාග නිවේදනයට පසු දින සිට වැඩියෙන් ම අලෙවි වන පොත් දහයෙන් නවයක් ම හැන්ගේ පොත් බවට සඳහන්. රොයිටර් පුවත් සේවය වාර්තා කළේ 2024 සාහිත්‍ය සඳහා වූ නොබෙල් ත්‍යාගය අනපේක්ෂිත ලෙස ජයග්‍රහණය කළ හැන් කැංග්ගේ කෘතිවල පිටපත් මිල දී ගැනීමට දකුණු කොරියානුවන් උමතුවෙන් මෙන් පොත් සාප්පු වෙත පැමිණි බව.

"කොරියානු ජාතිකයකුට සාහිත්‍යය සඳහා නොබෙල් ත්‍යාගයක් ලැබුණු පළමු




හැන් කැංග්ට නොබෙල් සාහිත්‍ය ත්‍යාගය හිමි වූ බවට ප්‍රචාරය වීමත් සමග කොරියානුවන් වෙබ් අඩවි වෙත පිවිසීම මත ඒවාට පිවිසිය නොහැකි තත්ත්වයක් ඇති වුණා. දකුණු කොරියාවේ දැවැන්තම පොත් සාප්පු ජාලය වන කයොබොහි වෙබ් අඩවියට අනුව, නොබෙල් ත්‍යාග නිවේදනයට පසු දින සිට වැඩියෙන් ම අලෙවි වන පොත් දහයෙන් නවයක් ම හැන්ගේ පොත් බවට සඳහන්.


අවස්ථාවයි මේ. ඒ නිසා මා පුදුමයට පත් වුණා". "දකුණු කොරියාව නොබෙල් ත්‍යාගය දිනා ගැනීමේ විරල ජයග්‍රහණයක් ලබා තිබෙනවා. කොරියානු බසින් සාහිත්‍යකරණයේ යෙදෙන ලේඛිකාවක මෙතරම් විශාල ත්‍යාගයක් දිනා ගැනීම ඇදහිය නොහැකියි" යනුවෙන් ඇතැම් කොරියානුවන් ප්‍රකාශ කර තිබෙනවා.

නොබෙල් සාහිත්‍ය ත්‍යාගය දිනාගත් පළමු කොරියානුවා, නොබෙල් ත්‍යාග යක් දිනාගත් දෙවැනි කොරියානුවා, එම සම්මානයට හිමිකම් කියූ ලොව 18 වැනි කාන්තාව වන්නේ හැන් කැංග්. හමුදා පාලන සමයේ දකුණු කොරියාවේ ප්‍රජාතන්ත්‍රවාදය යළි ස්ථාපනය සඳහා දරන ලද උත්සාහය උදෙසා 2000 වසරේ දිවංගත ජනාධිපති කිම් ඩේ-ජුන්ග්ට නොබෙල් සාම ත්‍යාගය හිමි වුණා.

'ද ගාඩියන්' පුවත්පත සමග කළ සම්මුඛ සාකච්ඡාවකදී හැන් කැංග් පැවසුවේ තමාට වයස අවුරුදු 14 පටන් ලේඛිකාවක වීමට අවශ්‍ය වූ බව. "මම පළමු ව පාඨකයකු ලෙස ජීවිතයේ ප්‍රමුඛ ගැටලුවලට පිළිතුරු සොයමින් සිටියා. සෑම ලේඛකයකු ම ජීවිතය පිළිබඳ ගැටලුවලට පිළිතුරු සොයමින් සිටින බවත් ඔවුන්ට නිගමනයකට එන්නට නොහැකි වී ඇති බවත් පසුව මට වැටහුණා. එහෙත් ඔවුන් නොකඩවා රචනයේ යෙදෙනවා. මටත් හිතුණා ඇයි මමත් එහෙම කරන්නේ නැත්තේ කියලා. ඒ නිසා මම ලියන්න පටන් ගත්තා." යනුවෙන් ඇය සඳහන් කර තිබුණා. ඇගේ ලේඛන දිවිය ඇරඹුණේ කිවිඳියක ලෙසින්. පසුව නවකතාකරණයට එළඹෙන්නට ඇයට හැකි වුණා.

ඇය ජයග්‍රාහිකාව ලෙස ප්‍රකාශයට පත් කිරීමෙන් නොබෙල් කමිටුවේ ස්ථිර ලේකම් මැට්ස් මැල්ම් දුරකතනයෙන් හැංග්ට කතා කළා. එම අවස්ථාව පිළිබඳ ඔහු කියා තිබුණේ මෙලෙසින්. "ඇය සාමාන්‍ය ලෙස දිනය ගත කරන බවක් පෙනෙන්නට තිබුණා. ඒ වෙලාවේ ඇය තම පුත්‍රයා සමග රාත්‍රී ආහාරය ගෙන අවසන් වුණා පමණයි. ඇයට සම්මානය හිමි ව ඇති බව පැවසූ විට එය අදහා ගත නොහැකි වුණා. පසුව ඇය පැවසුවේ තමා එය නිහඬ ව සමරමින් තම පුත්‍රයා සමග තේ කෝප්පයක් පානය කරන බවයි."

මහින්ද කුමාර දළුපොත






# වන්නියලැත්තෝ

සිය පුද්ගල නාමය තම ජන උරුම සංස්කෘතික නියෝජනයක් සේ ප්‍රකට වන්නේ විශේෂිත පුද්ගලයන් අරභයා. 'වන්නියලැත්තො' එවැන්නෙක්. ලොකු පොඩි භේදයකින් තොර ව 'වන්නියලැත්තො' නාමය ඇසෙන පමාවෙන් දඹාන පෝරුගම් පොජ්ජේ වැදි ජන උරුමය එකවර ම ඒත්තු යනු ඇති. ඒ තරමට වත්මන් වැදි ජන නායක ඌරුවරිගේ වන්නියලැත්තන් සංස්කෘතික භූමිකාවක්. පරම්පරා වැදි ජන හිමිකමක්. සිය අප්පිලැත්තන් වූ තිසාහාමිලැත්තන් වැදි ජන නායකයා ලෙස හීන් පැටියා සන්දියේ පටන් දැඩිමෙනි කර ගත් වත්මන් වැදි ජන නායක වන්නියලැත්තන් මානව පුස්තකයක්. වනපෙත ඇසුරේ ගොඩනැගුණු දැනුම, ආකල්ප හා ස්වයං විමර්ශන ඥානය එක මිටකට කැටි කළ විට අස්පර්ශනීය සංස්කෘතික උරුමයක් ලෙස හඳුන්වන්නට පුළුවන්.

මුඛ පරම්පරාගත ජනශ්‍රැතියක් වන, වැදි ජනයාගේ සියලු ජීවන උරුම අලිඛිත වනවා. ඒ, ලිඛිත භාෂාවක් නොවීම හේතුවෙන්. අනෙක් අතට ශීඝ්‍ර නාගරිකරණය හා නව තාක්ෂණික සමාජ ව්‍යාප්තිය අලිඛිත වැදි ජන සම්ප්‍රදානය ගොදුරු කර ගනිමින් සිටිනවා. එම භාෂාත්මක හා වැදි ජන සංස්කෘතිය මතු පරපුරට සුරක්ෂා කිරීම පිණිස අනෙකුත් රටවලත් අප රටෙහිත් ලේඛනගත කිරීමේ කාලීන අවශ්‍යතාව දැඩි ව පැන නැගී තිබෙනවා. එය අස්පර්ශනීය සංස්කෘතික උරුම සුරක්ෂාව යටතේ තහවුරු කළ යුතු යැයි යුනෙස්කෝව හඬගා කියන්නක්.

ලංකාවේ වැදි ජනයා පිළිබඳ 1908දී ලෝකවාසී අවධානය ඇති වූයේ සෙලිග්මාන් යුවළගේ The Veddas කෘතියෙන්. එම ආචාර්ය උපාධි නිබන්ධන කෘතියෙන් ලංකාවේ වැදි ජනයා, ඔවුන්ගේ සංස්කෘතිය හා සියලු ජීවන චර්යා පිළිබඳ ගැඹුරු මානව විද්‍යාත්මක විමර්ශනයක් සිදුවුණා. එහෙත් වැදි ජන නායකත්වය සතු නායකත්ව ගුණාංග, පරිසර දැනුම, අත්දැකීම් හා සාම්ප්‍රදායික දැනුම පවරාදීම සම්බන්ධ ව ගැඹුරු අධ්‍යයනයක් නොවීමේ මෙතෙක් පැවති අඩුව සම්පූර්ණ කළේ සම්මානනීය ලේඛක ගුණසේකර ගුණසෝම. ඔහු විසින් ලියන ලද 'වන්නියලැත්තෝ' චරිතාපදානයෙන් එය සිදු වීම තනිපුද්ගල හපන්කමකට වඩා ජාතික අවශ්‍යතාවක් ඉටුකිරීමක්.

කොටස් පොජ්ජ 16කින් මේ චරිතාපදානය සකස් වී තිබෙනවා. මෙතෙක් අප රටෙහි කිසිදු වැදි ජන නායකයකුගේ චරිතාපදානයක් සටහන් නොවීමේ ඌනතාව මේ කෘතියෙන් සපුරා තිබීම පැසසුම්

කටයුත්තක්. වැදි ජනයාගේ පැවැත්ම තීන්දු වන්නේ නායක භූමිකාව අනුව. 'වන්නියලැත්තෝ' චරිතාපදානයේ සන්දර්භගත මානවීය දෘෂ්ටියයි එය. ඕනෑ ම චරිතාපදානයකදී එම චරිතය උත්කර්ෂයට නැංවීම නිතැතින් ම සිදුවන්නක්. ස්වයං ලිඛිත චරිතාපදාන මෙන් ම ස්වයං ලිඛිත නොවන චරිතාපදානවලදී ද මෙය පොදු ස්වභාවයක්. එහෙත් 'වන්නියලැත්තෝ' කියවන විට හුදෙක් පෞද්ගලික උත්කර්ෂයෙන් නොව නායකයකු ලෙස තම රැහේ රැකවරණය පිණිස ගන්නා තීන්දු හා නායකත්ව භූමිකාවක පාරිසරික වගකීම හඳුනා ගන්නට පුළුවන්.

ආදිවාසී ජනයා ඈත යුගයේ සිට වනපෙත, වන රැකුල්, දඩයම, සොබාදහමේ ගති සිරිත් ඔස්සේ ගොඩනගාගෙන තිබෙන පාරිසරික සම්මුති හා සම්ප්‍රදාන සියල්ල තැත්වරද සම්ප්‍රදාය යටතේ කුඩා කාලයේ සිට ප්‍රායෝගික ව පුහුණු කළ යුතු අත්දැකීමක් බව කෘතිය කියවන සෑම පාඨකයකුට ම අවබෝධ වන්නක්. කතුවර ගුණසෝම මේ කෘතිය වරෙක කතාන්දර කලාව ඔස්සේ විදාරණය කරන අතර තවත් විටෙක සොබාදහම විඳු ඇසින් දැක කරන පාරිසරික විග්‍රහයකට පෙරළෙනවා. මේ නිසා 'වන්නියලැත්තෝ' කෘතිය සම්පාදනය වී තිබෙන්නේ ප්‍රබන්ධ කතා රීතියත් ශාස්ත්‍රීය ලේඛන මැදි වහරත් සම සම ව ඒකාබද්ධ ව. ලේඛකයකු ලෙස දිගු කලක් ලද හසල කුසලතා අභ්‍යාසවල අග්‍ර ඵලයක් ලෙසත් 'වන්නියලැත්තෝ' විශේෂිත වනවා.

වැදි ජනයා පිළිබඳ පොත් රැසක් විවිධ මාදිලි ඔස්සේ ලියැවී ඇතත් මේ මානව වංශ ලේඛනය ප්‍රබන්ධිත ව ඇත්තේ වරෙක සහභාගිත්ව නිරීක්ෂණය ද සම්මුඛ සාකච්ඡා ආශ්‍රිත ව සියලු වැදි ජන උරුම පෙරා ගැනීමේ ජනශ්‍රැති ගවේෂණය ද ඔස්සේ. අනෙක් අතට වැදි ජනයාට ලිඛිත භාෂා මූලාශ්‍රයක් නැති හෙයින් වැදි ජන නායක කතා වස්තුව පළමුවරට සිංහල භාෂාවෙහි ලේඛනගත කර තිබීම මේ කෘතියේ ප්‍රබල ම අනර්ඝතාවක්. ඒ සමග ම වැදි ජන වහර සිංහල භාෂාවෙන් ලියා එය ද සුරක්ෂා කර තිබුණත් සිංහල පාඨක සමාජයට වැදි වහර දුරවබෝධ හෙයින් සෑම අවස්ථාවකදී ම අදාළ වැදි වහර යෙදෙන අර්ථය කුමක්දැයි පිටුව යට පාදක සටහන් මගින් තහවුරු කර තිබීම මෙහි සුවිශේෂත්වයක්. වැදි ජන වහර සීමා සහිත අර්ථ නිෂ්පාදිත වාච්‍ය ව්‍යවහාරයක්. එහෙත් සිංහල බසින් මේ පසුබිම විග්‍රහ කරන විට වාග්



ගුණසේකර ගුණසෝම

වැදි ජනයා පිළිබඳ පොත් රැසක් විවිධ මාදිලි ඔස්සේ ලියැවී ඇතත් මේ මානව වංශ ලේඛනය ප්‍රබන්ධිත ව ඇත්තේ වරෙක සහභාගිත්ව නිරීක්ෂණය ද සම්මුඛ සාකච්ඡා ආශ්‍රිත ව සියලු වැදි ජන උරුම පෙරා ගැනීමේ ජනශ්‍රැති ගවේෂණය ද ඔස්සේ. අනෙක් අතට වැදි ජනයාට ලිඛිත භාෂා මූලාශ්‍රයක් නැති හෙයින් වැදි ජන නායක කතා වස්තුව පළමුවරට සිංහල භාෂාවෙහි ලේඛනගත කර තිබීම මේ කෘතියේ ප්‍රබල ම අනර්ඝතාවක්.

විද්‍යාත්මක ව සටහන් කර තැබීමට ලේඛකයා දක්වන ශාස්ත්‍රීය ශික්ෂණය නිසා පාඨකයාට රසවත් අර්ථපූර්ණ චරිතාපදානයක් කියවා වැදි ජන සංස්කෘතිය වටහා ගැනීමට හැකි වනවා.

'වන්නියලැත්තෝ' විශ්ව කෝෂයක් බඳු කෘතියක්. ශබ්ද කෝෂවලින් මූල සංස්කෘතිය හෙළිදරව් කළත් විශ්ව කෝෂයකදී කෝෂ අර්ථයට වඩා පුළුල් ලෙස සංස්කෘතික පරිසරය හෙළි කළ යුතුයි. කොටස් පොජ්ජ 16 පුරා ම එම කාර්යය සිදු කර තිබෙනවා. එහෙයින් යම් දිනෙක වාග් විද්‍යාත්මක ව වැදි ජන වහර විමසන ඕනෑ ම පර්යේෂකයකුට ගැටලුවකින් තොර නිවැරදි වැදි ජන වහර, ඒවායේ අරුත් විමසුම් මෙන් ම වැදි ජන සංස්කෘතික සම්ප්‍රදානය නිරවුල් ලෙස හඳුනා ගන්නට පුළුවන්. වන්නියලැත්තන් නිර්ලෝභී ලෙස තම පරපුරේ උරුමය, වැදි වහර, ජන සම්මත අත්දැකීම්, පාරම්පරික දැනුම් සම්ප්‍රදාය යන සියල්ල තම චරිතයෙන් පෙන්වා දී තිබීමයි එයට හේතුව. වැදි වහර වැදි සංස්කෘතියෙන් පවා ශීඝ්‍රයෙන් ගිලිහී යන යුගයක අතීත වැදි වහර එලෙසින් ම අර්ථ සහිත ව මේ කෘතියෙන් දායක කර තිබීමත් අගය කළ යුත්තක්.

කෘතියෙහි ඇති කාලීන වටිනාකම නම් වැදි වහර, වැදි ජන සංස්කෘතිය, වැදි ජන උරුමය, ඊට අනුබද්ධිත වත්පිළිවෙත්, සම්මුති, සම්ප්‍රද, තහංචි, කිලි, ඇදහිලි, විශ්වාස යන අස්පර්ශනීය සෑම අංගයක් ම මේ චරිතාපදානයට අඩුවකින් තොර ව එකතු කරගෙන තිබීම. උපතේ සිට මරණය දක්වා වැදි ජන දිවිය, දඩයම, මී කැඩීම, අලහැරීම, ගොවිතැන, වැදි ජන අවි ආයුධ භාවිතය, දුනු ඊතල පමණක් නොව ඉර-හඳ, අව්-වැසි, කාලගුණයේ චන්ද්‍ර මාස සම්ප්‍රදාය ආදී සියලු ජීවන චර්යා 'වන්නියලැත්තෝ' කෘතියට අන්තර්ගත කර තිබෙනවා. එහෙයින් මෙය ජනශ්‍රැති, මානව විද්‍යා, වන විද්‍යා, කෘෂිකර්ම, ජීව විද්‍යා, ශාක විද්‍යා, සත්ත්ව විද්‍යා හා සොබා දහමේ සියලු විෂය එක මිටට කැටි වූ කෘතියක්. මේ කෘතිය පරිසරයට ආදරය කරන උතුම් මානව චර්යා පාඨකයාට කියාදෙන තක්සලාවක්. එක් චරිතයක ලිවිසැරිය ඔස්සේ විෂය රාශියක දැනුම් මංපෙත එකට හමුවන ආදිවාසී විශ්ව කෝෂයක්.

# කාන්තා ක්‍රිකට් කිරුළ

වර්නන් ගුණසේකර

2024 විස්සයි20 (T20) කාන්තා ලෝක කුසලාන තරගාවලියේ ඩුබායිහි පැවති අවසාන මහා තරගයේ ප්‍රතිඵලය කුමක් වුවත් එම කුසලානයේ අලුත් නමක් සනිටුහන් වීමට නියමිත ව තිබුණේ නවසීලන්තය හා දකුණු අප්‍රිකාව ඉතිහාසයේ ප්‍රථම වතාවට අවසන් තරගයට පිවිස සිටි හෙයින්.

මීට පෙර පැවති තරගාවලි 6/8ක් ම ජයග්‍රහණය කරමින් ඕස්ට්‍රේලියාව මේ තරග බිමේ ඔවුන්ගේ ආධිපත්‍යය පවත්වාගෙන තිබූ බැවින් වෙනත් කණ්ඩායමකට කුසලානය දිනා ගැනීමේ අවස්ථාව අවහිර වී තිබුණා. කැන්ගරු දේශය අභිභවා යාමට සමත් ව සිටියේ 2009 වසරේදී එංගලන්තය හා 2016 වසරේදී බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායම.

මෙවර 09 වැනි විස්සයි20 කාන්තා ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය පැවැත්වීමට නියමිත ව තිබුණේ බංග්ලාදේශයේ. එහෙත් එරට පවතින නොසන්සුන්තාව හේතුවෙන් මේ තරගාවලිය කෙටි දැන්වීමකින් පසුව එක්සත් අරාබි එමීර් රාජ්‍යය වෙත ගෙන යාමට සංවිධායකයන්ට සිදු වුණා.

තරගාවලියට සහභාගි වූ සෙසු කණ්ඩායම් මෙන් නොව නවසීලන්තය හා කොදෙව් කණ්ඩායම බොහෝ තරගවලදී ඔවුන්ට ලැබුණු උඩ පන්දු නිවැරදි ව රැකගෙන තිබුණා. එක් අවස්ථාවකදී පමණක් නවසීලන්තය අවසන් පූර්ව තරගයේ කොදෙව් පිලට එරෙහි සටන ජය ගැනීමට පෙර මහත් අපහසුතාවට පත්වෙමින් ඩිඇන්ඩ්‍රා ඩෝටන් (Deandra Dottin) පිතිකාරිනියගෙන් ලැබුණු උඩ පන්දු දෙවතාවක් ම රැක ගැනීමට අසමත් වුණා. එවැනි වැරැද්දකින් පසුව ඉදිරියට යාමට බොහෝ කණ්ඩායම්වලට හැකි වන්නේ නැහැ.

මන්දගාමී සාජා තණතීරුවේ පවා නවසීලන්තය එම තරගයේදී කඩුලු 09කට ලබා ගත් 128ක ලකුණු සංඛ්‍යාව ලකුණු 10-15කින් අඩු බවක් හැඟුණත් ශක්තිමත් පිතිකාරිනියන්ට එරෙහි ව එම මුළු ලකුණු සංඛ්‍යාව ආරක්ෂා කර ගැනීමට නවසීලන්ත ක්‍රීඩකයන් සමත් වුණා.

මෙවර තරගාවලියේ වැඩි ම කඩුලුලාභිනිය වන ඇමීලියා කා (Amelia Kerr) සහ




ජයග්‍රාහී නවසීලන්ත කාන්තා ක්‍රිකට් කණ්ඩායම

ඊඩ්න් කාසන් (Eden Carson) අතිදක්ෂ පන්දු යැවීමක නිරත වීම හේතුවෙන් නවසීලන්ත නායිකා සොෆී ඩිවයින් (Sophie Devine)ට අවසාන මහා තරගය දෙස සර්ව සුබවාදී ව බැලීමට අවස්ථාව ලැබී තිබුණා. 2010 වසරේ අවසාන තරගය ලකුණු තුනකින් පරාජය වූ නවසීලන්ත කණ්ඩායමේ ද ඇමීලියා සාමාජිකාවක ව සිටියා.

දකුණු අප්‍රිකාව ද පසුගිය වසරේ තරගාවලියේ ශූරතාව දිනා ගැනීමේ ආසන්නයට ම පැමිණෙමින් අවසාන තරගයේදී ඕස්ට්‍රේලියාවට පරාජය වී තිබුණේ ලකුණු 19කින්. පසුගිය මාස 12 ඇතුළත ප්‍රබල දියුණුවක් ලබාගෙන සිටි දකුණු අප්‍රිකානුවන් මෙවර අවසාන තරගයට සුදුසුකම් ලබා ගත්තේ අවසන් පූර්ව තරගයේදී ඕස්ට්‍රේලියාව කඩුලු 08කින් පරාජය කරමින්.

2024 විස්සයි20 කාන්තා ලෝක කුසලාන තරගාවලියේදී නවසීලන්තය ඔවුන්ගේ මංගල ශූරතාව කරා ගෙන ගියේ තුන් ඉරියව්වෙන් ම අතිවිශිෂ්ට රංගනයක යෙදුණු ඇමීලියා කා. ඔක්තෝබර් 20 දින පැවති අවසාන තරගයේදී ඔවුන් ලකුණු 32කින් දකුණු අප්‍රිකාව පරාජය කළා. එම තරගයේ වීරවරිය වූ ඇමීලියා තම කණ්ඩායම වෙනුවෙන් වැඩි ම ලකුණු ලබා ගත් ක්‍රීඩිකාව බවට පත්වෙමින් ලකුණු 43ක් රැස් කළ අතර නවසීලන්තය ඔවුන්ගේ ඕවර 20 තුළ කඩුලු 05ක් දැවී ලකුණු 158ක් වාර්තා කළා. පන්දු යැවීමෙන් ද දක්ෂතා ප්‍රදර්ශනය කළ ඇය ලකුණු 24කට කඩුලු 03ක් ද ලබා ගැනීමට සමත් වුණා. දකුණු අප්‍රිකානු ඉනිම සීමා වුණේ කඩුලු 09කට ලකුණු 126ක් වශයෙන්.

එය සොෆී ඩිවයින්ගේ ක්‍රීඩා දිවියට ලැබුණු රසවත් අවසානයක්. අවසාන තරගයේ වීරවරිය මෙන් ම සමස්ත තරගාවලියේ ද දක්ෂතම ක්‍රීඩිකාව ලෙස නම් කෙරුණු 24 වැනි වියේ පසුවන ඇමීලියා ඔවුන්ගේ පරම්පරාව හා නවසීලන්තය තවත් ඉදිරියට ගෙන යනු ඇතැයි ඔවුන් අපේක්ෂා කරන අලුත් තරුණ ක්‍රීඩිකාවන් අතර තිබෙන අවසන් පාලම ද වනවා.

ඇමීලියා පාසලේ සිටියදී ඇය සොෆී ඩිවයින් හා තවත් සුපිරි තාරකාවියක



සොෆී ඩිවයින්



ඇමීලියා කා

වන සුසී බේට්ස් (Suzie Bates) සමග ලෝක කුසලානයක් දිනා ගැනීම පිළිබඳ කතාන්දර ලිව්වා. ඊළඟ පරම්පරාව පෙළඹවීම පිණිස ක්‍රීඩා තරු යෙදිය යුතු ශක්තිය පිළිබඳ සාක්ෂියක් තිබුණානම් ඒ, T20 ලෝක කුසලානය දිනා ගත් මේ නවසීලන්ත කණ්ඩායම. ඔක්තෝබර් 20 දින රාත්‍රියේ ඩුබායිහිදී බේට්ස් හා ඩිවයින් නවසීලන්තයේ මංගල විස්සයි20 ලෝක කුසලාන ශූරතාව සැමරුවේ පිළිවෙළින් වයස අවුරුදු 37 හා 35දී. ඔවුන් සමග ඇමීලියා ද සිටියා.


"මාව 'වයිට් ෆර්න්' කෙනකු වීමට පෙළඹවූයේ සොෆී ද ඇතුළත් ව සිටි කණ්ඩායම 2010 ලෝක කුසලානයට තරග කරන අයුරු නැරඹීමෙන්. ඒ මොහොතේ සිට මා මගේ පියා සමග නෙට් පුහුණුවේ යෙදුණේ සොෆී හා සුසී සමග මා පිතිකරණයේ යෙදෙන බවට සිතේ මවා ගනිමින්" යනුවෙන් ඇමීලියා තරගයෙන් පසු ව කියා තිබුණා.

'වයිට් ෆර්න්ස්' (White Ferns) නමින් හැඳින්වෙන නවසීලන්ත ජාතික කාන්තා ක්‍රිකට් කණ්ඩායම කරා මේ ජයග්‍රහණය පැමිණියේ 2010 තරගාවලියේ අවසාන තරගයේදී ඔවුන් ලකුණු තුනකින් ඕස්ට්‍රේලියාවට පරාජය වී වසර 14කින් පසුව. 2009 ශූරතා තරගයේදී ද නවසීලන්ත කණ්ඩායම එංගලන්තයට පරාජය වුණා. දකුණු අප්‍රිකාවට මේ පරාජය ද්විත්ව කලකිරීමක් බවට පත්වූයේ ඔවුන් පසුගිය වසරේ අවසාන තරගය ද ඕස්ට්‍රේලියාවට පරාජය වූ බැවින්.

ඉතිහාසය අලුතින් ලියමින් 2024 විස්සයි-20 ලෝක ක්‍රිකට් ශූරියන් බවට පත්වූ නවසීලන්තයට ඇමරිකානු ඩොලර් මිලියන 2.34ක අතිවිශාල ත්‍යාග මුදලක් හිමිවූයේ ජගත් ක්‍රිකට් කවුන්සලය (ICC) මේ තරගාවලියේ ජයග්‍රාහී ත්‍යාග මුදල 134%කින් වැඩි කරන බවට නිවේදනය කර තිබූ බැවින්. මෙවර තරගාවලියේ අනුශූරියන් වූ දකුණු අප්‍රිකානු කණ්ඩායමට පිරිනැමුණේ ඇමරිකානු ඩොලර් මිලියන 1.17ක ත්‍යාග මුදලක්. අවසන් පූර්ව වටයට පිවිසි ඕස්ට්‍රේලියාව හා බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායම්වලට ද ඩොලර් 675,000ක් බැගින් ලැබුණා.

නව නීතියට අනුව, තරගාවලියේ මූලික වටයේ හොඳම කණ්ඩායම් තුන ද ත්‍යාග සංචිතයට ඇතුළත් කර තිබුණා. වසර 2009 සිට 2023 දක්වා පැවති කාන්තා ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිහිදී ඕස්ට්‍රේලියාව ශූරතා හයක් 2010, 2012, 2014, 2018, 2020 හා 2023 යන වසරවලදී දිනා ගත් අතර 2009 වසරේ පැවති මංගල තරගාවලියේ ජයග්‍රාහිකාවන් වූයේ එංගලන්ත කණ්ඩායම. බටහිර ඉන්දීය කොදෙව් පිල 2016 වසරේදී ශූරියන් වීමට සමත් වුණා.

මීට සති කිහිපයකට පෙර ආසියානු කාන්තා ක්‍රිකට් කුසලානය දිනා ගත් ශ්‍රී ලංකා කණ්ඩායමට එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සිට පෙරළා දිවයිනට හිස් අතින් පැමිණීමට සිදුවූයේ ඔවුන් 2024 විස්සයි20 කාන්තා ලෝක කුසලාන තරගාවලියේ මූලික වටයේ සියලු තරගවලින් පරාජයට පත්වූ බැවින්.




# දෙසතිය
## පුවත් සඟරාව

## දැන්
## ඔබේ ජංගම
## දුරකතනයට...

**DOWNLOAD**
**THIS APP**

Download on the App Store

GET IT ON Google Play

දෙසතිය පුවත් සඟරාව
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්
www.dgi.gov.lk www.news.lk
පුවත් සඟරාවක් ලෙස ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත

Department of Government Information
news.lk
GFU Sri Lanka

Rs. 100/-